Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

எதிரி அறிவிக்காததால் ஒப்பந்த நிபந்தனையை அவர் மீறிவிட்டாரென்பதையும், டி. சி. இசற். எல். 928 வழக்கில் விதிக்கப்பட்ட சிறைத்தண்டனையை அனுபவிப்பதையும் எம். சி. கொழும்பு தெற்கு 78562 A, எம். சி. கொழும்பு தெற்கு 78483 A, எம். சி. கொழும்பு 62467 B ஆகியவற்றில் வெளியிடப்பட்ட பற்ருணை சம்பந்தமாகவும் கைது செய்யப்படுவதையும் தவிர்த்து, உண்மையாகவே ஒளிந்திருக்கிருரென்பதையும் அவர் அறிவாரா? (ஆ) இதுபற்றி விசாரணை செய்து உரிய நடவடிக்கை எடுப்பாரா?

asked the Parliamentary Secretary to the Minister of Justice: (*a*) Is he aware that (i) the accused in M. C. Colombo Case 55357/A, who was sentenced to 1 year's R.I., had his sentence commuted to 2 months' R.I. and was released from jail on his entering into a bond on certain conditions; (ii) he has violated the conditions of his bond in that he has not reported his whereabouts to the D. I. G., C. I. D., and had actually been absconding and avoiding arrest when he was wanted to serve his term of imprisonment in D. C. Z. L. 928 and also on warrants issued for his arrest in M. C. Colombo South 78562 A, M. C. Colombo South 75483 A and M. C. Colombo 62467B? (*b*) Will he inquire into this and take appropriate action?

**නයිනා මරික්කාර් මයා.**

*(ஜனுப் நயினு மரிக்கார்)*

(Mr. Naina Marikar)

(*a*) (i) No. The Chief Magistrate of Colombo was requested to forward to the Ministry for perusal the record in M.C. Colombo Case No. 55357/A, referred to in the Question. The Chief Magistrate, however, has replied that there is no case in his court bearing such a number, and that the cases in his court bear only the numbers from 1 to 49,999. (ii) Does not arise. (*b*) Does not arise.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 12.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්‍ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்டம் அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலி பரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

I ask for time as it is necessary to collect certain facts.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினுவை மற்ருெரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## නු/පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය

என்/புறமடுல மத்திய மகா வித்தியாலயம்

N/PORAMADULLA MADHYA MAHA VIDYALAYA

14. **වී. අන්නාමලෙයි මයා.** (පත්කරන ලද මන්ත්‍රී—ජෝර්ජ් අබයගුණසේකර මයා.—හඟුරන්කෙත—වෙනුවට)

*(திரு. வி. அண்ணுமலே—நியமன அங்கத்தவர்—திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர—ஹங்குராங்கெத்த—சார்பாக)*

(Mr. V. Annamalay—Appointed Member—on behalf of Mr. George Abeyagoonasekera—Hanguranketa)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය,—(අ) නු/පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය පාසල් ප්‍රතිසංවිධානය යටතේ ශ්‍රේණියෙන් පහළ හෙලන ලද බව එතුමා දන්නේද? (ආ) මෙම පාසලට නවීනතම අංගයන්ගෙන් යුත් විද්‍යාගාරයක් ඇති බව එතුමා දන්නවාද? (ඉ) මෙම පාසලේ විද්‍යාව ඉගැන්වීම නතර කරන ලෙස එතුමා නියෝග කරන ලද්දේද? එසේ නම්, ඒ මන්ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினு: (அ) பாடசாலைகளை மறுசீரமைப்புச் செய்ததன் விளைவாக என்/புறமடுல மத்திய மகா வித்தியாலயத்தின் தரம் குறைக்கப்பட்டுள்ளதென்பதை அவர் அறி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வாரா? (ஆ) இப்பாடசாலை, நவீன முறையில் அமைந்து, சாதனங்களை முழுமையாகக் கொண்ட விஞ்ஞான ஆய்கூடமொன்றை உடையதாக உள்ளதென்பதை அவர் அறிவாரா? (இ) இப்பாடசாலையில் விஞ்ஞானம் போதிப்பதை நிறுத்த வேண்டுமென அவர் கட்டளையிட்டுள்ளாரா? அங்ஙனமாயின், ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (a) Is he aware that N/Poramadulla Madhya Maha Vidyalaya has been down graded as a result of reorganization of schools? (b) Is he aware that this school is provided with a modern and well-equipped science laboratory? (c) Has he made order that the teaching of science in this school be discontinued, and if so, why?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

(අ) විදුහල් නව සංවිධානය නිසා නු/පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයයේ තත්ත්වය පහත වැටී නැත. (ආ) ඔව්. (ඉ) නැත.

අන්නාමලෙයි මයා.
(திரு. அண்ணாமலை)
(Mr. Annamalay)

I understand that for the last 1½ years these science students have not been taught science subjects although there is a well-equipped science laboratory there. Will the teaching of science be resumed?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

As soon as we get sufficient teachers we shall be appointing them.



# කෙටුම්පත් පණත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

## BILLS PRESENTED

### මුදල් නීති (සංශෝධන) පනත් කෙටුම්පත
நிதிச்சட்ட திருத்த மசோதா

MONETARY LAW (AMENDMENT) BILL

"to amend the Monetary Law Act."

පිළිගන්වන ලද්දේ ගරු මුදල් ඇමති යූ. බී. වන්නිනායක විසිනි. 1968 අප්‍රේල් මස 7 වන ඉරිදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයිද නියෝග කරන ලදී.

நிதி அமைச்சர், கௌரவ யூ. பி. வன்னிநாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1968 ஏப்ரில் 8 ஞாயிற்றுக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. U. B. Wanninayake, Minister of Finance; to be read a Second time upon Sunday, 7th April 1968, and to be printed.*

# පරිපූරක මුදල: රජයේ සහ පළාත්පාලන සේවකයන්ට හා විශ්‍රාමිකයන්ට අතුරු දීමනා
குறைநிரப்புத் தொகை: அரசாங்க, உள்ளூராட்சி ஊழியர்களுக்கும் இளைப்பாற்றுச் சம்பளம் பெறுவோருக்கும் இடைக்காலப் படி.

## SUPPLEMENTARY SUPPLY: INTERIM ALLOWANCE TO GOVERNMENT AND LOCAL GOVERNMENT EMPLOYEES AND PENSIONERS

පූ. භා. 10.16

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

I move,

"That a supplementary sum not exceeding rupees sixty-five million (Rs. 65,000,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු වන්නිනායක]

of the financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the schedule hereto :—

*Schedule*

| | Rs. |
|---|---|
| Head 47—Miscellaneous Services | |
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. | 65,000,000 " |

Consequent on the decision to devalue the Ceylon rupee, the Government has decided that the interim allowance payable to the following categories, namely, (*a*) government employees (including daily-paid substitutes and casual labour grade employees, engineering and factory as well as agricultural and field categories) ; (**b**) local government employees ; (*c*) government pensioners ; (*d*) local government pensioners ; and (*e*) widows' & orphans' pensioners, should be increased from 1st December 1967 by a further sum of Rs. 15 per month in respect of categories (*a*) and (*b*) and by a sum of Rs. 10 per month in respect of categories (*c*), (*d*) and (*e*). The increased allowance is paid to those persons whose basic emoluments are under Rs. 300 per month, marginal relief being granted in the form of a tapering allowance so that a person drawing a higher basic salary will not receive less in salary and interim allowance than a person on a lower basic salary.

Supplementary provision in a sum of Rs. 65,000,000 is required to meet the anticipated expenditure under this sub-head during the current financial year.

As a result of hardship caused to some government employees consequent on the devaluation, the Government decided to pay this extra allowance as from 1st December 1967. It is now being paid. We want the approval of the House for this supplementary sum in order to reduce the hardship caused to government employees—government employees in the lower categories.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)

*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

How did you fix this ? What was the basis of your calculation ?

**ගරු වන්නිනායක**

***(கௌரவ வன்னிநாயக்க)***

(The Hon. Wanninayake)

We thought it was a reasonable amount.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

The Hon. Minister must give us a reasonable case to argue.

**ගරු වන්නිනායක**

***(கௌரவ வன்னிநாயக்க)***

(The Hon. Wanninayake)

The Government thought this was a reasonable amount within the resources available to it. If we had more we would have given more.

පූ. භා. 10.18

**ප්‍රින්ස් ගුණසේකර මයා.**

***(திரு. பிறின்ஸ் குணசேக்கர)***

**(Mr. Prins Gunasekera)**

ගරු කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා මේ යෝජනාවෙන් රුපියල් 6,50,00,000 ක් ඉල්ලුවාට රුපියල් දහය පහළොව බැගින් දෙන්නට තීරණය කළේ කෙසේ ද යන්න මේ ගරු සභාවට කියා සිටියේ නැහැ.

ගරු කථානායකතුමනි, **ඔබතුමාට මතක** ඇති, රුපියලේ අගය අඩු කිරීම පිළිබඳව විවාදය පැවති අවස්ථාවේදී රජය වෙනුවෙන් කථා කළ ගරු මුදල් ඇමතිතුමාත් ගරු අගමැතිතුමාත් එසේ රුපියලේ අගය අඩු කිරීමෙන් යහපතක් වෙනවාය කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල

ප්‍රකාශ කළ බව. රුපියලේ අගය අඩු නො කළොත් අප ලොකු අමාරුවක වැටෙන්නට පුළුවන්ය කියාත් එතුමන්ලා කියා සිටියා. රුපියලේ අගය අඩු කිරීමෙන් ආණ්ඩුවට අත් වී තිබෙන යහපත දැන් පෙනෙනවා නේ ද? රුපියලේ අගය අඩු කළේ සියයට 20 කින්. නමුත් රුපියල් දහය ගණනෙ ගෙවන්නටත් මුල් අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කර තිබුණු මුදල සියයට කීයකින් වැඩි කරන්නට තමුන්නාන්සේලාට සිදු වුණා ද? මේ කාරණය දෙස බලන විට තමුන්නාන්සේලාට පැහැදිලි වෙනවා ඇති, රුපියලේ අගය සියයට 20 කින් අඩු කළාය කිව්වාට, ඇත්ත වශයෙන්ම රුපියලේ අගය සියයට සියයකටත් වැඩි ප්‍රමාණයකින් බැස තිබෙන බව. සති ගණනක් තිස්සේ සාකච්ඡා කර සම්මත කරන ලද පසුගිය අය වැය ඇස්තමේන්තුවෙන් වෙන් කර තිබෙන්නේ රුපියල් 6,23,47,205 යි. මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ විස්තර ලේඛනයේ ගණන් නැවතත් වැරදියි. එතුමාගේ ගණන් හැමදාම වැරදියි. කොපමණ ලොකු ගණන්කාරයින් වුණත් මේ මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කරන ගණන් වැරදියි. දැන් මේ මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙන ඇස්තමේන්තුවේ "ශීර්ෂය: 47—විවිධ සේවා—සම්මතයේ අංකය: 2—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම් රුපියල් 6,50,00,000" යනුවෙන් සඳහන් වෙනවා. නමුත් අප ප්‍රථමයෙන් අනුමත කළ ඇස්තමේන්තුවේ—

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)
*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னாவ)*
(Mr. T. B. Ilangaratne—Kolonnawa)

ගරු කථානායකතුමනි, ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති බව පෙනී ගියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

*சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

පසුගිය අයවැය ඇස්තමේන්තුවෙන් අප අනුමත කළ ගණන කුමක් ද? 1967-68 අයවැය ඇස්තමේන්තුවේ 55 වන පිටුවේ එය තිබෙනවා: "47 වැනි ශීර්ෂය—2 වැනි සම්මතය—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම් රුපියල් 6,23,47,205" යි. සුළු වරදක් වෙන්නට පුළුවනි. නමුත් මේ ගණන්වල අසමානත්ව යයි මා පෙන්නුම් කරන්නෙ. 6,50,00,000 ක ඇස්තමේන්තුවක්—සියයට 20 කින් රුපියලේ අගය අඩු කළ නිසා—ඒ අනුව සියයට 20ක් ගණන් බැලුවොත්—පාඨශාලාවලට යන සත් වන පන්තියේ ළමයකු වුවත් කියාවි එය රුපියල් 12 කෝටිය දක්වා වැඩි වෙන්නට වුවමනා නැත කියා. තමුන්නාන්සේ ඉදිරිපත් කර තිබෙන සංශෝධිත ඇස්තමේන්තු අනුව මුල් රුපියල් හය කෝටිය රුපියල් දොළොස් කෝටි පනස් ලක්ෂය දක්වා වැඩි වී තිබෙනව. රටට කියා සිටියේ රුපියලේ අගය අඩු වුණේ සියයට 20කින් පමණක් බවයි. සියයට 20කින් අගය අඩු වීම නිසා රුපියල් හය කෝටිය ඒ ප්‍රමාණයට වැඩි කළ විට ඒ මුදල රුපියල් දොළොස් කෝටි පනස් ලක්ෂයක් වෙන්නෙ නැහැ. දැන් මෙතැන රුපියල් දොළොස් කෝටි පනස් ලක්ෂයක් වෙන් කරන්න යනව. මේ අනුව රුපියලේ අගය සියයට සියයකටත් වඩා අඩු වී තිබෙන බව තමුන්නාන්සේට පිළිගන්ට සිදු වෙනවා නේ ද? රුපියලේ අගය අඩු කිරීමෙන් පසු හැදුව හැම ගණනක්ම මේ විධියයි.

මට මතකයි, එදා අගමැතිතුමා බොහොම ආඩම්බරයෙන් "රුපියලේ අගය අඩු කළ නිසා වී බුසලකට රජය ගෙවන සහතික මිල රුපියල් 12 සිට 14 දක්වා අපි වැඩි කළා" යයි ප්‍රකාශ කළ බව. රුපියලේ අගය සියයට 20 කින් අඩු වුණු නිසා රුපියල් 12 කලින් පැවති තත්ත්වයට නං... එය රුපියල් කීයකින් වැඩි කළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

යුතුද කියා, ගරු අගමැතිතුමා ගණන් දන්නෙ නැත්නම් ගරු මුදල් ඇමතිතුමාගෙන් මම අහනව.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

සියයට 20ක් වැඩි වුණේ ආනයන භාණ්ඩවලටයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒ නිසා නේද මේ වැඩි මුදල දෙන්ට පටන් ගත්තෙ? "රුපියලේ අගය සියයට 20කින් අඩු වුණු නිසා ඒකට කැපෙන්න මෙන්න අපි ගොවීන්ගෙ වී බුසලට රජය ගෙවන සහතික මිළ රුපියල් 2කින් වැඩි කළා" යයි කිව්ව. ගැලරියේ ඉස්කෝලෙ ළමයි ඉන්නව. ඒ ළමයින් වුණත් ගණන් හදල කියයි, "රුපියල් 12න් සියයට 20 රුපියල් 2 නොවෙයි; රුපියල් 2.40 යි." කියා. ඉතින් රුපියල් 14.40 කළ යුතු එක තමුන්නාන්සේලා වැඩි කළේ රුපියල් 14 දක්වායි. එයින් පෙනෙනව නේද, රුපියලේ අගය සියයට 20කින් අඩු කිරීමෙන් ඇත්ත වශයෙන් ම තමුන්නාන්සේලා කළේ ගොවීන්ට ගෙවන වී බුසලේ මිළ සත 40කින් කපා හැරීම බව?

අගමැතිතුමා මීට ඉස්සරවෙලත් අපේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) සමග අර්ථ ශාස්ත්‍රය පිළිබඳ විවාදයකට ඇඳුනා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට තරම්වත් අර්ථ ශාස්ත්‍රය පිළිබඳ උපාධියක් මට නැහැ. මමත් එතුමාගෙන් අර්ථ ශාස්ත්‍රය ඉගෙන ගත් ශිෂ්‍යයෙක්. ඒ නිසා අර්ථ ශාස්ත්‍රය පිළිබඳ විවාදයකට එකතු වන්ට අපට වුවමනා නැහැ. මම පිළිතුරු දෙන්නෙ තමුන්නාන්සේගේ තර්කයෙන්මයි. "සියයට 20 ක් අඩු කළ නිසා අපි මෙන්න ගොවීන්ගේ වී බුසලට ගෙවන රුපියල් 12, රුපියල් 14 දක්වා වැඩි කළා" යයි අගමැතිතුමා කිව්ව. එතුමා හදාපු හැම ගණනක්ම මේ විධියයි.

මේ වැඩිපුර ලැබෙන රුපියල් හය කෝටි පනස් ලක්ෂය බෙදන්නට යන්නෙ කාටද? අද මාසික වැටුප් ලබන සේවක යන් අතුරින් කීයෙන් කී දෙනාටද මේ මුදලින් යහපතක් වෙන්නෙ? අර්ථ ශාස්ත්‍රය ඉගෙන ගන්න ශිෂ්‍යයන් පවා දන්නව, මුදලේ වටිනාකම අඩු වුණාම පළමුවෙන්ම පහර වදින්නෙ, අමාරුකම් වලට මුහුණ පාන්ට සිද්ධ වන්නෙ මාස් පඩි ලබන සේවකයන්ට බව. සමාජයේ, වෙළඳ පොළේ යම්කිසි ආර්ථික වෙනස් කමක් ඇති වුණාම, එයින් පළමුවෙන්ම අමාරුකම් බුක්ති විඳින්ට සිද්ධ වෙන්නෙ මාස් පඩි ලබන සේවකයන්ටයි. මාස් පඩි ලබන සේවකයන් ඉන්නෙ ආණ්ඩුවේ හා පළාත් පාලන සේවයේ පමණක් නොවෙයි. ආණ්ඩුවේ මේ නොපනත්කම් නිසා අමාරුවට පත් වී සිටින රජයේ හා පළාත් පාලන සේවකයන්ට කීයකින් හෝ උදව් කරන්ට සූදානම් වීම ගැන අපි සන්තෝෂයි. එහෙත් තමුන්නාන්සේලා මෙතරම් ආවඩන, තමුන්නාන්සේලා ඉතා කිට්ටු සම්බන්ධකම් පවත්වන පෞද්ගලික අංශයේ සේවකයින්ට මේ විධියේ යහපතක් කිරීමට ගත් පියවර මොකක් ද?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ඇයි නැත්තෙ? වැඩි වුණා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

කීයෙන් කී දෙනකුටද? රජයේ හා පළාත් පාලන සේවයේ මාස් පඩි ලබන පිරිස මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට කීයද? රජයේ සේවකයන් හැටියට සලකන්නේ නැති, එහෙත් රජයේ අංශයට අයත් ජනසතු ආයතනවල වැඩ කරන සේවකයන් දහස් ගණනක් ඉන්නවා. ඔවුන් සඳහා ඇති කරන යහපත කුමක් ද? ගරු මුදල් ඇමතිතුමා දන්නවා ඇති දැන් සති කිහිපයක් තිස්සේ වෛද්‍ය අංශයේ පවත්නා වැඩ වර්ජන ගැන. මහ රෝහලේත් තවත් පළාත් බද ප්‍රධාන රෝහල් කිහිපයකත් එක්තරා සේවක පිරිසක් විසින් වැඩ වර්ජනයක් ආරම්භ කර තිබෙනවා. ඔවුන්ගේ ඒ වැඩ වර්ජනයට හේතු වූ එක්තරා ප්‍රධාන කරුණක් තමයි පඩි පිළිබඳ ප්‍රශ්නය. මීට අවුරුද්ද කට පමණ ප්‍රථම ඔවුන් විසින් වැඩ වර්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනයක් පවත්වා මේ කරුණ මුදල් ඇමති තුමාටත්, සෞඛ්‍ය ඇමතිතුමාටත් දන්වා සිටියා. ඒ අවස්ථාවේදී ප්‍රතිඥවක් දී තිබෙනවා මාස 6 ක් ඇතුළත දී එම ප්‍රශ්නය විසඳනවාය කියා. අද පත්‍රවල තිබෙන හැටියට නම් මුදල් ඇමතිතුමාත් අද ඉන්නා සෞඛ්‍ය ඇමතිතුමාත් අතරේ මත භේදයක් හට ගෙන තිබෙන නිසා මේ ප්‍රශ්නය යට ගොස් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වාර්තා අද පත්‍රවල තිබෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
මත භේදයක් නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මත භේදයක් නැතිලු. එහෙම නම් කරුණාකර කලින් ප්‍රතිඥා දී තිබෙන පරිදි වැඩවර්ජනය කර සිටින සේවකයින්ගේ ප්‍රශ්නය ප්‍රමාද නොකර බේරුම් කර දෙන්න. ඔවුන්ගේ ඉල්ලීම් සාධාරණයි. ඒ වෛද්‍ය අංශයේම ඉන්න වෛද්‍යවරයන් පවා කියන අන්දමට ඔවුන්ගේ පඩි ගෙවන ක්‍රමය සම්පූර්ණයෙන්ම වැරදියි. ඒ නිසා ඔවුන්ගේ ඉල්ලීම් සාධාරණය කියා ඒ අය කියනවා. ඉතාමත් සීමිත සේවයකට බැඳී සිටින ඒ පිරිසට එම සේවයෙන් බැහැරව ගොස් වෙනත් වැඩි පඩි ලබන රක්ෂාවලට ඇතුළත් වීමටත් ක්‍රමයක් නැහැ. එම නිසා ඔවුන්ට සාධාරණ පඩියක් දිය යුතුයි. ඒ වගේම වෙනත් අංශවල වැඩ කරන එම සුදුසුකම්ම තිබෙන රජයේ සේවකයන්ට මෙන් ඔවුන්ටත් සලකන්නටය කියන ඉල්ලීමයි ඔවුන් ඉදිරිපත් කරන්නෙ. එම සාධාරණ ඉල්ලීම්වලට මෙපමණ කලක් ප්‍රමාද වීවත් පිළිතුරක් නොලැබුණු නිසයි ඔවුන් වැඩවර්ජනයක් ආරම්භ කර තිබෙන්නේ. මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, රජයේ සේවකයන් ගේ අමාරුකම් විසඳීමට මේ රුපියල් 6 කෝටි 50 ලක්ෂය වෙන් කරන්නා වාගේම අර දැනට අමාරුවට පත්ව සිටින වෛද්‍ය අංශයේ රජයේ සේවක පිරිසගේ ඒ සාධාරණ ඉල්ලීම ගැන සලකා බලා ඉක්මණට ඔවුන්ගේ අවුල සමථයකට පත් කරන ලෙස.

ගරු කථානායකතුමනි, රටේ සිටින මහ ජනතාවට එක් වරටම බැලූ බැල්මටම නොපෙනුනත් මෙම සේවක පිරිසගේ වැඩ වර්ජනය නිසා රෝහල් කිහිපයකම වැඩ රාශියක් අතපසු වී තිබෙනවා. වරායේ කිහිප දෙනෙක් වැඩ නැවැත්වීමක් කළොත්, බඩු බෑමේ ප්‍රමාදය නිසා සමාජයේ යම්කිසි කලබල ගතියක් ඇති වෙනවා. ඒ වගේම දුම්රිය අංශයේ වැඩ නැවැත්වීමක් සිදු වුණොත් දුම්රිය ධාවනයේ අඩුකම නිසා මහජනයා අතර මොකක් හෝ කලබලයක් ඇති වෙනවා. නමුත් මේ වගේ තැනක මෙවැනි සේවක පිරිසක් වැඩ නැවැත්වූවත් එහි විපාක එක් වරටම අපට පෙනෙන්නේ නැහැ. නමුත් එතන වැඩ කරන අනිකුත් සේවක පිරිස දන්නවා වැඩ වර්ජනයේ යෙදී සිටින සේවක පිරිස ටික දෙනා වුණත් ඔවුන්ගේ එම වැඩවර්ජනයෙන් බලවත් වැඩ කඩාකප්පල් වීමක් සිදු වී තිබෙන බව. ඒ නිසා මේ කාරණය ගැන දැනට වඩා සැලකිලිමත් වී මේ රජයේ සේවකයන් ටික දෙනාගේ ඉල්ලීම් ගැන සානුකම්පිකව සලකා බලා එය අප්‍රමාදව සමථයකට පත් කරන්නය කියා මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

රුපියලේ අගය අඩු කිරීම නිසා, මීට මාස හත අටකට කලින් අප මේ ගරු සභාවේදී අනුමත කළ අයවැය ඇස්තමේන්තුමොන තරමකින් සංශෝධනය කරන්නට වේදැයි කියන එක මේ අතුරු ඇස්තමේන්තුවෙන් අපට පැහැදිලි කර ගත හැකියි. සියයට සියයකටත් වැඩි වෙනසක් දැන් මේ අතුරු ඇස්තමේන්තුවෙන්ම ඇති කරන්නට සිද්ධ වුණා නම් තමුන්නාන්සේ එදා ඉදිරිපත් කර අනුමත කරගත් අයවැය ලේඛනය මේ අවුරුද්ද අවසන් වන විට කොයි හරියේ නවතීවිද කියා අපට හිතන්න පුළුවන්. එදා තිබුණ අයවැය හිඟය මැකීමට තමුන්නාන්සේ යෝජනා ඉදිරිපත් කළ අතර, පියවන්නට බැරි වූ එක්තරා ප්‍රමාණයකුත් තිබුණා. ඒ හිඟය දැන් කොයි තරම් පුළුල් වී තිබෙනවාද කියන එක, පියවන්නට බැරි තරම්, දරන්නට බැරි තරම් ලොකු බරක් වී තිබෙනවාද කියන එක ඇමතිතුමාටම පිළිගන්නට වේවි. තව මාස දෙක තුනක් ඇතුළත, එනම් ජූලි මාසය පමණ වන විට මේ ආණ්ඩුවේ 4 වෙනි අයවැය ලේඛනය ඉදිරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

පත් කරන අවස්ථාවේදී මේ පරතරය තවත් කොයි තරම් පළල් වී, ඒ පරතරය පියවන්නට බැරුව ආණ්ඩුව දඟලන හැටි අපට බලා ගන්න පුළුවන් වේවි.

අපේ රටේ ආර්ථික ක්‍රමය විදේශික රන් පවුමට සහ ඩොලර් කාසියට යට වී තිබීම නිසා ඒ රටවල ඇති වන සුළු වෙනස්වීමකින් අපේ රටේ කොයි තරම් ලොකු කුණාටුවක් ඇති වෙනවාද කියන එක දැන් දැන් අපට අවබෝධ වීගෙන යනවා. එංගලන්තයේ රන් පවුම සියයට 13කින් අඩු කළාම ලංකාවේ රිදී රුපියල සියයට 20කින් අඩු කරන්නට සිදු වුණා. සියයට 20කින් අඩු කළා යයි රටට කී නමුත් ඇත්ත වශයෙන්ම අඩු වී ඇති ප්‍රමාණය කොපමණද කියා පිටකොටුවේ, මරියකඩේ හෝ වෙනත් වෙළඳපොළකට ගිය විට තේරුම් ගන්නට පුළුවනි. ඒ අර්බුදයෙන් ගොඩ ඒම පිණිස ගරු අගමැතිතුමා පිට පට ගසා ගත ගොවිතැන් ව්‍යාපාරයක් පටන් ගත්තා. ඊයේ පෙරේදා දවස් දෙකක් තිස්සේ ඔබතුමා ඉදිරියේ අප කළ විවාදයේදී ඒ ගොවිතැන් ව්‍යාපාරයෙන් රටට වී තිබෙන යහපත මොකක්ද කියා හොඳින්ම පැහැදිලි වුණා. ලොකු ලොකු සල්ලි කාරයන් කීප දෙනකුට—තම තමන්ගේ හිතවතුන්ට නොදුන්නාය කිය කියා—රජයේ ඉඩම් අක්කර සිය දහස් ගණන් බදු දීමෙන් මේ ආර්ථික ප්‍රශ්නය විසඳන්න පුළුවන්ද? විදේශික ආර්ථික ක්‍රමයට දක්වන ගැතිකම නිසා රජයේ ඉඩම් අක්කර දෙතුන් දාහක් ලූනු වවන්නය කියා විදේශික කොම්පැනිකාරයින්ට දීමෙන් අප මුහුණ පා සිටින ඒ අර්බුදවලින් සහ අමාරුකම්වලින් ගොඩ ඒමට පුළුවන්ද?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

That Debate is over. The hon. Member missed it, and now he wants to make up for it.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නැහැ, ඒ විවාදය ගැන නොවෙයි මා කථා කරන්නේ. මේ පැන නැඟී තිබෙන අර්බුදය ගැනයි.

මෙම පැන නැගී ඇති ඒ අර්බුදයට හේතුව රුපියලේ අගය අඩු කිරීමයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

ඇයි ඒ ගැන කථා කළා නොවේද?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

රුපියලේ අගය අඩු කිරීමෙන් පැන නැගි අර්බුදය විසඳීමට නැවත වරක් මුදල් ටිකක් ඉල්ලනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

සේවකයින්ට ගෙවන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඔව්, ඒක නොවෙන්නම්. මා පටන් ගන්නා කොට කීවේ ආණ්ඩුවේ සහ පළාත් පාලන සේවකයින් ටික දෙනකුට දීම පිණිස—

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඇයි දෙනවට විරුද්ධද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මගේ විරුද්ධත්වයක් නැහැ. ඒක හරියට හැදුණු උණ සන්නිපාතයට කොත්තමල්ලි වතුර දීම වාගේ වැඩක්. මේ ප්‍රශ්නයෙන් ගොඩ ඒමට රුපියල් දහයක් සහ ලොවක් දීමෙන් පුළුවන් වෙන්නෙ නැහැ. විදේශීය සමාගම් කිපයකට ඉඩම් අක්කර දෙදහස තුන් දහස බැගින් බෙදා දීමෙන් විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි මෙය. එම පියවර ගැනීමෙන් කිසියම් වෙනසක් සිදු වී තිබෙනවාද? වෙළඳපොලේ ද්‍රව්‍ය මිල පිළිබඳව කිසියම් වෙනස්කමක් ඇති වී තිබෙනවාද? අපේ රටේ ධනය ආරක්ෂා කර ගන්නටයයි කියමින් රුපියලේ අගය පහත බැස්සුවා. නමුත් ඒයින් ධනය ආරක්ෂා වී තිබෙනවාද? විදේශයට ඇදී යන ධනය රැක ගන්නටයි කියමින් කොම්පැනි කාරයින්ට එළුණු, අල වවන්න ඉඩම් බෙදා දුන්නා. බෙදා දුන් මෙම ඉඩම් වල කොතරම් ප්‍රමාණයක මේ ද්‍රව්‍ය ඩිවා තිබෙනවාද? එනිසා එළුණු මිල, මිරිස් මිල කොපමණ ප්‍රමාණයකින් පහත බැස තිබෙනවාද? ගරු කථානායකතුමනි, රුපියලේ අගය අඩු කිරීමට පෙර රුපියල් 1.50 ට හෝ රුපියල් 1.70 ට හෝ මිලදී ගත් මිරිස් රාත්තලක අද මිල රුපියල් 6.00 හෝ 6.50 දක්වා ඉහළ නැග තිබෙනවා නම් වැඩි වී තිබෙන්නෙ සියයට විස්සක ප්‍රමාණයකින්ද කියා කල්පනා කර බලන්න. මේ අනුව සියයට හයසීයක ප්‍රමාණයකින් වැඩි වී ඇති බව පෙනී යනවා. දවස් ගණනක් තතන තතන ඉද ලෝක බැංකුවෙ නියෝගය පරිදි තමුන්නාන්සේලා එදා ගත් පියවර නිසා අද මේ රටේ පොදු මහජනතාවට වැදී තිබෙන බලවත් පහරෙ තරම මනින්න මෙය කදිම අවස්ථාවක්.

ගරු කථානායකතුමනි, රුපියල් තුන් සියයට අඩු වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවකයින්ට තමන්ගේ පඩියට අතිරේක වශයෙන් දීමට අදහස් කරන්නෙ රුපියල් දහයක් හෝ ඊට ආසන්න ගණනක්. ඒ මුදල දීමෙන් වැඩි වී තිබෙන බඩු මිල පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දෙන්නෙ කොහොමද? රුපියල් 1.50 ට තිබුණු මිරිස් රාත්තල රුපියල් 6.00 දක්වා ඉහළ නැග තිබෙනවා නම් රුපියල් තුන් සියයක වැටුපක් ලබන පුද්ගලයකුට අතිරේක වශයෙන් රුපියල් දහයක් දීමෙන් වැඩි වී තිබෙන බඩු මිල පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දෙන්නෙ කොහොමද? බඩු මිල වැඩි වීම පමණක් නොවෙයි, මේ ආණ්ඩුව එන්ට එන්ට ම වැවී තිබෙන මඩ ගොහොරුවෙහි තව තවත් එරෙන නිසා පිටරටින් ගෙන්වන බඩු ප්‍රමාණයද සැහෙන ප්‍රමාණයකින් සීමා කර තිබෙනවා. එසේ සීමා කිරීම නිසා තිබෙන බඩු ටිකත් හොර කඩයට ඇදෙනවා. එහෙම නම් අතිරේක වශයෙන් ලැබෙන මේ රුපියල් දහයත් හොරකඩේ මුදලාලිට දී, මෙම අහිංසක සේවකයින් ජීවිකාව ගෙන යන්නෙ කොහොමද? මේ විධියට නම් මෙම ප්‍රශ්නය විසඳන්න බැරි බවයි අපේ කල්පනාව. රුපියලේ මිල අඩු කළ දවස්වල, එය රටේ යහපත සඳහා ගත්ත පියවරක්ය කියා ගුවන්විදුලිය මාර්ගයෙන්, පත්‍ර මාර්ගයෙන්, පත්‍රිකා මාර්ගයෙන් කිව්වා මට මතකයි. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව නිකුත් කළා, "ඔබයි, රුපියලයි, රටයි" කියා පොත් පිංචක්. ඒ පොතේ කියා නැත්තෙ එකයි. රුපියලේ අගය අඩු කිරීමෙන් සාමාන්‍ය මිනිසුන්ට මහා යහපතක් සිදු වන්නට යනවාය කියා ඒ පොතේ රජයට බොහොම බරපතළ ලෙස ප්‍රශංසා කර තිබුණා. රුපියලේ මිල අඩු කළාට, රුපියලට තියෙන්නේ ශත 80 නොවේය ,ශත 100 මය කියා ඒ පොතේ කියා තිබුණා. සීනි බෝල දී පුංචි ළමයින් රවටන්නට උත්සාහ කරන්නා වගේ ඒ පොතේ කියා තිබුණා, මේක ආණ්ඩුව කළ බොහොම ප්‍රඥවන්ත වැඩක්ය කියා. මේ ආණ්ඩුව "ඔබයි, රුපියලයි, රටයි" කියන තුන් ගොල්ලම නැති කළා කියන එක පමණයි, ඒ පොතේ නොතිබුණේ. මේ ආණ්ඩුව ඔබයි, රුපියලයි, රටයි කියන තුන් ගොල්ලම කාලා දැම්මා. දැන් වැඩිපුර රුපියල් 10ක් දෙනවා, පුළුවන් නම් හුස්ම අරගෙන ජීවත් වෙලා හිටපල්ලා කියා. සමහරවිට මී ළඟ අයවැය ලේඛනය එන්නට කලින් මේ වගේ තවත් අතුරු ඇස්තමේන්තු කිපයක් තමුන්නාන්සේලාට මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට සිදු වෙයි, අප කරන්නට අදහස් කළ හැම වැඩකටම, මුලින් අදහස් කළ වියදම සියයට 20 කින් නොවෙයි, 50 කින්, 60 කින් වැඩි වී තිබෙනවාය, මුදල් මදිකම නිසා ඒ වැඩ අතපසු කරන්නට සිදු වී තිබෙනවාය, ඒ නිසා මේ මුදල් අනුමත කරන්නටය කියා. මේ අමාරුකමට මුහුණපාන්නට සිදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
වී තිබෙන්නේ රජයට පමණක් නොවෙයි රජයේ නොපනත්කම නිසා රටවැසියාත් අමාරුවේ වැටී සිටිනවා. අමාරුවේ වැටුණු ඒ රටවැසියා අද එක හඬින් දෙස් තියනවා, මොකක්ද මේ කර තිබෙන විපත්තිය කියා.

රුපියලේ අගය අඩු කිරීමෙන්, තේ, රබර්, පොල්වලින් විශාල ආදායමක් ලබා ගන්නට පුළුවන් වේය කියා බලාපොරොත්තු වුණා. තමුන්නාන්සේලා රජයට ලබා ගන්න ආදායම මොකක් වුනත් කඩේට ගියාම ශත 25ක් 30ක් නැතිව පොල් ගෙඩියක් ගන්නට බැහැ, රුපියලේ අගය අඩු කිරීම නිසා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Sir, I have to point out that there is no Quorum. We do not want to talk to empty benches.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.**

**පසුව ගණපූර්ණයක් තුබුයෙන්—**

சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.

பிறகு, நிறைவெண் இருந்ததனால்—

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයට ගණපූරණය තබා ගත නොහැකි වීම නිසා මගේ කථාව දෙවැනි වරටත් ඇන හිටවන්නට සිදු වුණා. තුන් වැනි වතාවට වත් ගණපූරණයක් නැති බව හඟවන්නට පෙර වාඩි වන්නයි, මගේ කල්පනාව. ගරු මුදල් ඇමතිතුමා මේ වැය ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමෙන් තමන්ගේ රජය රුපියලේ අගය අඩු කිරීම සඳහා ගත් පියවර වැරදි බව, සාවද්‍ය බව ඔප්පු කර තිබෙනවා. එතුමා එය පිළිගෙන තිබෙන බව මෙයින් පෙනේ. දිලි වෙනවා. මා මීට පෙර කියා සිටියාක් මෙන් මේ අතිරේක ඇස්තමේන්තුව සියේට 110 කින් පමණ වැඩි කර හය කෝටිය, දොළොස් කෝටි පණස් ලක්ෂයක් දක්වා සංශෝධනය කරන්නට වුණා වාගේම අවුරුද්දක් ගත වන විට—මේ මුදල් අවුරුද්ද අවසන් වන විට—මේ ආණ්ඩුවට මුහුණ පාන්නට සිදු වන පරතරය රුපියලේ අගය අඩු කිරීම නිසා තව තවත් පළල් වී ආර්ථික ප්‍රපාතයකට ඇද වැටී අවසන් හුස්ම හෙළනවා ඇති. එදාට, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව එදා රුපියලේ අගය අඩු කළ දවසේ කළ ගුණ වර්ණනාවන් වෙනස් වී තමුන්නාන්සේලාගේ ශෝකප්‍රකාශ හැටියට කියවන්නට ලැබෙනවා ඇති.

පූ. භා. 10.50

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු කථානායකතුමනි, මේ පරිපූරක ඇස්තමේන්තුව යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මටත් ඉදිරිපත් වන්නට සිදු වී තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ රජයේ සේවකයන්ටත්, පළාත් පාලන සේවකයන්ටත්, රජයේ විශ්‍රාමිකයන්ටත්, පළාත් පාලන සේවයේ විශ්‍රාමිකයන්ටත් මෙන්ම රජයේ සේවකයින්ගේ වැන්දඹු අනත්දරු වන්ටත් රුපියලේ අගය අඩු කිරීම නිසා දරන්නට සිදු වී තිබෙන වැඩි වියදම වෙනුවෙන් යම්කිසි සහනයක් දීමටයයි කියන්නට යෙදුණා. ඒ වාගේම විරුද්ධ පාර්ශ්වයෙනුත් අහන්නට යෙදුණා, දෙන්නට බලාපොරොත්තු වන දීමනාවේ ප්‍රමාණය ගණන් බැලුවේ කොහොමද යනුවෙන්. තක්සේරු කළේ කෙසේදැයි විරුද්ධ පාර්ශ්වයෙන් ඇහුවා. මොන මොන සාධකයන් උඩද එක් කොටසකට රුපියල් පහළොව බැගිනුත්, තවත් කොටසකට රුපියල් දහය බැගිනුත් දීමනාවක් ගෙවීමට තීරණය කර තිබෙන්නේ? ඒ ප්‍රශ්නයට හරි උත්තරයක් දෙන්නට ගරු මුදල් ඇමතිතුමාට බැරි වුණා. සාමාන්‍යයෙන් කල්පනා කර බලා මේ ගණන ගෙවිය යුතුයයි නිගමනය කළ බවයි කියන්නට යෙදුණේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

පිළිතුරක් දෙන්නට තවම වේලාව ආවේ නැහැ නොවැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

බොහෝම සන්තෝෂයි. අපට සෑහෙන ප්‍රමාණයකටවත් සෑහීමකට පත් වන්නට පුළුවන් විධියේ උත්තරයක් දෙන්නට ගරු ඇමතිතුමාට පුළුවන් වෙනැයි මා බලාපොරොත්තු වෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාටත් මතක ඇති අයවැය විවාදයට සහභාගි වන විටත් අපේ රටේ තත්ත්වය ගැන දීර්ඝ වශයෙන් කියන්නට යෙදුණු දේවල්. ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය ඇස්තමේන්තුවල වෙන් කර තිබුණු මුදල් ප්‍රමාණයන් අනුව බොහෝම දීර්ඝ කාලයක් තිස්සේ යම් යම් ශ්‍රේණිවල අයට තමන්ගේ ආදායම සහ වියදම සම තත්ත්වයේ තබා ගන්නට බැරි වීම නිසා විශාල උද්ඝෝෂණයන් කළ බව අප කවුරුනුත් පාහේ දන්නවා. ඒ උද්ඝෝෂණයන් දෙස බලන විට වෘත්තීය සංගම් ගණනාවක් විසින් රජයෙන් තමන්ගේ මාසික වැටුප රුපියල් 120 දක්වා වැඩි කරන ලෙස කළ ඉල්ලීමත් දකින්නට ලැබෙනවා ඇති. රජයේ ලිපිකාර සේවා සංගමය, යතුරු ලේඛකයින්ගේ සංගමය වැනි වෘත්තීය සමිති විසින් සාමාන්‍ය ලිපිකාර සේවයේ සාමාන්‍ය පංක්තියේ කෙනකුගේ තත්ත්වයට සමාන නිලධාරියකුගේ මාසික වැටුප රුපියල් 120කින් වත් පටන් ගත යුතුයයි කියා සිටියා. දැන් ඒ අයගේ මාසික මූලික වැටුප රුපියල් 80යි. දැන් මාසයකට රුපියල් 80ක්ව තිබෙන මූලික ආරම්භක වැටුප රුපියල් 120 දක්වා වැඩි කරන්නැයි කියන එකයි ඉල්ලීමක් හැටියට ඉදිරිපත් කළේ. එය කළේ රුපියලේ අගය අඩුකරන්නට පෙරයි. මේ ඉල්ලීම ගැන ගරු අගමැතිතුමා ඇතුළු ඇමති මණ්ඩලයේ සමහරුන් සමඟ සාකච්ඡා කළා; රැස්වීම් පවත්වා මහජන මතයක් ඇති කළා. ඒ වාගේම, සාමූහික වශයෙනුත් ඉල්ලීමක් කරන්නට යෙදුණා. ඒ ඉල්ලීම නම් රුපියල් 80 මූලික වැටුප සියයට 50කින් වැඩි කොට රුපියල් 120ක් කිරීමයි. එහෙත් රුපියලේ අගය සියයට 20කින් පහත හෙළුවාට පසුව පවා දෙන්නේ, මූලික වැටුප රුපියල් 100 දක්වා අයට රුපියල් 15 කුත්, රුපියල 100 සිට 300 දක්වා අයට රුපියල් 10 කුත් පමණයි. රුපියලේ අගය පහත හෙළන්නටත් කලින් ඒ අය ඉල්ලුවේ රුපියල් 80, 120 දක්වා රුපියල් 40 කින් හෙවත් සියයට 50කින් මූලික වැටුප වැඩි කරන ලෙසයි. ඒ අනුව, රුපියලේ අගය අඩු කළ පසුව නම් මූලික වැටුප දළ වශයෙන් සියයට 60 කින් වැඩි වන්නට ඕනෑ. එසේ මූලික වැටුප සියයට 60කින් වැඩි කරනවා වෙනුවට දැන් දී තිබෙන්නේ, රුපියල් 100 දක්වා අයට රුපියල් 15කුත්, රුපියල් 100 යේ සිට 300 දක්වා මූලික වැටුප් ලබන අයට රුපියල් 10 ක අතිරේක දීමනාවකුත් පමණයි. මේ අනුව කල්පනා කර බලන විට අපට පෙනෙනවා, ඉල්ලීමත් දීමනාවත් අතර ඇති පරතරය කොයි තරම් විශාලද කියා.

එසේ ඉල්ලීමක් කළේ ලිපිකරු හා සමාන්තර සේවාවලට අයත් සේවකයනුයි. එවැනිම ඉල්ලීමක්, පහළ ශ්‍රේණිවල අය හෙවත් කණිෂ්ඨ සේවකයනුත් ඉදිරිපත් කළා. ඔවුන්ගේ දැන් ආරම්භක මූලික වැටුප රුපියල් 40 යි. එය රුපියල් 75 දක්වා වැඩි කරන ලෙසයි, ඔවුන්ගේ ඉල්ලීම. පොදුවේ ගෙන බලන විට වැඩ කිරීමෙන් වැටුප් ලබන ජනතාවගේ ඉල්ලීම, ලිපිකරු හා ඊට සමාන්තර සේවාවල අයගේ ආරම්භක මූලික වැටුප රුපියල් 80 සිට 120 දක්වාත්, කණිෂ්ඨ සේවකයන්ගේ ආරම්භක මූලික වැටුප රුපියල් 40 සිට 75 දක්වාත්, ඊට අනුරූපව අනෙක් අයගේත් වැටුප් වැඩි කරන ලෙසයි. රුපියල් 40 සිට රුපියල් 75 දක්වා රුපියල් 30 කින් මූලික වැටුප වැඩි කරන්නැයි ඉල්ලුවාම, ඒ වෙනුවට රුපියල් 15 ක අමතර දීමනාවක් දෙනවා. ඉල්ලීමත්, දීමනාවත් අතර තිබෙන විශාල පරතරය මෙයින්ම පෙනෙනවා නොවෙයිද ?

මේ රජය දුප්පතුන් මත කොයි අන්දමට බර පටවා තිබෙනවා දැයි පසුගිය අය-වැය විවාදයේදී අප පෙන්වා දුන්නා. 1967

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

අගෝස්තු 2 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 188 වැනි තීරුවේ මගේ කථාවේ මෙසේ සඳහන් වී තිබෙනවා :

"තමුන්නාන්සේලා 1965/66 වර්ෂයේදී පොහොසත් උදවියට අයබදු සහන වශයෙන් ලක්ෂ 509.9ක් දී තිබෙනවා. බදු බර කිසිවක් නැහැ...... 1966/67 වර්ෂයේදී මුදල් බදු සහන ලක්ෂ එකහමාරක් දී තිබෙනවා. 1967/68 දී තමුන්නාන්සේලා ලොකු උදවියට ශතයක්වත් බර පැටෙව්වේ නැහැ.

ඊළඟට එකතුව බලමු. පසුගිය අවුරුදු තුන ඇතුළත තමුන්නාන්සේලා දුප්පත් ජනතාවගෙන් උදුරා ගෙන තිබෙන ගණන ලක්ෂ 511.4 යි. ඒ ලක්ෂ 511.4 ට තවත් කෝටි 5½ ක්—තමුන්නාන්සේලා තෙල් කොම්පැණිකාරයන්ට වන්දි වශයෙන් දුන් කෝටි 5½ ත්—එකතු කරන්නට ඕනෑ. ඒ අනුව පසුගිය අවුරුදු තුන ඇතුළත සාමාන්‍ය ජනතාවගේ භාණ්ඩාගාරයෙන් ලොකු ධනපතියන්ට ලක්ෂ 1,061.4 ක් දී තිබෙනවා. පුංචි අයට කොපමණ දුන්නාද? 1965/66 වර්ෂයේදී තීරු බදු සහන ලක්ෂ 184 ක් දී තිබෙනවා. ලොකු අයටත් එය බලපාන බව ඇත්තයි. ඊළඟට 1966/67 වර්ෂයේදී කිසිම සහනයක් දී නැහැ. 1965/66 වර්ෂයේදී ලක්ෂ 184 ක තීරු බදු සහනයක් දී තීරු බදු ලක්ෂ 250 ක් දැම්මා...... 1966/67 වර්ෂයේදී කිසිම සහනයක් දී නැහැ. හාල් කැපීමෙන් දුප්පත් මිනිසුන්ට පැටවූ බර ලක්ෂ 1,400 යි...... ඊළඟට තීරු බදු බර ලක්ෂ 1,000 ක් පැටෙව්වා. 1967/68 වැටුප් සහන වශයෙන් ආණ්ඩුවේ සේවකයන්ට ලක්ෂ 600 ක් දී තිබෙනවා. එසේ කර මුළු ජනතාවටම තීරු බදු බර ලක්ෂ 950 ක් පැටෙව්වා. එතකොට කොහොමද අය-වැය? සාමාන්‍ය ජනතාවට දුන් සහනය ලක්ෂ 784 යි. පැටවූ බර ලක්ෂ 3,600 යි. ලොකු අයට තමුන්නාන්සේලා කිසිම බදු බරක් පැටෙව්වේ නැහැ. ඒ අයට බදු සහන දුන්නා ලක්ෂ 511.4 ක්. ඒ අනුව දුප්පත් අයට ලැබුණු ලාභය රුපියල් ලක්ෂ 784 යි. පාඩුව 3,600 යි. මේ අනුව බලන විට ඔවුන්ගේ"

—ඒ කියන්නේ පුංචි අයගේ—

"—ශුද්ධ පාඩුව රුපියල් ලක්ෂ 2,816 යි. දුප්පත් අයට රුපියල් ලක්ෂ 2,816 ක අමතර බරක් පටවා, ධනපති පන්තියට ලක්ෂ 1,011 ක සහනයක් දුන්නා."

අවුරුදු 3 ක මේ ආණ්ඩුවේ වාර්තාව දළ වශයෙන් ඔන්න ඕකයි. දැන් රුපියලේ අගය සියයට 20 කින් අඩු කර තිබෙනවා. එසේ 20% ක් කැපුවාට පසුව ආණ්ඩුවේ සේවකයින්ගේ ඉල්ලීම් ගැන කල්පනා කර බලා දී තිබෙන්නේ මොනවාද? රුපියලේ අගය අඩු කළාට පසුව රුපියල ශත 80 ට බැස්ස බව තමුන්නාන්සේ දන්නවා. ශත 80 ට ගන්නට තිබුණු බඩු දැන් රුපියල වී තිබෙනවා. සාමාන්‍යයෙන් වෙළඳපොළේ තිබෙන තත්ත්වය ඒකයි. ආණ්ඩුවත් එයට කොතරම් ධෛර්ය දී තිබෙනවාද කියා දැන් කවුරුත් දන්නවා. සීනි මිල සත 5 කින් වැඩි කළා. පිටි මිල සත 5 කින් වැඩි කළා. තෙල් මිල වැඩි කළා. හාල් සලාකය කැපුවා. කලින් සත 50 ට හාල් සේරු දෙකක් දුන්නා. දැන් හාල් සේරු දෙකෙන් 1.85 යි. එකක් නිකම් දෙනවා; අනික 1.85 යි. ඉස්සර හාල් සේරු 2ක් 1.66ට අරගෙන ශත 50ට දෙන විට භාණ්ඩාගාරය 1.16ක පාඩුවක් වින්දා. හාල් සේරුවක් සත 83 බැගින් අරගෙන හාල් සේරු දෙකක් 50 ට දෙන විට 1.16ක පාඩුවක් විඳින්නට සිදු වුණා. මේ ආණ්ඩුව 1.66 ට හාල් සේරු දෙකක් ගන්නවා නම් එකක් නිකනුත් අනික 1.85 කටත් විකිණීමෙන් සත 19ක ලාභයක් ලබනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

එදා සත 50 ක් ගෙවූ තැනැත්තාට අද නිකම්ම හාල් සේරුවක් ලැබෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඔය නිකම් දෙන එකත් අරගෙනයි. එක හාල් සේරුවකින් පමණක් නඩත්තු වන්නට බැරි බව කවුරුත් දන්නවා. අනික් අතට පාන් ගත්තත් වැඩි මිලක් ගෙවන්නට සිදු වී තිබෙනවා.

ඔන්න ඔහොමයි අපේ මේ ආණ්ඩුව දැන් කටයුතු කරගෙන යන්නේ. මේ හාල් සලාකය කැපීමෙන් පසුව ආණ්ඩුවේ සේවකයින් ඉල්ලීමක් කළා. එම ඉල්ලීම නම් ආණ්ඩුවේ සේවකයිනුත් සාමාන්‍ය සේවකයිනුත් එකතු වී උපයන මුළු ආදායමෙන් 20% ක දීමනාවක් ඔවුන්ට ගෙවන්නය කියන එකයි. එය සාධාරණයි කියා මා හිතනවා. ගරු අගමැතිතුමාත් අනිකුත් ඇමතිවරුත් කියන්නේ විදේශීය විනිමය නිසා රුපියලේ අගය අඩු කරන්නට සිදු වුණාය කියලයි. ඒ කියන්නේ විදේශ රුපියලේ අගය අඩු කළා මිස ලංකාව තුළ රුපියලේ අගය අඩු කළේ නැත කියන එකයි. ලංකාවේ රුපියලේ අගය අඩු කළේ විදේශ අගය වශයෙන් යයි කියනවා. ඔය වගේ දේශපාලන හා ආර්ථික ප්‍රශ්න සාමාන්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනතාවට සූත්‍ර වශයෙන් තේරෙන්නේ නැහැ. සාමාන්‍ය ජනතාව බලන්නේ බඩට වදින්නේ කොහොමද, ඇගට වදින්නේ කොහොමද, ඇඳුමට වදින්නේ කොහොමද සිගරැට් එකට වදින්නේ කොහොමද කියන ඒවායි. ඒ නිසා ඒ අය ඉල්ලන්නේ මොකක්ද ? "පවුම කැපූ නිසා රුපියලත් විදේශ විනිමය වශයෙන් කැපුවා නම් එය ඕනෑ එකක් කර ගන්න, කරුණාකර කලින් රුපියලට ගත් බඩු අදත් රුපියලකට ගන්නට ඉඩ සලසන්න" කියන එකයි මහ ජනයාගේ ඉල්ලීම. මාර්කට් එකට ගිය විට සිදු වන්නේ කුමක්ද ? කලින් සත 80 ට ගත් බඩුවලට දැන් රුපියලක් ගෙවන්නට සිදු වෙනවා. ඒ නිසා තමයි අර සියයට 20 දෙන්නය කියා තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

1956 දී රුපියලකට ගත් බඩු 1960 දීත් රුපියලකට ගන්නට පුළුවන්යැ ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒක වෙනම ප්‍රශ්නයක්. ඒ නිසා තමයි අර රුපියල් 80 රුපියල් 120 කරන්නය කියා ඉල්ලන්නේ. රුපියල් 40 රුපියල් 75 ක් දක්වා වැඩි කරන්නැයි ඉල්ලන්නේ ඒකයි. රුපියලේ අගය සියයට 20 කින් කැපූ නිසයි, මෙම ඉල්ලීම් කරන්නට සිදුවී තිබෙන්නේ. රුපියලේ අගය සියයට 20 කින් කැපීමෙන් රටට හානියක් සිදු වී නැත්නම් ලංකාව ඇතුළත බඩු මිල දී ගැනීම සඳහා වැඩිපුර සියයට 20 ක් දෙන්නැයි ඉල්ලනවා. එහෙත් මෙතෙක් කිසිම සහනයක් ලැබී නැහ.

රුපියල් 30 කින් වැටුප් වැඩි කළ යුතුය යන්න අනෙක් ඉල්ලීමයි. පුවත් පත්වල ගැසට්පත්වල කුමන විධියට සඳහන් වුණත්, මේ මේ සලාකවලට ගෙවිය යුතු මිළ මේ මේ තරම් යයි සඳහන් වුණත් ඒ ලැබෙන සලාකවලින් ජනතාවගේ අඟහිඟකම් පිරිමසා ගන්නට පුළුවන්කමක් නැති බව අප කවුරුනුත් දන්නවා. යහමින් මුදල් තියෙන උදවියට කළුකඩයට ගොස් වුවමනා කරන දේවල් ලබා ගන්නට පුළුවනි. එහෙත් සාමාන්‍ය ජනතාවට ඒ සඳහා මුදල් හදල් නැහැ. අප පාලනය කළ යුගයේදීත් යම් යම් අමාරුකම්වලට මුහුණ පාන්නට නොසිදු වුණා නොවෙයි. එහෙත් ඒ ඇති වුණු අමාරුකම් සැම දෙදෙනාටම එක හා සමානව බෙදා දෙන්නට අප උත්සාහ කළා. එහෙත් අද සිදු වී තිබෙන්නේ ඊට වෙනස් දෙයක්. අද සලාකයට දෙන බඩු ප්‍රමාණය එක මිළක්. සලාකයට පිටින් දෙන බඩු ප්‍රමාණය තවත් මිළක්. මේ අනුව සලාකයට පිටින් ගන්නා වියලි මිරිස් රාත්තලක් රුපියල් 8 ක් වෙනවා. මෙවැනි තත්ත්වයක් උද්ගත වී පවතින නිසා තමන්ට ලැබෙන වැටුප මදි බවත්, එසේ හෙයින් එය රුපියල් 30 කින් වැඩි කළ යුතු බවත්, සේවකයන් කියනවා. මුදල් ඇමතිතුමාට පිළිතුරු දීමට පහසු වීම සඳහායි, මා මේ කරුණු විස්තර සහිතව ඉදිරිපත් කරන්නේ. මේ මේ විධියට කටයුතු කරන්නට හේතු සාධක මේ මේවායි යනුවෙන් එතකොට ගරු මුදල් ඇමතිතුමාට කියන්නට පුළුවනි.

ඊළඟ ඉල්ලීම, කැපූ හාල් සේරුව ආපසු දිය යුතුය යන්නයි. ආණ්ඩුවේ සේවකයන්, වෘත්තීය සමිති සහ මහජනතාව මේ ඉල්ලීම කරන්නේ අන්ධයන් හැටියට නොවෙයි. කැපූ හාල් සේරුව ආපසු දිය නොහැකි නම්, හාල් සේරු දෙකක් ගත හැකි මුදල දෙන්නැයි ඒ අය කියනවා. කරන්නට බැරි දෙයක් කියන්නේ නැහැ. පිටරටින් හාල් ගෙන්වන්නට බැරි නම් ඒකට කරන්නට දෙයක් නැහැ. දැනට රටේ පවතින මිළ ගණන් අනුව හාල් සේරුවක් ගන්නට රුපියල් 1.85 ක් වුවමනායි. ඒ නිසා වැඩිපුර හාල් සේරුවක් ගන්නට රුපියල් 1.85ක් දෙන්නැයි ඉල්ලනවා.

වැඩි කරන ලද සීනි පිටි හා තෙල් මිළ අඩු කළ යුතුය යන්න ඊළඟ ඉල්ලීමයි. රුපියලේ අගය අඩු කිරීම ගැන කල්පනා කළ විට, එය ලංකාවේ අභ්‍යන්තර ගනුදෙනුවලට බල නොපාන බව ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා. ලංකාව තුළ බඩු වුවමනා තරම් තිබෙන බවත්, ඒ නිසා ඒවායේ මිළ වැඩි වීම පිළිබඳ ප්‍රශ්නයක් මතු නොවන බවත් එතුමා ප්‍රකාශ කළා. ඇයි, එහෙම නම් පිටි සීනි හා තෙල් ආදි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
යෝ මිළ වැඩි කෙළේ ? පිටි මිළ ශත 5කින් වැඩි කළා. සීනි මිළ ශත 5 කින් වැඩි කළා. තෙල් මිළ වැඩි කළ ගණන මට හරියට මතක නැහැ. කොටින්ම ජනතාව පාවිච්චි කරන බඩුවල මිළ වැඩි කළා. ඒ වැඩි කළ මිළ ගණන් පහත දමන්නටයි, මේ ඉල්ලා සිටින්නේ.

දැන් 5 වන ඉල්ලීම ගැන බලමු. රුපියලේ අගය අඩු කරන කාලයේදී බස් ගාස්තු හා දුම්රිය ගාස්තු වැඩි කිරීම පිළිබඳව ලොකු රාවයක් තිබුණා. ඒ කාලයේදී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් හෝ ඒ මණ්ඩලය වෙනුවෙන් හෝ ගමන් ගාස්තු පිළිබඳව නොයෙකුත් නිවේදන නිකුත් වුණා. මොන නිවේදන තිබුණත් තවම නම් බස් ගාස්තු වැඩි වී නැහැ. එහෙත් එකක් සිදු වී තිබෙනවා. අද මිනිසුන් බස්වල ගමන් කරන්නට හයයි. ඒ නිසා එක්තරා විධියකින් ඒ අඩුපාඩු පිරිමැසෙන්නට ඇති. අද බස් රථ එන කොට පාරේ ගමන් කරන මෝටර් රථ නවත්වන තත්ත්වයක් පවතිනවා. මේ අතර දුම්රිය බස්රිය මෝටර් රිය ආදියේ පමණක් නොව කරත්ත ආදියේද වියදම් බහුල වී තිබෙනවා. කරත්තවල යන අයට පවා අතිරේක වශයෙන් විශාල මුදලක් වැය කරන්නට සිදු වී තිබෙනවා. කාර්වලට අවශ්‍ය කොටස් නැහැ. මෙවැනි තත්ත්වයක් පවතින නිසා මේ අන්දමේ ඉල්ලීමක් කර තිබෙනවා. ආණ්ඩුවේ සේවකයන් සහ අනිකුත් සේවකයන් ඉදිරිපත් කර තිබෙන ඉල්ලීම් ගැන කල්පනා කර බැලුවාද? කල්පනා කර බැලුවා නම් තමුන්නාන්සේලා කොයි විධියට ගණන් බැලීමෙන්ද, මේ රුපියල් 10, 15 දෙන්නට තීරණය කළේ? කරුණාකර මෙම ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

තමුන්නාන්සේ යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ, පළමුවෙන් කී ශ්‍රේණිවලට විතරක් එම සහනය දෙන්නයි. මින් පිටස්තර ශ්‍රේණිවලට-රජයේ නොවන අයට එහෙම—මොන විධියේ සහනද සලසා දී තිබෙන්නේ ? රජයේ සේවකයන්ට, පළාත් පාලන සේවකයන්ට, රජයේ විශ්‍රාමිකයන්ට, පළාත් පාලන සේවයේ විශ්‍රාමිකයන්ට සහ වැන්දඹු හා අනත් දරු විශ්‍රාමිකයන්ට පමණයි, තමුන්නාන්සේගේ යෝජනාවෙන් මෙම සීමිත සහන යන් දෙන්නට අදහස් කරන්නේ. ඉන් පිටස්තර වෘත්තීය සමිතිවලින් කරන ලද ඉල්ලීම් ගැන කැබිනට් මණ්ඩලය මගින් සාකච්ඡා පවත්වා මොන අන්දමේ සහනද දී තිබෙන්නේ කියා මා අහන්නට කැමතියි.

රජය ආදර්ශමත් ස්වාමියකු වශයෙන් ඉදිරිපත් විය යුතුය යන්න කවුරුන් විසිනුත් පිළිගන්නා සත්‍යයක්. තමන් කරන එම කටයුත්ත අර ස්වාමි පක්ෂය ලවා කරවන්නට කොතෙක් දුරට කැබිනට් එක හෝ කම්කරු ඇමතිතුමා ක්‍රියා කර තිබෙනවාද? මෙම සේවකයන්ගෙන් පිටස්තරව සියයට 20 පාඩුව දරනු ලබන තව හුඟ දෙනෙක් සිටිනවා. ගොවීන් එම පාඩුව විඳිනවා. වී මිල ටිකක් වැඩි කිරීමෙන් කල්පනා කරනවා ඇති, දුප්පත් ගොවි ජනතාව සැනසිල්ලේ සිටිනවාය කියා. අපි හැමදාම ගොවීන්ට හුඟක් වැඩ කර තිබෙනවාය කියා සිතා සිටිනවා ඇති. මා කීප වතාවක්ම ගියා, හේවාහැට පළාතට. ලඟදිත් ගියා. එක අතකින් බලන විට හේවාහැට මේ රට ගොවි රටක් හැටියට හඳුන්වා දීමේදී නිදර්ශනයක් වශයෙන් පෙන්විය හැකි පළාතක්. එම පළාතේ වී ගොවිතැනත් එළවළු ගොවිතැනත් කෙරෙනවා. එම පළාතේ ජීවත් වන ගොවි ජනතාවගේ ජීවිත ගැන සලකා බලන විට මේ වී මිල වැඩි කිරීමෙන් ඔවුන්ට අල්ප මාත්‍රයකින්වත් සහනයක් සැලසී තිබෙනවාය කියා සිතන්නට අමාරුයි. ඉස්සර වැඩි මිලක් දීලාවත් තමන්ට වුවමනා බඩු ලබා ගන්නට තිබුණා. දැන් තමන්ට අවශ්‍ය දේ එහෙමවත් ලබා ගන්නට නැහැ. කිරි නැහැ. පිටි නැහැ. විශාල ආන්දෝලනයක් මේ රටේ ඇති කළ කරවලත් නැහැ. එවැනි කිසිවක් නොමැති නිසා මේ රටේ සාමාන්‍ය ජනතාව විශාල කරදරයකට මුහුණ පා සිටිනවා. ඒ කාලේ රෙදි යාර 6ක් දුන්නා. දැන් දෙන්නේ යාර 2යි. වීවලින් ගොවියාගේ සාක්කුවට රුපියල් දෙක තුනක් වැඩිපුර වැටුණාට මොකද එයින් තමන්ගේ ජීවන තත්ත්වය පෙර තිබුණු මට්ටමෙන් පවත්වා ගෙන යාමට කිසිදු හැකියාවක් ඇත්තේ නැහැ. එසේ හෙයින් ගොවි ජනතාවටත් තමතමන්ගේ රක්ෂා පවත්වාගෙන එදිනෙදා වැඩ කට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුතුවල යෙදෙන අයටත් මෙවැනිම එක්තරා ක්‍රමයක් සකස්කොට යම්කිසි සහනයක් සලසා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවත් එකක් මතක් කර දෙන්නට තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා දන්නවා ඇති, මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවට අයිති නැති කොටස් කීපයක්ම තිබෙන බව. ඒ කොටස් ගැන එතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. එම කොටස් වශයෙන් හැඳින්විය හැක්කේ කවුරුන්ද? එක්තරා විධියක අසරණාධාරයක් ලබන ආණ්ඩුවේ හිටපු සේවකයන් සහ ඒ උදවියගෙන් නඩත්තු වන පිරිස් ඒ ගණයට ඇතුළත් වෙනවා. ඒ එක් අයකුට මසකට රුපියල් 15 ක් දෙන්නට භාණ්ඩාගාරයෙන් නියම කර තිබෙනවා. ආණ්ඩුවේ රක්ෂා කර ඒවා නැති වෙලා පෙන්ෂන් නොලබන අයට එම මුදල ගෙවන්නේ ඉස්සර තිබුණු ක්‍රමයටයි. මා සිතනවා, ගරු මුදල් ඇමතිතුමා ඒ පිළිබඳව ඕනෑකමින් පරීක්ෂාකර බලා පිළිතුරු දෙනවා ඇත කියා. ඒ උදවියටත් මෙම රුපියල් 10 හෝ 15 දෙනවාද? දැනට වලංගුව තිබෙන සැලැස්ම මෙයයි: ආණ්ඩුවේ සේවයෙහි සිටි, පැන්ෂන් නොලබන දුප්පත් උදවියට එක්කෙනකුට මසකට රු. 15 ක් දෙනවා. නඩත්තු වන්නන් එක් කෙනකු සිටිනවා නම්—ඒ කියන්නේ, පවුලේ දෙදෙනකු සිටිනවා නම්—ඒ අයට මසකට රු. 20 ක් දෙනවා. නඩත්තු වන්නන් එක්කෙනකුට වැඩියෙන් සිටිනවා නම් මසකට රු. 25 ක් දෙනවා. ගරු මුදල් ඇමතිතුමා දැන් සලසන්නට යන සහනය මේ කොටසටත් ලබා දෙන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

තවත් ශ්‍රේණියක් තිබෙනවා. එනම්, ආණ්ඩුවේ සේවයෙහි සිටි කෙනකු මිය ගියායින් පසු ඔහුගෙන් නඩත්තු වන අයට පැන්ෂන් එකක් නොලැබෙන අයයි. භාණ්ඩාගාරයේ දැන් තිබෙන ක්‍රමය අනුව එවැනි වැන්දඹුවකට මසකට රු. 15 කුත් වැන්දඹුවත් තවත් එක්කෙනකුත් පවුලේ සිටිනවා නම් එවැනි අයට රු. 20කුත් ලැබෙනවා. මේ කොටසටත් ඔබතුමාගේ සහනයන් ලබා දෙන මෙන් මා ඉල්ලනවා.

අ. භා. 11.14

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ගරු කථානායකතුමනි, මා හිතන හැටියට මේ සාකච්ඡාව 12 වන තුරුම් කෙරෙනවා ඇති.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ඇයි, ඒ?

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

කථා කරන්නට මන්ත්‍රීවරුන් සිටිනවා.

ගරු කථානායකතුමනි, මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් මේ රුපියල් කෝටි හය හමාරක මුදලක් වෙන් කරන්නට ගරු මුදල් ඇමතිතුමා අදහස් කරන්නේ—

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

කථානායකතුමනි, කෝටි හයහමාරක් වෙන් කරන්නට සූදානම් වෙතත් ආණ්ඩු පක්ෂයේ හය දෙනෙකුවත් නැහැ. සභාවේ ගණපූරණයක් නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ගණපූරණයක් නැ කිය කියා තමුන්නාන්සේත් යන්නේ ඇයි?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

හොඳයි, මම මගේ ආසනයට ගිහින් කියන්නම්. කථානායකතුමනි, සභාවේ ගණපූරණයක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැතිවූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

*சபை கணிக்கப்பட்டபோது நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

කථානායකතුමනි, මේ මුදල වෙන් කරන්නට යන්නේ මොනවාටද යන වග කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) පෙන්වා දුන්නා. මේ යෝජනාවෙන් කියැවෙන කොටසට අයත් වන පිරිස ඉතාම සුළු බව අප දන්නවා. මේ කොටසට අයත් නැති සාමාන්‍ය ගොවි ජනතාවට රුපියල් 2 ක සහනයක් රජයෙන් ලබා දී තිබෙන නමුත්, වී ගොවිතැන් නොකරන නිසා ඒ සහනයත් නොලැබෙන විශාල පිරිසක් සිටින බවත් අප දන්නවා. හලාවත ආදී පළාත්වල සිටින දහස් ගණනක් මසුන් මරන්නන් ගැන කල්පනා කර බලන්න. ඒ අයට මොන විධියේ සහනයන් දීමට මේ රජය අදහස් කරනවාද ? මොන විධියේ සහනයන් දීමට තීරණය කර තිබෙනවාද ? ගරු මුදල් ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී අප ඒ කරුණු දැන ගන්නට සතුටුයි. හාල් සේරුව නොමිළයේ දීම නිසා, මාළු අල්ලන්නන්ට විශාල අමාරුවකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

නිකං දෙන හින්දද අමාරු ?

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඔව්.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ආ !

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ගම්බද පළාත්වල අයට නම් මංඤොක්කා, බතල, වැනි දේවල් තිබෙන නිසා හාල් අඩු වීමෙන් එතරම් අමාරුවක් දැනෙන්නේ නැහැ. එහෙත්, මුහුදු යන අයට තුන් වේලම බත් කෑවේ නැත්නම් ලොකු අමාරුවක් ඇති වන බව තමුන්නාන්සේ දන්නවා. එම නිසා, එක හාල් සේරුවක් නොමිළයේ ලැබුණත් තවත් හාල් සේරු 3 ක් පමණ වැඩි මිළට ගන්නට ඔවුන්ට සිදු වී තිබෙනවා. සේරුවක් රු. 1.50 ගණනේ වැඩිපුර රු. 4.50ක මුදලක් එක් මසුන් මරන්නකුට සතියකට වියදම් වන බව අප කවුරුනුත් පිළිගත යුතුයි. එවැනි අයට සහනයක් නොලැබීම අසාධාරණයක් නොවේද යන වග ගරු මුදල් ඇමතිතුමා කල්පනා කර බලන්නට ඕනෑ. වී ගොවිතැන් කරන අයට සහනයක් ලැබෙන අතර ගොඩ ගොවිතැන් කරන අයට අල, බතල ආදියෙන් වේල පිරිමසා ගන්නට පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ කොට්ඨාශයේත් මුහුදු යන අය දහස් ගණනින් සිටිනවා. ඒවාගේම ආණ්ඩුවේ සහ පළාත් පාලන ආයතනවල සේවය නොකළ හා සේවය නොකරන ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් සිටිනවා. ආණ්ඩුවේ සහ පළාත් පාලන ආයතනවල සේවය කරන්නවුන්ගේ සංඛ්‍යාව මුළු ජනගහණයෙන් සියයට 20 ක්වත් වේවිය කියා මා සිතන්නේ නැහැ. එසේ නම් අනිත් අයට කුමන සහනයක් ලැබී තිබෙනවාද ? ඇත්ත වශයෙන්ම රුපියල බාල්දු කිරීමෙන් රටේ සියළු දෙනාටම විශාල පාඩුවක් වී තිබෙනවා. එය කවුරුත් පිළිගන්නා කරුණක්. රුපියල බාල්දු කරන අවස්ථාවේදී තමුන්නාන්සේලා ගෙන ගිය ප්‍රචාර අපට මතකයි. අගය අඩු කළාට රුපියලට ශත සියයමයි, මේ රටේ රුපියලේ අගය අඩු වෙන්නෙ නැහැ, මේ රටේ රුපියලේ කිසිම වෙනසක් වෙන්නේ නැහැ, ආදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වශයෙන් ප්‍රචාරයන් ගෙන ගිය තමුන්නාන්සේලා විදේශීය විනිමය වටිනාකම අතින් පමණක් රුපියලේ අගය අඩු කළාය කිව්වා. එසේ රුපියලේ අගය අඩු කරන්නට හේතුව එංගලන්තයේ රන් පවුමේ වටිනාකම සියයට 13 කින් අඩු කිරීම ය කිව්වා. ඒ අනුව රුපියලේ අගයත් අඩු කිරීමෙන් අපට වැඩියෙන් බඩු අපනයනය කර වැඩිපුර විදේශ විනිමය ආදායමක් ලබා ගැනීමට පුළුවන් වෙනවාය කිව්ව. ඇත්ත වශයෙන්ම රුපියල බාල්දු කිරීමට තමුන්නාන්සේලා ඉදිරිපත් කළ මූලික හේතුව ඒකයි. ඒ අනුව මේ කාලය තුළදී රුපියලේ අගය අඩු කිරීම නිසා කොයි තරම් ප්‍රමාණයකින් අපේ විදේශ විනිමය ආදායම වැඩිවී තිබෙනවාද කියා මා දැන ගන්නට සතුටුයි. රුපියලේ අගය අඩු කිරීමෙන් මූලික වශයෙන් තමුන්නාන්සේලා අදහස් කළේ අපේ තේ, රබර්, පොල් ඇතුළු අනෙකුත් අපනයන ද්‍රව්‍ය වැඩියෙන් පිටරට යවා ලංකාවට වැඩිපුර විදේශ විනිමය ආදායමක් ලබා ගැනීමටයි. රුපියලේ අගය අඩු කිරීමට මේ ආණ්ඩුව සෑම අවස්ථාවකදීම පෙන්වූ හේතුව ඒකයි. එසේ නම් තමුන්නාන්සේලා බලාපොරොත්තු වූ පරිදි අපේ අපනයන ද්‍රව්‍යවලින් ලැබෙන ආදායම වැඩිවී තිබෙනවාද? රුපියලේ අගය අඩු කළ නිසා රබර් මිළ කීයකින්වත් වැඩිවී තිබෙනවාද ? හැබැයි, පොල්වලින් ලැබෙන ආදායම වැඩිවී තිබෙනවාය කියා තමුන්නාන්සේලාට කියන්නට පුළුවනි. පොල් වලින් ලැබෙන ආදායම වැඩිවී තිබෙන බව ඇත්ත තමයි. එම නිසා හලාවත ප්‍රදේශයේ අයටත් විශාල යහපතක් අත්වී තිබෙනවා. නමුත් පොල්වලින් ලැබෙන ආදායම වැඩිවුණේ රුපියලේ අගය අඩු කළ නිසා නොවෙයි. පොල්වලින් ලැබෙන ආදායම වැඩිවීමට හේතුව මේකයි. ඇමරිකාව "ඩෙසිකේටඩ් කොකනට්," කපාපු පොල් යනාදිය විශාල තොග වශයෙන් පිලිපයින් දූපතෙන් ගන්නා බව තමුන්නාන්සේ දන්නවා. ඒ පිලිපයින් දූපතටත් අර හලාවතට වගේ සුළි සුළඟක් ඇවිත් විශාල හානියක් සිද්ධ වුණා. එම නිසා පිලිපයින් දූපත්වල පොල් නිෂ්පාදනය අඩු වුණා. එමනිසා ඇමරිකාවට ලංකාවෙන් කපාපු පොල් ගන්නට සිද්ධවුණා. ඒ හේතුවෙන් ශත පනහට පනස් පහට තිබුණු කපාපු පොල් මිළ ශත අසූ පහ, ශත අනූව දක්වා ඉහළ ගිය අතර පොල් දහසක වටිනාකම රුපියල් 250 දක්වා ඉහළ ගියා. පොල් මිළ ඒ ආකාරයට ඉහළ ගිය නිසා මේ සුළු කාලය ඇතුළත පොල් වතු හිමියන්ට සෑහෙන වාසියක් ලැබුණා. නමුත් එවැනි වාසියක් ලැබුණේ රුපියලේ අගය අඩු කිරීම නිසා නොවන බව මා මේ අවස්ථාවේදී මතක් කළ යුතුයි.

තමුන්නාන්සේලා බලාපොරොත්තු වූ පරිදි රුපියලේ අගය අඩු කිරීම නිසා මේ රටට ලැබෙන විදේශ විනිමය ආදායම වැඩිවුණාද යන ප්‍රශ්නය මා නැවතත් ඉදිරිපත් කරනවා. කොහු කර්මාන්තයටත් දැන් මණ්ඩලයක් පත් කර තිබෙනවාය කියා මට ආරංචියි. කොහු සම්බන්ධව අවබෝධයක් තිබෙන උදවිය ඒ මණ්ඩලයට පත් කර තිබෙනවාද කියා මා දන්නේ නැහැ. රුපියලේ අගය අඩු කළ අවස්ථාවේදී සාමාන්‍යයෙන් කොහු මිළත් සියයට 20 කින්වත් වැඩිවේවිය කියා බලාපොරොත්තුවක් තිබුණා. ඒ අනුව කොහු මිළ වැඩිවී තිබෙනවාද කියා මා තමුන්නාන්සේලාගෙන් ප්‍රශ්න කරනවා. රුපියලේ අගය අඩුකිරීමෙන් ආණ්ඩුව බලාපොරොත්තු වූ දේවල් ඉෂ්ට වී නැති බව මේවායින් පෙනෙනවා. ජීවන වියදම ඉහළ ගියත් රුපියලේ අගය අඩු කළ නිසා යම් විධියකින් ලංකාවට වැඩිපුර විදේශ විනිමය ආදායමක් ලැබුණා නම් එයින්වත් සහනයක් ලබා ගන්නට තිබුණා. නමුත් සිද්ධ වුණේ කුමක්ද ? වැඩිපුර විදේශ විනිමය ආදායමකුත් ගන්නට බැරි වුණා. දුප්පත් ජනතාවට ඉසිලිය නොහැකි අන්දමට ජීවන වියදමත් ඉහළ ගියා. දැන් මේ යෝජනාවෙන් විස්තර කරන සහනය ලැබෙන්නේ ඒ දුප්පත් ජනතාවට නොවෙයි. රටේ බහුතර දුප්පත් ජනතාවට කොයි අන්දමේ සහනයක් සලසා දෙනවාද කියන එකයි ප්‍රශ්නය. රුපියලේ අගය අඩු කරනවාත් සමගම සාමාන්‍යයෙන් ඒ බහුතර ජනතාව එදිනෙදා පාවිච්චියට ගන්නා බඩු භාණ්ඩවල මිළත් අඩු කරන්නට කටයුතු කළා නම් ඒ අයට සෑහෙන සහනයක් ලැබෙනවා. නමුත් තමුන්නාන්සේලා එවැනි සහනයක්වත් සලසා දී නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා]

ඊළඟට, සංචාරක මණ්ඩලයක් පිහිටුවා, මේ රටේ සංචාරක කටයුතු වැඩිදියුණු කර වැඩි වැඩියෙන් විදේශීය සංචාරකයන් මේ රටට ගෙන්වා ගෙන එමගින් වැඩිපුර විදේශ විනිමය ආදායමක් ලබා ගන්නටත් තමුන්නාන්සේලා බලාපොරොත්තු වුණා. නමුත් ඒ බලාපොරොත්තුවත් ඉෂ්ට වේවිය කියා අපට සිතන්නට බැහැ. අහේතුවකට මෙන් ඇමෙරිකාවේ තත්ත්වයත් දැන් බොහොම භයානක වී තිබෙනවා. විදේශ ගමන් බිමන් නතර කරන්නට ය කියා ජොන්සන් ජනාධිපතිතුමා දැන් ඇමරිකානුවන්ට කියනවා. එපමණක් නොවෙයි, ඩොලර් එකේ වටිනාකමත් අඩු කරන්ට යනවා. එවිට සිදු වෙන්නෙ මොකක්ද කියා මා අහනවා. [බාධාකිරීමක්] එහෙම කපල-කපල අන්තිමේදී දුප්පතාගෙ බෙල්ලත් කපල යන්ටයි, තමුන්නාන්සේලා ලෑහැස්ති වෙන්නෙ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව දුප්පත් ජනතාව ගැන කිසිම කැක්කුමක් නැති ආණ්ඩුවක් බව මම තරයේම කියනවා. තමුන්නාන්සේලා හැම අවුරුද්දෙම බදු සහන සලසා දුන්නෙ කාටද? ධනපතීන්ටයි. ඒ අතර දුප්පතුන්ට කර තිබෙන්නෙ කුමක් දැයි මා අහන්ට සතුටුයි.

රුපියලේ අගය අඩු කිරීමෙන් තමුන්නාන්සේලා බලාපොරොත්තු වුණේ බැස ගෙන යමින් තිබුණු විදේශ විනිමය ආරක්ෂා කර ගැනීමයි. ඊට එකම ක්‍රමය රුපියලේ අගය අඩු කිරීම යයි අදහස් කර ගෙනයි, මේ කටයුත්ත කරන්ට යෙදුනෙ. එහෙත් අද ඒක ඉෂ්ට වෙලා තිබෙනවද? ඉෂ්ට වෙලා නැහැ. අපි ආණ්ඩු බලයේ සිටි කාලයෙදිත් 1956 සිට 1961 දක්වා අවුරුද්දකට රුපියල් කෝටි 20 ගණනේ විදේශ විනිමය බැසගෙන ගියා. ඊට හේතු වුණේ අපේ රටින් පිටරට යවන බඩුවලට ලැබෙන මිළ අඩු වුණු අතර, පිටි, සීනි, රෙදි වැනි පිටරටවලින් මෙරටට ගෙන්වනු ලබන ද්‍රව්‍යවල මිළ ක්‍රමයෙන් වැඩි වීමයි. එය වළක්වන්න අපේ ආණ්ඩුව කළේ මොකක්ද? අපි ඒ අවස්ථාවේ කළේ ධනේශ්වර පන්තියට අවශ්‍ය සෑම සුඛෝපභෝගී භාණ්ඩයක්ම වගේ ගෙන්වීම ක්‍රමයෙන් නතර කිරීමයි. අපි ඒ අවස්ථාවේ දුප්පත් ජනතාවගේ හාල්,



මිරිස්, ලූනු යනාදියට අත නොගැසූ බව කවුරුත් දන්නව. 1961 දී එවකට සිටි මුදල් ඇමතිතුමා විදේශ විනිමය ආරක්ෂා කර ගන්න ක්‍රියා මාර්ග කීපයක් ගත්ත. ඒ සෑම අවස්ථාවකදීම දුප්පතාගේ බඩට නොවදින අන්දමට, දුප්පතාට පාඩුවක් නොවන ආකාරයට කටයුතු කළා. කාර් වැනි සුඛෝපභෝගී භාණ්ඩ ගෙන්වීම තහනම් කළා. එහෙත් අද දුප්පත් ජනතාවට එදිනෙදා අවශ්‍ය ලූනු, මිරිස් ලබා ගන්න අමාරුයි. එහෙත් මුදල් තිබෙන අයට අමාරුවක් නැහැ. ඒ උදවියට රුපියල් 8 ක් වුණත් ගෙවා මිරිස් ලබාගෙන පාවිච්චි කරන්ට පුළුවන්. සෑම දෙයක්ම වැඩි මිළට ලබා ගන්ට තිබෙනව. කාර් වුණත් වැඩි මිළට තිබෙනව.

ගරු කථානායකතුමනි, මේ රජයේ ප්‍රතිපත්තිය දැන් මහජනයාට අවබෝධ වී තිබෙනව. අපි මහජනයාට කියා සිටියේ මේ ආණ්ඩුව ධනේශ්වර පන්තිය ආරක්ෂා කරන්ට හදාගත් ආණ්ඩුවක් බවයි. දැන් මහජනයා එය පිළිගෙන තිබෙනව. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව සෑම අවස්ථාවකදීම, අයවැය ලේඛන ඉදිරිපත් කිරීමේදීත්, වෙනත් බදු පැනවීමේදීත් ධනේශ්වර පන්තිය ආරක්ෂා වන අන්දමට ක්‍රියා කළ අතර දුප්පත් ජනතාවට පුළුවන් තරම් පහර ගැසූ බව ඔප්පු වී තිබෙනව. මෙවැනි විවාදවලදී, විශ්වාස භංග යෝජනාවලදී, අපි පරාජය වුණාට අද රටට ගිහින් බැලුවොත් තමුන්නාන්සේලාට පෙනෙයි, ජීවන වියදම ඉහළ යාම නිසා මොන තරම් භයානක තත්ත්වයක් රටේ පවතිනවාද කියා. මේ අන්දමට ජීවන වියදම නැඟීමට මූලික වශයෙන් හේතුවුණේ රුපියලේ අගය බාල්දු කිරීම බව තමුන්නාන්සේලා පිළිගන්ට ඕනෑ. තමුන්නාන්සේලා එසේ පිළිගන්න නිසා තමයි, මේ අන්දමට රජයේ හා පළාත් පාලන අංශයේ සේවකයින්ට රුපියල් කෝටි 6½ ක සහනයක් දෙන්ට යන්නෙ. එහෙත් මා මුලින් සඳහන් කළාක් මෙන් මාලු අල්ලන උදවිය වැනි අනිකුත් දුප්පත් ජනතාවට තමුන්නාන්සේලා සලසන්ට යන සහනය කුමක් දැයි මා දැන ගන්ට සතුටුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, මම මේ විවාද යේදී කථා කරන්ට අදහස් කරගෙන සිටියෙ නැහැ. එහෙත් අද අ. භා. 2 ට යටි යන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මේ ප්‍රශ්නය ගැන කථා කරන්ට බලාපොරොත්තුවෙන් සිටින බව දැනගන්ට ලැබුණා. ඒ සැම දෙනාටම මේ විවාදයට සහභාගි වෙන්ට ඉඩ ලබා දීම සංවිධායක වශයෙන් මගේ යුතුකමක්. විනාඩි 15 ක් පමණ මම කථා කරන්ට අදහස් කළේ දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාට (බර්නාඩ් සොයිසා මයා.) අවස්ථාව ලබා දීමේ අදහසින්. මීට වඩා මගේ කථාව දීර්ඝ කරන්නේ නැහැ. අ. භා. 2 න් පසුව පැයක් පමණ මේ විවාදය කරගෙන ගොස්, අනිකුත් විවාදයට භාජන නොවන හැම විෂයයක්ම වගේ විවාදයෙන් තොරව සම්මත කර ගන්ට අපි ආණ්ඩුවට සහයෝගය දෙන්ට අදහස් කරනව. ඊට පසුව කල් තැබීම ඉදිරිපත් කරයි කියා මා විශ්වාස කරනව.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
තමුන්නාන්සේ විනාඩි 25 ක් අරගෙන මට විනාඩි 5 ක් දෙන්න.

පූ. භා. 11.28

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பேர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ගරු කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමාගේ ඉල්ලීමට සහයෝගය දෙන්ට බැරි බව බොහොම කනගාටුවෙන් කියන්ට ඕනෑ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ සියයට 25 ක් පඩි වැඩි කළොත් මම ඒ විනාඩි 25 දෙනව.

ගරු කථානායකතුමනි, මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන පරිපූරක ඇස්තමේන්තුවට විරුද්ධ නිසා නොවෙයි අපි කථා කරන්නෙ. ඒ දෙන මුදලවත් දීම සඳහා අපේ සහයෝගය දෙන්න සූදානම්. නමුත් අද රටේ තිබෙන ඇත්ත තත්ත්වය ආණ්ඩුවට පැහැදිලි කරදීමට මෙම අවස්ථාව පාවිච්චි කරන්න මා අදහස් කරනවා. ගරු කථානායකතුමනි, අද ආණ්ඩුවෙන්ම නිකුත් කරන බඩු මිල වෙනස් වීම නිසා ඇති වෙන ජීවන අංකයේ වෙනස මේ කම්කරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර තිබෙන සඟරාවෙන් පෙනී යනවා. එහි සඳහන් කර තිබෙන පිළිවෙළ මේ විධියයි. 1966 ජීවන අංකය 112.3 යි. 1967 : 114.8 යි. ඊළඟට එය සීඝ්‍රයෙන් වැඩි වී ගොස් තිබෙනවා. 1968 ජනවාරි මාසයේ 119.2 යි. ගරු කථානායකතුමනි, 1964 අවුරුද්දේ ජීවන අංකය 112.2 යි තිබුණේ.

බඩු මිල අඩු කර ජීවන වියදම අඩු කරනවාය කියා පොරොන්දු දී බලය අත්පත් කර ගත් අයට සිදු වී තිබෙන තත්ත්වය තමයි ඒ. අවුරුදු 3 ක් ඇතුළත තමුන්ගේම ආණ්ඩුව විසින් නිකුත් කරන ලද ජීවන අංකයේ වෙනස් වීම අනුව එම කාලය ඇතුළත සියයට 7.3 කින් ජීවන අංකය වැඩි වී තිබෙනවා. මේ නිසා රටේ ජනතාවට කිය නොහැකි තරම් විශාල දුකක් ඇති වී තිබෙනවා. මේ ජීවන අංකය පිළිබඳව මගේ නම් කිසිම විශ්වාසයක් නැහැ. විලියම්ස් මහත්මයා අවුරුදු ගණනකට උඩදී සකස් කළ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල අංකය කියන මේ ජීවන අංකය ගැන එදත් අපි විරුද්ධ වුණා ; අදත් විරුද්ධ වෙනවා. ජීවන අංකය ගණන් බැලීම පිළිබඳව ඊට පසුව සංශෝධනයන් කිහිපයක් ඇති වුණ බවත් අපි දන්නවා. නමුත් ඒ සංශෝධනයන් අනුව වුණත්, ඇත්තටම නියම විධියට බඩු මිල වෙනස් වන ආකාරය මේ ජීවන අංකයෙන් පිළිබිඹු වන්නේ නැහැ. අපි දන්නවා ආණ්ඩුවේ වුවමනාවෙන්ම ආණ්ඩුව කල්පනාකාරීව හිතා මතා ජීවන අංකය ආණ්ඩුවට වුවමනා ආකාරයට වෙනස් කරන කාලයක් තිබුණ බව. විශේෂයෙන්ම එසේ සිදු වූයේ යුද්ධ කාලයේදියි. ඒ කාලයේදී ජනතාවගේ ජීවත් වීමට වුවමනා කරන භාණ්ඩ සැපයීමට භාර වී තිබුණේ සිවිල් ආරක්ෂක කොමසාරිස්තුමාටයි. සිවිල් ආරක්ෂක කොමසාරිස්තුමාට වුවමනා වුනා ආණ්ඩුවේ මුදල් තත්ත්වයත් ආරක්ෂා කර ගන්න. ඒ නිසා මොකද කළේ ? උදේ පාන්දර දුරකථනයෙන් කියන්නට ඕනෑ අද ජීවන අංකය කොපමණද කියා. ජීවන අංකය වැඩි වෙලාද නැද්ද කියා කියන්න ඕනෑ. කොහොමද මේ ජීවන අංකය ගණන් බලන්නේ ? කම්කරු දෙපාර්තමේන්තුවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

නිලධාරි මහත්වරුන් කඩයට යනවා. ගිහිල්ලා ගිනි පෙට්ටියක්, හාල් ටිකක් ගන්නවා. දැන් හාල් සේරුව නොමිළයේ දීමත් මෙයට ඇතුළත් වෙන්න ඕනෑ. බුලත් විටක්, සිගරැට් එකක්, සීනි ටිකක් මිලට ගන්නවා. මෙන්න මේවායේ මිල ගණන් අනුව එදා කඩයේ තිබුණ බඩුවල මිල අනුව ජීවන අංකය ගණන් බලනවා. ජීවන අංකය ගණන් බලන්නේ ඒ ආකාරයටයි. ආහාරවලට මෙපමණයි, අමු ද්‍රව්‍ය වශයෙන් ආහාර වලට මෙපමණයි, ඒවා පිසීමට මෙපමණයි, වස්ත්‍රාභරණවලට මෙපමණයි. ඔන්න ඔය විධියට ගණන් බැලීමෙන් තමයි මෙය සකස් කරන්නෙ. අපි මෙයින් එකක් පමණක් ගනිමු. අද තිබෙන ආහාර මිලේ හැටියට ජීවන අංකය කොහොමද ? 1967 ජනවාරි මාසයේදී ගණන් බැලූ උදවිය පෙන්වා දෙනවා, ආහාරවලින් පමණක් ජීවන අංකය 111 කට නැග තිබුණ බව. 1967 දෙසැම්බර් මාසෙ 120කට නැග තිබුණා. එතකොට ආහාර මිල නැග්ගේ සියයට 9කින්ද ? ගරු කම්කරු ඇමතිතුමා සිටියා නම් එතුමාගෙන් මෙයට පිළිතුරක් ලබාගන්න තිබුණා. මේක සම්පූර්ණ බොරුවක්. සියයට 9කින් නොවෙයි නැග්ගෙ. ගණන ඊට වැඩියි. ඊටත් වඩා සැලකිය යුතු කාරණය නම් ආහාර නොමැති වීමයි. සමහර තැනකින් ගත්තා නම්, ගත්තේ කළුකඩ ගණන් වලටයි. එහෙත් කම්කරු දෙපාතීමේන්තුවේ විමශීන පරීක්ෂක නිලධාරීන්ට මේ කාරණය සම්බන්ධව විශාල අමාරුවක් ඇති වෙනවා. එක පැත්තකින් ජීවන අංකය ගණන් බැලීමට කඩයට ගොස් ඇවිත්, මෙන්න මේ මිල ගණන්ය වෙළඳ පොළේ තිබෙන්නේ, කියා ගණන් දී අනික් පැත්තෙන් තමන්ගේ ගෙවල් වලට වුවමනා අඩුවැඩිය කළුකඩයට ගොස් කළුකඩ ගණන්වලට අරගෙන යනවා. ජීවන අංකය සඳහා එක අංකයක් දී වෙන අංකයකට තමන්ගේ බඩු ටික අරගෙන ගෙදර යාමටයි ඒ මහත්වරුන්ට සිද්ධ වන්නේ.

ගරු කථානායකතුමනි, අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා ඊයෙ පෙරේදා බෙහෙත් හේත් මිල පාලනය කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කළා. [illegible]

නිකුත් කරනවාත් සමගම එහි තිබූ මිල ගණන්වලට යම් යම් අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය දිස්පැන්සරිවලින් සොයා ගන්නට බැරි වුණා. මෙම පාලන මිල නියම කිරීම අනුව කලින් යම් යම් මිල ප්‍රමාණවලට තිබුණ යම් යම් බෙහෙත් ද්‍රව්‍ය වලට විශාල වශයෙන් අඩු මිලක් නියම කර තිබුණා. මා දන්නවා රෝග විෂබීජ නැසීම පිණිස පාවිච්චි කරන "සැව්ලොන්" නමැති බෙහෙත් වර්ගයේ මිල වශයෙන් කලින් ගැලුමක් සඳහා රුපියල් 100කට වැඩි මුදලක් ගෙවන්න සිදු වී තිබුණ බව. ලාංකික සමාගමක් හැටියට සංවිධානය වූ විදේශීය වෙළඳ සමාගමක් මගිනුයි ඒ බෙහෙත් ද්‍රව්‍ය අලෙවි කරන්නේ. එම ගැසට් නිවේදනය අනුව ඒ බෙහෙත් මිල රුපියල් 40 කට පමණ අඩු කර තිබුණා. එහෙත් ඒ මිලට "සැව්ලොන්" කොහෙන්ද ගන්න පුළුවන්, කියා ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මා අසන්න කැමතියි. කොයිම තැනකින්වත් ගන්න බැහැ. ගැලුමක් ගන්නවා නම් කලින් ගත් ගණනටමයි ගන්න සිද්ධ වෙන්නේ. ඒ කලදසාවම හිමි වූ තවත් බෙහෙත් වර්ග බොහෝමයක් තිබෙනවා.

හැබැයි මෙහෙදී මා එක් කාරණයක් නම් අනුමත කරනවා. එනම් වෛද්‍යවරයකුගේ නියමයක් නැතුව ගන්නට පුළුවන් ව තිබූ යම් යම් බෙහෙත් වර්ග වෛද්‍ය නියමයක් නැතුව ගන්නට බැරි විධියේ නියමයක් කර තිබීමයි. දැන් එවැනි බෙහෙත් වර්ග ගැනීම සඳහා වෛද්‍යවරයකුගේ නියමයක් අවශ්‍යයි. ඒක නම් මාත් අනුමත කරනවා. ඒ මන්ද ? අපේ රටේ රෝගාතුරව සිටින සමහර අය තමන් තමන්ටම වෙද මහතුන් වී සිටිනවා. සුදුසු බෙහෙතුත් නුසුදුසු බෙහෙතුත් කොයි දේත් ගන්නවා. එසේ ගන්න සමහර බෙහෙත් වර්ග තමන්ගේ ශරීරයට විෂ වන බෙහෙත් වර්ග වෙන්න පුළුවන්. ඒ බෙහෙත්වල ආදීනව නොදන්න නිසා තමන් තමන්ටම ප්‍රතිකාර කර ගන්නට යාමෙන් වෛද්‍යවරයකුගේ නියමය අවශ්‍ය වන නුසුදුසු බෙහෙත් වර්ග අරගෙන තමන්ගේ සෞඛ්‍ය තත්ත්වයට විශාල හානියක් කර ගැනීමේ තත්ත්වයක් තිබුණා. එනිසා එවැනි බෙහෙත් වර්ග වෛද්‍යවරයකුගේ නියමය අනුව පමණක් පාවිච්චි කරන්නට ඉඩ ලැබෙන සේ ඉදිරිපත් කර ඇති නියමයට මගේ සම්පූර්ණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුමැතිය මා දෙනවා. එහෙත් කථානායක තුමනි, මිල සීමා කරනවාය කියන එක නම් සම්පූර්ණ බොරුවක්.

මේ කාරණය මා විශෙෂයෙන් සඳහන් කෙළේ, ජීවන අංකය ගණන් බැලීම් පිළි වෙළ ගැන කරුණු පැහැදිලි කරන්නයි. ජීවන අංකය ගණන් බැලීම පිණිස ගැසට් නිවේදනවල සඳහන් මිල ගණන්වලට බඩු ගන්නට නම් කොහෙන්වත් පුළුවන් කමක් නැහැ. ගැසට් පත්‍රයෙන් නියම කර තිබෙන මිල ගණන් අනුවයි තමුන්නාන් සේලා ගණන් බලන්නේ. එහෙත් ගරු මුදල් ඇමතිතුමාටවත්, ගරු කම්කරු ඇමතිතුමාටවත් බැහැ, ඔය ගැසට් නිවේදන යේ සඳහන් මිල ගණන්වලට බඩු ගන්න. මා දන්නවා ගාලු පාරේ කොල්ලුපිටියේ පිහිටි එක්තරා සාප්පුවකින් බඩු ගැනීම පිණිස ගරු මුදල් ඇමතිතුමා යන බව. තමන්ගේ ගෙදර ගෘහ මූලිකයා වශයෙන් තමන්ගේ ගෙදර දොරට වුවමනා කරන යම් යම් බඩු භාණ්ඩ ගැනීමට එතුමා ඒ සාප්පුවට යන බව මා නිතරම වාගේ දැක තිබෙනවා. ඒ සාප්පුවේ බඩුවල මිල ගණන් මොනවාද කියා මා හොඳින් දන්නවා. එසේ නම් මුදල් ඇමතිතුමා බඩු ගැනීමේදී ඒ මිල ගණන්වලටයි එතැනින් බඩු ගන්නේ. ඒ මිල ඔය ගැසට් නිවේදනයේ මිල ගණන් නොවෙයි. ගැසට් පත්‍රයේ තිබෙන මිල ගණන්වලට වඩා වැඩියි. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමාටවත් බැහැ ගැසට් පත්‍රයේ මිල ගණන්වලට බඩු ගන්න. මේ අපේ මුදල් ඇමතිතුමාය, ඒ නිසා ගැසට් පත්‍රයේ ඇති මිල ගණන්වලට වත් විකුණන්න ඕනෑය කියා ඒ සාප්පු කාරයා කල්පනා කෙළේ නැහැ. ඒ කඩ සාප්පු අයිතිකාරයො ගරු ඇමති තුමාටවත් සැලකිල්ලක් දක්වා නැහැ. ඒ කියන මිලට ඒවායින්වත් ලබාගන්න බැහැ. එම නිසා මෙම ජීවන අංකය විශාල බොරුවක්.

ගරු කථානායකතුමනි, මා කියා ගෙන ආවෙ හිටපු සිවිල් ආරක්ෂක කොම සාරිස් තැන කොයි ආකාරයෙන්ද වැඩ කළේ කියන කාරණයයි. සාමාන්‍යයෙන් අප කෙනෙකුගෙන් සැප සනීප කොහො මද කියා අසන්නා වාගේ, උදේ පාන්ද රම සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා කම්කරු දෙපාර්තමේන්තුවට දුරකථන යෙන් කථා කර අහනවා, අද ජීවන අංකය කොහොමද කියා. එහෙත් කිය නවා, අපොයි අද නැගලා නොවැ. ඒ දවස් වල ජීවන අංකය සියයේ සිට තුන් සියය දක්වා නැගීමේ සිරිතක් තිබුණා. කොළඹ පාරිභෝගික මිල ගණන් බලන්නෙ අමුතු විධියකටයි. එම නිසා තුන් සියයකට කිව්වු වනවාය කී හැටියෙ අහනවා, මොනවාද මිල නැග තිබෙන්නෙ කියා. දෙහිවල මිල නැග තිබෙනවාය කීවාම ඒක මා බලාගන්නම් කියා සිවිල් ආරක් ෂක කොමසාරිස් තැන කියනවා. ඉන් පසු කරන්නෙ, කොළඹ අවට පළාත්වලට ලොරි හතරක් පහක් යවා, ආණ්ඩුවේ මුදල් යොදවා, ඕනෑම මිලකට දෙහි ලබා ගැනීමයි. ඒ දවස්වල සිවිල් සේවා කොම සාරිස්වරයාට අයත් කඩසාප්පු පහක් හයක් තිබුණා. එම ස්ථානවලට එසේ වැඩි මිල දී ලබාගන්නා ලද දෙහි යවනවා. දෙහි ගෙඩියක මිල ශත තුන නම් එතැන විකුණනවා ශතය ගණනෙ. ඉන් පසු කිය නවා, දෙහි මිල ශතය දක්වා පහත බැස තිබෙනවාය කියා. ඒ අනුවම ජීවන අංක යත් පහත බස්සනවා. ඇයි, දෙහි මිල බැස්සානේ. ටික වේලාවකින් ගෙනා දෙහි සියල්ලක්ම විකිණී අවසාන වෙනවා. කොහොම වුණත් ඔය අන්ද මටයි, යුද්ධ කාලයෙදි ජීවන අංකය පහත දැමීම සම්බන්ධයෙන් සිවිල් ආරක්ෂක කොමසාරිස්තැන කටයුතු කරගෙන ගියේ. මේ බොරුව ඒ කාලයේ දිගටම කරගෙන ගියා. එදත් ජීවන අංකයෙන් නියම තත්ත්වය පෙන්නුම් කළේ නැහැ. එසේ පෙන්නුම් කළා නම් කොම්පැනි කාරයින්ට පමණක් නොවෙයි, ආණ්ඩුව ටත් තම සේවකයින්ට ඒ අනුව වැටුප් වැඩි කරන්න සිද්ධ වෙනවා. ගරු මුදල් ඇමතිතුමා දන්නවා, මෙම ජීවන අංකය ආණ්ඩුවේ සේවකයින්ට නම් වලංගු වින්නෙ නැති බව. මන්ද? දැන් අවුරුදු ගණනාවක සිට ජීවන අංකයේ වැඩි වීම නතර කර තිබෙනවා. අංකය—ෆේප්‍රාසන්—එහෙමමයි. නමුත් ජීවන වියදම නම් දවසින් දවස ඉහළ නගිනවා.

ගරු කථානායකතුමනි, ඔය අන්දමට අමාරුවට පත් වූ අපේ රජයේ සේවක යින්ට ගරු මුදල් ඇමතිතුමා රුපියල් දහයක් පහළොවක් දී තෘප්තිමත් කරන්න බලාපොරොත්තු වෙනවා. අද රට මුහුණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

පා ඇති තත්ත්වය සම්බන්ධයෙන් හබරාදුව මන්ත්‍රීතුමාත්, කොලොන්නාවෙ මන්ත්‍රීතුමාත් මට පෙර පැහැදිලි විස්තරයක් කළා. ඇත්ත වශයෙන් මේ රටේ ජනතාවගේ ඉල්ලීම් සම්බන්ධයෙන් මෙයට වඩා පුළුල් ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතුව තිබුණා. මේ රටේ වැඩ කරන ජනතාව විසින් කරන ලද ඉල්ලීම් වලට හේතුන් රාශියක් තිබුණා. එම හේතුන් ගැන මා පසුවට විස්තර කරන්නම්.

ගරු කථානායකතුමනි, වෘත්තීය සමිති කීපයක් එකතු වී ඒකාබද්ධ වෘත්තීය සමිති සමුළුවක් සාදගත් පසුව, ආණ්ඩුවෙනුත්, පෞද්ගලික අංශයෙනුත් ඉල්ලීම් ඉදිරිපත් කිරීම අද සිරිතක් වශයෙන් කරනවා. විශේෂයෙන්ම, ශ්‍රී ලංකා වෘත්තීය සමිති සම්මේලනය, ලංකා කම්කරු සම්මේලනය, ලංකා වෘත්තීය සමිති සම්මේලනය යන මෙම සමිති තුන ඒකාබද්ධ මණ්ඩලයක් වශයෙන් සාදාගෙන ඉල්ලීම් කීපයක් ගරු අගමැතිතුමාටත්, මුදල් ඇමතිතුමාටත් ඉදිරිපත් කළා. ඒ ඉල්ලීම් මොනවාදැයි තමුන්නාන්සේට නැවත වරක් මතක් කර දෙන්න කැමතියි: 1. උපයන මුළු ආදායම සියයට විස්සක දීමනාවකින් වැඩි කිරීම. 2. රුපියල් තිහකින් වැටුප් වැඩි වන අයුරු වැටුප් සංශෝධනයක් කිරීම. 3. කැපූ හාල් සේරුව ආපසු දීම. 4. වැඩි කළ පිටි, සීනි, තෙල් මිල පහත හෙලීම. 5. බස් හා දුම්රිය ගාස්තු වැඩි නොකිරීම.

මෙන්න මේ කාරණා 5 පිළිබඳව විශාල උද්ඝෝෂණයක් අද රජයේ සේවකයින් අතර ඇති වී තිබෙනවා. ඒ අතරතුර රජයේ ලිපිකරු සේවා සංගමය ගරු අගමැතිතුමා මුණ ගැසෙන්න ගියා. මොකක්ද ගරු අගමැතිතුමා කිව්වෙ? තමුන්නාන්සේලාගේ ඉල්ලීම් සාධාරණය කිව්වා. ප්‍රධාන ඉල්ලීම වැටුප් සම්බන්ධවයි. වෙනත් ඉල්ලීම් කීපයක් තිබුණා. ජනවාරි 8 වැනිදා සිද්ධිය සම්බන්ධයෙන් කළ දඬුවම් අස් කිරීම පිළිබඳ ඉල්ලීම් කීපයක් තිබුණා. ඒවා පසකින් තබමු. වැටුප් සම්බන්ධව කළ ඉල්ලීමට කීවෙ මොකක්ද? ආණ්ඩුවේ ලිපිකරුවකුට රුපියල් 120ක අඩුම මූලික වැටුපක් තිබිය යුතුය කියන එකයි, ඒ ඉල්ලීම. ඒ ඉල්ලීම පිළිබඳව ගරු මුදල් ඇමතිතුමා මුණගැසුණා; ගරු අගමැතිතුමා මුණගැසුණා. ඉල්ලීම සාධාරණ බව පිළිගත්තා. මේ වැටුප කොහේවත් නොගෙවන වැටුපක් නම්, ආණ්ඩුව පුදුමයට පත් වෙලා, අපොයි මේ ඉල්ලීම අසාධාරණය කියා ආණ්ඩුව කිව්වා නම්—අසාධාරණය කියා මා පිළිගන්නෙ නැහැ—ආණ්ඩුව කියන දේ අපට තේරුම් ගන්නට පුළුවන්. එහෙත් අද ඒ අඩුම මූලික වැටුප වෙනත් අංශවල ගෙවනවා.

ගරු කථානායකතුමනි, ලංකාවේ ස්වාමි සංගමය—කොම්පැනි හිමියන්ගේ සංගමය—ලංකා වෙළඳ සේවක සංගමයත් සමග ගිවිසුමක් අත්සන් කළා. ඒ පොදු ගිවිසුම අනුව අඩුම මූලික වැටුප වැඩි වී තිබෙන ප්‍රමාණය ගැන බැලූ විට, ඒ ප්‍රමාණයටවත් මෙතැන වැටුප් වැඩි වීමක් නැති බව පෙනෙනවා. රුපියල් 10න් 15 න් මේ තත්ත්වය වෙනස් වෙලත් නැහැ. අපේ රටේ හිටපු සිවිල් නිලධාරින්ට දොස් කියන්නට මා ලැස්ති නැහැ. ඒ අය අතරේ රජයට විශාල සේවයක් කළ, රටට විශාල සේවයක් කළ දක්ෂ මහත්වරුන් කීප දෙනෙක් සිටියා. එහෙත් ඒ සිවිල් නිලධාරීන්ගේ සේවය අහෝසි කරන අවස්ථාවේදී එදා තිබුණු ආණ්ඩුවේ බලාපොරොත්තුව වී තිබුණේ, රජයේ සේවයේ විශේෂ බමුණු කුලයක් තබා ගැනීම හොඳ නැති නිසා ඒ බමුණු කුලය ඉවත් කර පරිපාලන සේවයට මේ අය බඳවා ගැනීමයි. ඒ බලාපොරොත්තුව ඇතිව සිවිල් සේවය නතර කර පරිපාලන සේවය ඇති කළා. එහෙත් ඒ අවස්ථාවේදී පඩිනඩි සහ තත්ත්වය වෙනස් වීමේ ක්‍රම සම්පාදනය කිරීමේ කටයුත්ත භාර ගත් මහත්වරුන්ගේ යෝජනා අනුව නම්, රජයේ සේවයේ පහළ තරාතිරම්වල සිටින සේවකයන්ගේ පඩි නඩි පිළිබඳව කිසිම සැලකිල්ලක් දැක්වුණේ නැහැ. එහෙත් බමුණු කුලයට අයිතිව සිටි අය එක වරම බ්‍රහ්ම ලෝකයට ගියා. පඩි නඩි අතින්, විශේෂ ප්‍රයෝජන අතින්, බමුණු කුලයට අයිති අය බ්‍රහ්ම ලෝකයටම ගියා. සිදු වුණේ එයයි.

ගරු කථානායකතුමනි, මා මේවා කියන්නේ ආණ්ඩුවකට දොස් කීමක් වශයෙන් නොවෙයි. කොයි රටත් අද පාලනය කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල

නේ සිවිල් නිලධාරීන් විසින්. බලය තියෙන්නේ ඔවුන්ගේ අතෙයි. පරිපාලන සේවයේ සිටින අය අතෙයි, බලය තියෙන්නේ. ඒ නිසා මේ බලය පාවිච්චි කරමින් සිවිල් නිලධාරීන් අතලොස්සකට විශේෂයෙන් වාසි වූ නීති සකස් කරගෙන තමයි, සිවිල් සේවය අහෝසි කරන්නට ඉඩ දුන්නේ. මේ පිළිබඳව සංශෝධනයක් ඇති කරන්නට මුදල් ඇමතිවරුන් කීප දෙනකුම උත්සාහ කළා. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) මුදල් ඇමති වශයෙන් සිටින විටත්, යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමති වශයෙන් සිටින විටත්, මේ සම්බන්ධයෙන් උත්සාහයක් දැරුවා. එහෙත් ඒ උත්සාහය සාර්ථක වන්නට මත්තෙන්—පහළ තරාතිරම්වල අයගේ වැටුප් වැඩි කරන්නට මත්තෙන්—අද මුදල් ඇමති ධුරය දරණ ගරු මන්ත්‍රීතුමාගේ පක්ෂය විශාල වෑයමක් දරා එදා තිබුණු ආණ්ඩුව නැති කර දැම්මා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

මහජනයා, මහජනයා. අපි මොකද කරන්නෙ ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்சா)*
(Mr. Bernard Soysa)

ඒ නිසා දැන් ඒ වගකීම භාර ගත්තේ ගරු මුදල් ඇමතිතුමා. එතැනින් එහාට මේ ප්‍රශ්නය ගෙන යන්නට ඕනෑ. අවුරුදු තුනක් මේ වැඩේ කර තිබෙනවා. මොකක්ද එහි ප්‍රතිඵලය ? සාක්කුවට අත දමා—රජයේ සේවකයන්ගේ සාක්කුවට අත දමා—රුපියල් තිහ හතළිහකට වැඩි ප්‍රමාණයක් වන මුදලක් එක් අතකින් අරන්, "මෙන්න මම උඹලට හොඳ තෑග්ගක් දෙනවා" කියමින් තෑග්ගක් හැටියට විස්තර කරමින් අනික් අතින් රුපියල් දහයක් නැත්නම් පහළොවක් විශේෂ දීමනාවක් හැටියට දෙන්නටයි ආණ්ඩුව සැරසෙන්නේ. සාක්කුවට අත දාලා රුපියල් හතළිහක් පණහක් ගන්නවා. විශාල දීමනාවක්ය කියලා රුපියල් දහයක්, පහළොවක් දෙනවා. එයිනුත් නවතින්නේ නැහැ. රජයේ සේවකයාට විශාල යහපතක් කර තිබෙන වාය කියමින් ඒ වෙනුවෙන් අපට කෘතඥ වන්නැයි මහ හඬින් කියනවා. හොරකම් වශයෙන් හඳුන්වන්නට පුළුවන් විධියට ගත් වැඩි මුදලක් වෙනුවට ප්‍රසිද්ධියේ තෑග්ගක් දෙන්නා වාගේ රුපියල් දහයක් පහළොවක් දීලා තමයි එහෙම කියන්නේ. කළගුණ සැලකීමක් වශයෙන් වැඩ වර්ජන වැනි දේවල් නොකර ඉන්න ලෙසත් කියනවා. ස්ට්‍රයික් එහෙම කරන්නට එපා කියනවා. එහෙම කළොත් වැරදියි. කළගුණ සැලකීමට විරුද්ධ දෙයක් කළා වෙනවා ස්ට්‍රයික් එහෙම කළොත්. අවුරුදු තුනකට පස්සේ අද වැටී තිබෙන්නේ මේ තත්ත්වයටයි, කථානායකතුමනි.

මා ළඟ ලේඛනයක් තිබෙනවා. තමුන්නාන්සේටත් එයින් පිටපතක් ලැබෙන්නට ඇතැයි මා කල්පනා කරනවා. රජයේ සේවකයන්ට ලැබෙන පඩි නඩි සහ වෙනත් අංශවල සිටින අයට ලැබෙන පඩි නඩි ආදිය එහි විග්‍රහ කර තිබෙනවා. රජයේ ලිපිකාර සේවා සංගමය අනෙක් අයගේ පඩි සම්බන්ධයෙන් ඊර්ෂ්‍යා කරනවා නොවෙයි. තමුන්ට ලැබෙන පඩිය අඩු නිසා ඒ වාගේම අනෙක් අයගේත් පඩි අඩු කරන්නැයි කියනවා නොවෙයි. ඒ අය, යටත් පිරිසෙයින් මේ කරුණු ගැන සලකා බලා අපේ පඩියත් වැඩි කරන්නැයි කියනවා පමණයි. ගරු මුදල් ඇමතිතුමා හොඳාකාර දන්නවා කිසිම විධියකින් ඔබින තත්ත්වයක් නොවන බව, රුපියල් අසූවක මූලික වැටුපකින් සාමාන්‍ය පෙළේ ලිපිකරුවකුගේ තත්ත්වයේ කෙනකුට මාසයක් ජීවත්වීමට සැලැස්සීම. රුපියල් අසූවේ මූලික වැටුපකින් කෙනකුට ජීවත් වන්නට බැරි බව ඔබතුමා දන්නවා. අද තත්ත්වයේ හැටියට කෙසේ වෙතත් මීට අවුරුදු තිහකට හතළිහකට ඉහත දී තිබුණු තත්ත්වයටවත් ඒ මූලික වේතන ප්‍රමාණය ගැලපෙන්නේ නැහැ.

මා පාසල් යන කාලයේදී සිදු වූ දෙයක් මට අද වනතුරු හොඳට මතකයි. මම එය ලුහුඬින් කියන්නම්. මට වඩා ඉහළ පන්තියක ඉගෙනීම ලබමින් සිටි කෙනෙක්—ඔහු මගේ පංතියට පන්ති කීපයක් ඉහළින් සිටියේ—හිටි හැටියේම වාගේ අස් වී ගියා. ඔහු රජයේ රක්ෂාවක් ලැබී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ගිය බවක් අපට දැනගන්නට ලැබුණා. ඒ ආරංචිය ලැබී ටික දවසකට පස්සේ මාත් මගේ මිත්‍රයෙකුත් කොටුවේ දුම්රිය ස්ථානයට ගියා. එහිදී මටත් මගේ මිත්‍රයාටත් මා මුලින් සඳහන් කළ ශිෂ්‍යයා—එවකට අපේ පාසලින් අස් වී සිටි නැනැත්තා—මුණ ගැසුනා. මේ ශිෂ්‍යයාත් අපේ හොඳ මිත්‍රයකු හැටියටයි පාසල් යන කාලයේ සිටියේ. ඔහු පාසලින් අස් වූ පසු අපට මුණගැසුණු පළමුවන වතාවයි ඒ. පාසලින් අස්වී වැඩි දවසක් ගත වී තිබුණේත් නැහැ. ඔහු අප ගැන වැඩි සැලකිල්ලක් දක්වූයේ නැහැ. ඔහුගේ හැසිරීමේ වෙනස ගැන මා සමග ගිය මිත්‍රයා වාගේම මාත් පුදුම වුණා. මොකද කියලා ඇහුවාම මගේ මිත්‍රයා කියනවා, "ඔහුට දැන් ඉහළ රක්ෂාවක් ලැබී තිබෙනවා නොවැ" කියා. පාසලින් අස් වූවාට පස්සේ ඒ තරම් අහංකාර වන්නට හේතුව ඉහළ රක්ෂාවක් ලැබීමය කිව්වා. ඉහළ රක්ෂාව මොකක්දැයි ඇහුවාම ආණ්ඩුවේ රක්ෂාවක් කිව්වා. මොකක්ද රක්ෂාව : රජයේ ලිපිකරු. පඩිය රුපියල් අසූවක් වාගේ හම්බ වෙනවාය කිව්වා. ඒ නිසා අහංකාරයි කිව්වා. මේ විධියේ තත්ත්වයක් ඇති වන්නට ඉඩක් තිබුණු කාලය මීට අවුරුදු හතළිහකට පණහකට පෙර මිස දැන් නොවෙයි. අද රුපියල් අසූවකින් , සාමාන්‍යයෙන් ඉතාමත් දිළිඳු තත්ත්වයක කෙනකුටවත් පවුලක් නඩත්තු කරන්නට බැහැ. අතිරේක දීමනාවල් නම් ලැබෙනවා තමයි. නොයෙක් නම්වලින් හැඳින්වෙන අතිරේක දීමනාවල් තිබෙනවා. ඒක නැතැයි කියන්නේ නැහැ. රුපියල් 17.50 දීමනාව ලැබෙනවා. හාල් සේරුව කැපුවාට පස්සේ දෙන්නට පටන් ගත් අතිරේක දීමනාවත් ලැබෙනවා. රුපියලේ අගය අඩු කළාට පස්සේ දෙන්නට පටන් ගත් එකත් ලැබෙනවා. ඔය මොන මොන දීමනා ලැබුණත් රුපියල් අසූවේ මූලික වැටුප් ලැබෙන ලිපිකරු, යතුරු ලිපිකරු වැනි අයට ඒ මුදලින් යැපෙන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ අය රුපියල් 120ක මූලික වැටුපක් දෙන ලෙස ඉල්ලා සිටියා. එවැනි මූලික වැටුපකින් පටන් ගන්නේ නැත්නම් අද තිබෙන තත්ත්වයේ හැටියට, දරිද්‍රතාවයේ හැටියට, කොයිම විධියකින්වත් ජීවත් වන්නට පුළුවන්කමක් නැහැ.

කථානායකතුමනි, මේ ප්‍රශ්නය ගැන නම් තව කරුණු රාශියක් කියන්නට තිබෙනවා. එම නිසා, මේ යෝජනාව කල් තබනවා නම් අපේ විරුද්ධත්වයක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
කල් දැම්මොත් ගෙවන්නට බැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ඇයි, ගෙවන්න බැරි ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
රුපියල් කෝටි 6½ක් ඕනෑ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ගෙවන්න පුළුවනි. තමුන්නාන්සේලා සමහර පරිපූරක ඇස්තමේන්තු මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ, මුදල් ගෙවා අවුරුදු ගණන් ගියාට පසුවයි. එම නිසා, මේ ගැන විශේෂ භයක් ඇති කර ගන්නට ඕනෑ නැහැ. තමුන්නාන්සේලාට තිබෙන අමාරුව මේ මුදල් ගෙවීම පිළිබඳව අවසරය ලබා ගැනීම නොවෙයි. ඊළඟ අවුරුද්දේ මේ සඳහා මුදල් හොයා ගන්නා එකයි, ඊට වඩා ලොකු අමාරුව. තමුන්නාන්සේලා පුළුවන් තරම් හැම පැත්තෙන්ම සූරාගෙන, මහ බැංකුවේ ගනුදෙනු ටික බේරන්නට ගෙන යනවා. එතැනින් භාණ්ඩාගාරයට අරගෙන එනවා. පෞද්ගලික අංශයේ බැංකුවල තැන්පත් කර තිබෙන නෝට්ටු ටික එසේ භාණ්ඩාගාරයට ගෙනැවිත් තමයි, අද සේවකයන්ගේ පඩිනඩි පවා බේරන්නේ. තමුන්නාන්සේලාට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ එවැනි තත්ත්වයකටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ නිසා නොවෙයිද, භාණ්ඩාගාරයේ බිල් පත් නිකුත් කිරීමේ සීමාව ඉහළ නංවන්න ට යෝජනා ගෙනෙන්නේ ? "අප මෙයට විරුද්ධයි ; මේවාට කිසිසේත් ඉඩ දෙන්න හොඳ නැහැ ; එයින් උද්ධමනයක් පටන් ගන්නවා" යනුවෙන් ඒ කාලයේ දොස් කී වර්තමාන මුදල් ඇමතිතුමාම, භාණ්ඩාගාරයේ බිල්පත් නිකුත් කිරීමේ සීමාව තවත් ඉහළ නංවන්නට ඊයේ පෙරේදා යෝජනාවක් ගෙනාවා. හැබැයි, ඒ වැඩය කළාට අළුතින් නෝට්ටු අච්චු ගැහුවේ නම් නැහැ. ඒ මුදල් හොයා ගන්නේ කොහෙන් ද ? පෞද්ගලික අංශයේ බැංකුවල තිබෙන මුදල් ටික අරගෙන පාවිච්චි කරනවා. මේ ආණ්ඩුවට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ උභතෝකෝටික ප්‍රශ්නයකටයි. මේවා දීලත් බෑ ; නොදීත් බෑ. හාල් සේරුවේ මිළ වැඩි කළේ, එහෙම නැත්නම් එතෙක් දුන් සලාකය අඩු කිරීමෙන් එතෙක් මහ ජනතාවට ලැබුණු සහනයක් අඩු කළේ ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේත් පාලනය ගෙන යන අයගේ අවවාද උඩයි. රුපියලේ අගය හෙළුවේත්, ඒ අයගේ උපදෙස් පිටයි.

ඔවුන් මේ උපදෙස් දුන්නේ මොන හේතුවක් නිසාද ? "අපේ සමාජයේ හුවමාරුවේ යෙදෙන මුදල් ප්‍රමාණය වැඩියි" ඒ මතය මගේ නොවෙයි, ඒ අයගේයි. "ඒ නිසා මෙය අඩු කරන්නට ඕනෑ ; මිළ බස්සන්නට ඕනෑ ; අපේ සමාජයේ අර්ථ සංරක්ෂණය තුළ තිබෙන, උද්ධමනය කරා ගෙන යන බලවේගයන් නතර කරන්නට ඕනෑ ; ඒ නිසා ණය දීමේ පහසුකම් නැති කරන්නට ඕනෑ ; වැටුප් වැඩි කිරීම් අත්හිටුවන්නට ඕනෑ ; හාල් සලාකය කපන්න ට ඕනෑ ; සමාජ සේවාවන් අඩු කරන්නට ඕනෑ ; රුපියලේ අගය පහත හෙළන්නට ඕනෑ." මේවා තමයි, ඒ අයගේ උපදෙස්. අගමැතිතුමා පුරසාරම් දොඩනවා, "අපට මෙහෙම කරන්න උපදෙස් ලැබුණා, ඒ අනුව කළා" කියා. ඕනෑ නම් හැන්සාඩ් වාර්තාවෙන් ඒ බව පෙන්වා දෙන්නම්. එක අතකින් ඒ විධියට පුරසාරම් දොඩමින් එසේ කටයුතු කරන අතර අනෙක් පැත්තෙන් "මෙන්න රුපියල් 10 ක්, මෙන්න රුපියල් 15 ක්" යනුවෙන් රජයේ සේවකයන්ට දීමනා දෙනවා, අරක මැකෙන්න. එවිට මේ උද්ධමනය පිරිමැහෙනවාද ? ලෝක බැංකුව කියන නිසා එක පැත්තකින් උදුරා ගන්නවා. ලෝක බැංකුවට හොරා අනෙක් පැත්තෙන් කීයක් හෝ වේවා ඊට අඩු ගණනක් දෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ලෝක බැංකුව කියන හැම දේම අප කරන්නේ නැහැ නොවැ ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒක නොවෙන්නම් මා කිවේ, උභතෝකෝටික ප්‍රශ්නයක් තිබෙනවාය කියා. දීලත් බෑ, නොදීත් බෑ. එම නිසා කොහොම ද, එයින් බේරෙන්නේ ? ඒ නිසා තමයි, ලෝක බැංකුව කියන හැටියටම හැසිරෙන්නේ නැත්තේ. "ලෝක බැංකුව කියන නිසා රුපියල් 50 ක් විතර තමුන්නාන්සේලාගෙන් උදුරා ගන්නම්, අපේ ඇඟ බේරා ගන්නට ඕනෑ නිසා ; මහජනයාගේ කෝපයෙන් මිදෙන්නට ඕනෑ නිසා, ලෝක බැංකුවේ නියමයන්ට පිටින් තාවකාලික පිළියමක් වශයෙන් රුපියල් 25 ක් විතර ආපසු දෙන්නම්." රජයේ ක්‍රියා පිළිවෙළ මෙය නොවෙයිද ? මහදැනමුත්තාගේ කථාව කියෙව්වොත් මේ විධියේ විකාර වැඩ දැක ගන්නට පුළුවන් වෙයි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ගෝලයෝ ?

**බර්නාඩ් සොයිසා මයා**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

අපට වඩා හොඳට ඒ කථාව මුදල් ඇමතිතුමා දන්නා නිසා මා ඒ කථාව කියන්නට ඕනෑ නෑ. අපේ ගරු මුදල් ඇමතිතුමාත් මුදල් පරිහරණය සම්බන්ධව වැටී සිටින්නේ අන්න ඒ මහදැනමුත්තාගේ වැඩ පිළිවෙළ අනුගමනය කරන තත්ත්වයටයි.

ගරු කථානායකතුමනි, මා විශේෂයෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. තමුන්නාන්සේලා කළ මේ දේවලින් බඩු මිල ඉහළ යෑම සම්බන්ධව තමුන්නාන්සේලාට බැරි වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

තිබෙනවා. එය හසුරුවන්නට, පාලනය කරන්නට නැත්නම් සීමා කරන්නට කරන හැම දේකින්ම ප්‍රශ්නය තව තවත් අවුල් වෙනවා. ඒ නිසා අප කියා සිටින්නේ වෘත්තීය සමිති අංශයෙන් ඉල්ලා ඇති ඉල්ලීම් දෙන්නය කියන එකයි. එය කරන්නට බැරි නම් ඔය පුටුවල වාඩි වී තවදුරටත් පාලනය ගෙන යන්නට තමුන්නාන්සේලාට අයිතියක් නැහැ. එය පිළිගැනීමට සිදු වී තිබෙනවා. යටත්පිරිසෙයින් මේවා නො දී සිටිනවා නම් රට හරිගස්සන්නවත් යුතුකමක් තිබෙනවා. ඒ හැදීම අනුව අපේ අර්ථ සංරක්ෂණයට නියම පණක් දීම අනුව, නියම සංවර්ධනයක් ඇතිකිරීම අනුව, වෙනත් මාර්ගවලින් සහනයක් දෙන්නට පුළුවන්කමක් තිබුණා නම් මේ ඉල්ලීම් නුදුන්නත් සමාවක් දෙන්නට තිබුණා. එයත් කරන්නට බැහැ. එක් පැත්තකින් සංවර්ධනයක් නැහැ; අනික් පැත්තෙන් දුන් දීමනාත් උදුරාගෙන තිබෙනවා; තවත් පැත්තකින් ඉල්ලන දේවල් දෙන්නෙත් නැහැ. මේ තත්ත්වය අනුව රට පාලනය කිරීමට තමුන්නාන්සේලාට අයිතියක් නැති බවත් මේ පරිපූරක ඇස්තමේන්තුවට අපේ ඡන්දය දෙන බවත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Sitting is suspended till 2 P.M. On resumption the Hon. Deputy Speaker will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [එම්. සිවසිතම්පරම් මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*இதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சபாநாயகர் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்.*

*Sitting accordingly suspended till 2 P.M. and then resumed,* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *in the Chair.*

අ. භා. 2

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි යමක් කියන්නට බලාපොරොත්තු වන්නේ මුදල් ඇමතිතුමාගේ කාලය කාබාසිනියා කර දැමීමේ අදහසින් නො වෙයි, කිව යුතුම කරුණු කීපයක් කිය යුතු නිසයි. මේ වැය ශීර්ෂය ගැන කල්පනා කරන විට අපට පෙනී යනවා මේ සඳහා රුපියල් 6,50,00,000 ක් පමණ මහා භාණ්ඩාගාරයෙන් වැය වෙන බව. මහා භාණ්ඩාගාරයට අඩු වන ඒ රුපියල් 6,50,00,000 න් ඒ මුදල බෙදී යන අයට නියම ප්‍රයෝජනයක් ලබෙනවාද කියන එක මට නම් සැක සහිතයි. රුපියල් 6,50,00,000 ක් භාණ්ඩාගාරයට අඩු වුණත් එය ලබන අයට ඒ තරම් ප්‍රයෝජනයක් නැත කියා මා හිතනවා. ඒ අතරම මේ කරුණ නිසාම එය ලබන අයටත් නො ලබන අයටත් විශාල බරකට මුහුණ දෙන්නට සිදු වෙනවා. එක දවසක් බස් රියකදී මට ඇහුණා මේ මුදල ලබන රජයේ ලිපිකරු සේවයේ සිටින මහත්මයෙක්ම අහනවා, දවසකට ශත 30 ක් දී ප්‍රශ්නය විසඳන්නද හදන්නේ කියා. ඔහුගේ කථාවෙන් ප්‍රකාශ වුණේ ඒ අදහසයි. ගරු මුදල් ඇමතිතුමා නැත්නම් රජය වැටුප් ලබන අයට යම් උපකාරයක් නැත්නම් ආධාරයක් කිරීමේ හොඳ අදහසින් මෙය කරනවා වෙන්න පුළුවන්. ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද විස්තර පත්‍රිකාවේ සඳහන් වන අන්දමට මෙම හය කෝටි පණස් ලක්ෂයේ මුදල කොටස් පහක් අතරේ බෙදා හරින්නට බලාපොරොත්තු වෙනවා. රජයේ සේවකයන්, පළාත් පාලන සේවකයන්, රජයේ විශ්‍රාමිකයන්, පළාත් පාලන සේවයේ විශ්‍රාමිකයන් හා වැන්දඹු හා අනන්දරු විශ්‍රාමික පඩි ලබන්නන් යනු ඒ කොටස් පහයි. මේ කොටස් පහට පමණක් මේ මුදල් ලැබුනත් මෙය පොදුවේ මුළු රටටම බරපතළ අන්දමින් බලපාන ප්‍රශ්නයක් බව පෙන්නුම් කර දෙන්නට සිදු වී තිබෙනවා. රටක මහජනයා අතර වැය වීමට තිබෙන මුදලේ **වටිනාකම බැස ගියහොත් එයින් සිදු** වන්නේ භාණ්ඩවල මිළ වැඩි වීමයි. භාණ්ඩවල වටිනාකම වැඩි වුණා යයි කිව හොත් එහි තේරුම මුදලේ අගය අඩු වීමයි. රුපියලේ අගය අඩු කිරීම අසතුටුදායක බව එදා ඒ පිළිබඳව පැවති විවාදයේදී විරුද්ධ පාර්ශ්වය විසින් පෙන්වා දෙන්නට යෙදුණා. රජයක් මුදල් නීති රීති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංශෝධනය කරන අවස්ථාවේදී මුලින්ම කල්පනා කර බැලිය යුත්තේ එයින් වැසියාගේ එදිනෙදා ජීවිතයේ කටයුතු පහසු කිරීමයි. ඒ වාගේම වැසියාගේ ඉදිරි ජීවිත පහසුවෙන් ගෙන යෑමට ක්‍රමයක් සකස් කර දීම ඊළඟට කල්පනා කර බැලිය යුතුයි. එහෙත් මෙම ආණ්ඩුව විසින් ගන්නා ලද පියවර උඩ ඔය කාරණා දෙකෙන් එකක්වත් ඉෂ්ට වී තිබෙන බවක් අපට නම් පෙනෙන්න නැහැ. මේ රටට ප්‍රයෝජනවත් වන නිසා රුපියලේ අගය අඩු කිරීමට තීරණය කරන ලද බව එදා ගරු අගමැතිතුමා හා ගරු මුදල් ඇමතිතුමා ඇතුළු ආණ්ඩුවේ වගකිවයුතු අය ප්‍රකාශ කළා. හොඳයි, රුපියලේ අගය අඩු කළ දිනේ සිට මේ දක්වා කාගේ ජීවිතවලට පහසුවක්, ලේසියක් සැලසී තිබේදැයි ගරු අගමැතිතුමාට හෝ ගරු මුදල් ඇමතිතුමාට හෝ රජයේ වෙනත් වගකිවයුත්තන්ට හෝ හිතට එකඟව කියන්නට පුළුවන්ද ? ශ්‍රිතාන්‍යය රන් පවුමේ වටිනාකම අඩු කළ අවස්ථාවේදී අප රුපියලේ අගය අඩු කිරීම නිසා කුමන අංශයකට උදව්වක්, උපකාරයක් සැලසී තිබෙනවාදැයි කියන්නට පුළුවන්ද ? අසවල් අංශයට ලේසියක්, පහසුවක්, වාසියක් සැලසී තිබෙනවා යයි ඔප්පු කරන්නට පුළුවන් නම් රුපියලේ අගය අඩු කිරීම සාධාරණ යයි කියන්නට අපට පුළුවනි. එහෙත් පසුගිය නොවැම්බර් මාසයේ සිට ගත වී ඇති පස් මාසය තුළ දවසින් දවසම අපහසුකම් වැඩි වුණා මිස අඩු වුනේ නැහැ. මීට දවස් දෙකකට පෙර තිබුණු ආර්ථික ආබාධයන්ට වඩා බරපතළ ආබාධයන් අද තිබෙනවා. ඒ වාගේම අද තිබෙන තත්ත්වය නොවෙයි, හෙට තිබෙන්නේ. හෙට තිබෙන තත්ත්වය නොවෙයි, අනිද්දා තිබෙන්නේ. දෝෂය ඇත්තේ මෙතැනයි. මෙසේ වන්නේ අපේ ආර්ථික සැලැස්මේ ඇති වරද නිසයි. ඇත්තෙන්ම බ්‍රිතාන්‍යය රන් පවුමේ වටිනාකම අඩු කළ අවස්ථාවේදී අප රුපියලේ වටිනාකම අඩු නොකර සිටියා නම් දැනට වඩා පහසු තත්ත්වයක් මේ රටට ඇති වන්නට ඉඩ තිබුණා. එහෙම නම් අදට වඩා පහසු අන්දමින් අපේ ජීවිත ගෙන යන්නට පුළුවන් විය හැකිව තිබුණා. මේ කාරණය අප පැහැදිලිව තේරුම් ගත යුතුයි. රුපියලේ වටිනාකම අඩු කිරීම සඳහා මුදල් පනතට සංශෝධනයක් ඉදිරිපත් කළ අවස්ථාවේදීම මේ අද සාකච්ඡා වන යෝජනාව කළා නම් මෙතෙක් ඇති වී තිබෙන තත්ත්වය ගැන සමාලෝචනයක් කරන්නට අපට අවස්ථාව ලැබෙන්නේ නැහැ. රුපියලේ වටිනාකම අඩු කිරීමේ ප්‍රතිඵල වශයෙන් අතිරේකව වියදම් කරන්නට සිදු වී ඇති මෙම මුදල පිළිබඳ යෝජනාව මාස පහකට පසුව ඉදිරිපත් කිරීම ගැන ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. දැන් මාස පහකට පසුව එදා කළ ක්‍රියාවේ හොඳ නරක සොයා බලන්නට අපට අවස්ථාව ලැබී තිබෙනවා. රුපියලේ වටිනාකම අඩු කිරීම නිසා මේ රටේ ජන ජීවිතවලට මේ මේ අන්දමේ පහසුකම් ලැබී තිබෙනවා, මේ මේ නිෂ්පාදන කටයුතු වැඩි දියුණු වී තිබෙනවා, අපේ විදේශ වත්කම් මේ මේ තරමින් වැඩි වී තිබෙනවා යනාදී මේ කාරණා ගැන පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කරන්නට ගරු මුදල් ඇමතිතුමාට පුළුවන්ද? ගරු මුදල් ඇමතිතුමා තම පිළිතුරු කථාවේදී මේ කාරණා සම්බන්ධයෙන් පැහැදිලි තොරතුරු ඉදිරිපත් කරනවා නම් එය අප කාටත් ප්‍රයෝජනවත් වන්නට පුළුවනි. පසුගිය මාසයේ රුපියල් එක් කෝටි පණස් ලක්ෂයක විදේශ විනිමය හිඟයක් තිබුණු බව පුවත්පත්වලින් අපට කියවන්නට ලැබුණා. එහෙනම් ඇත්තෙන්ම රුපියලේ අගය අඩු කිරීම නිසා අපේ ආර්ථික තත්ත්වය තව දුරටත් පිරිහී ඇති බව, අපේ අවහිරතා වැඩිවී ඇති බව පිළිගන්නට ගරු මුදල් ඇමතිතුමාට සිදු වෙනවා නේද ? රුපියලේ අගය අඩු කිරීම නිසා මෙහි සඳහන් වන වැටුප් ලබන කොටස් පහට කරදර වුණු හෙයින් ඒ උදවියට යම්කිසි උපකාරයක් කරන්නට ඕනෑය යන්න රජය විසින් පිළිගනු ලැබූ දෙයක්. ගරු අගමැතිතුමා එය පිළිගත් අවස්ථාවේදීම කිව්වා, රුපියලේ අගය අඩු කිරීම හේතුකොටගෙන සමහර ධනපති කොටස්වලට වාසියක් අත් වී තිබෙන එක ඇත්තයි කියා. එසේම එතුමා කිව්වා, ධනපති කොටස්වලට යම්කිසි අන්දමක බලාපොරොත්තු රහිත ලාභයක් ලබා ගැනීමටත් මෙම කායඹීය උපකාරී වන එක ඇත්තයි කියා. එසේ ලාභ ලබන ධනේශ්වර අතලොස්සක් දෙනාගෙන් වෙන්නට පුළුවනි, යම් කොටසක් අරගෙන ඒ කොටස් දුප්පතා අතරේ බෙදා දෙනවාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

කියා එතුමා කිව්වා. 6 කෝටි 50 ලක්ෂයක මුදලක් රුපියල් 10, 15 බැගින් අමතර දීමනා වශයෙන් බෙදා දෙනවා, එම වැඩ පිළිවෙළ අනුව. පොදු මහජනතාවගේ යහපත පිණිස වැඩියෙන් මුදල් ලබා ගෙන බෙදා දේවිය කියා අප බලාපොරොත්තු වුණා.

යම් යම් භාණ්වල මිල වැඩි කිරීම නිසා භාණ්ඩාගාරයට මෙතරම් මුදලක් වැඩිපුර ලැබෙනවාය කියා අප පෙන්වා දුන්නා. ඒ අනුව ජනසතු සේවා ඇමතිතුමා පෙට්‍රල් මිල වැඩි කළ නිසා කොතරම් වැඩි මුදල් ප්‍රමාණයක් භාණ්ඩාගාරයට ලැබුණාදැයි මා අහනවා. [බාධා කිරීමක්] තෙල් මිල වැඩි වෙලා නැද්ද? ඒ හේතු කොටගෙන කොතරම් ආදායමක් භාණ්ඩාගාරයට ලැබෙනවාද? [බාධා කිරීමක්] දැන් කොච්චර කල් ගියාද? තවම ගණන් බැලුවේ නැද්ද? ඒ ගැන නොකියා මන්ත්‍රී මණ්ඩලයට ඇවිත් කියනවා, රුපියල් 6 කෝටි 50 ලක්ෂයක මුදලක් වෙන් කර දෙන්නය කියා. හොඳයි, තෙල් මිල වැඩි කිරීම හේතුකොටගෙන මෙච්චර මුදලක් ලැබුණාය කියන්නට බැරි නම්, මෙම ඉල්ලීම අයුක්ති සහගත නේද? සීනි මිල වැඩි කිරීමෙන් කොපමණ මුදලක් භාණ්ඩාගාරයට ලැබෙනවාද? ඒවා ගැන අසා දැනගන්නට අපට අයිතියක් නැද්ද?

අගමැතිතුමා එදා කිව්වා, "අපි මෙච්චර මුදලක් දෙන්නට ලෑස්තියි; අපි ධනපතියන්ගෙන් මුදල් එකතු කරගෙන දුප්පතුන් අතරේ බෙදා දෙනවා" කියා. එහෙත් දුප්පතාගෙනුත් අපි මෙච්චර මුදලක් අරගන්නවාය කිව්වෙ නැත්තේ ඇයි? මුදල් ඇමතිතුමා සිටින නිසා එතුමා මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු දෙනු ඇතැයි එදා සිතුවා. එහෙත් එතුමා ඒ ගැන කිව්වෙ නැහැ. [බාධා කිරීමක්] යම් යම් ද්‍රව්‍යවල මිල වැඩි කිරීමෙන් මෙන්න මෙච්චර වැඩිපුර මුදලක් භාණ්ඩාගාරයට ලැබෙනවාය කියා පෙන්නුම් කර දෙනවා නම් අපි ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. යම් යම් ද්‍රව්‍යවල මිල වැඩි කිරීම හේතු කොටගෙන මෙතරම් වැඩි ආදායමක් භාණ්ඩාගාරයට ලැබෙනවායැයි ප්‍රකාශ කළොත්, එය අප කාටත් විශාල උපකාරයක් වෙනවා ඇතැයි මා විශ්වාස කරනවා.



මේ රුපියල් 10, 15 වැඩි කිරීම නිසා පොදු ජනතාව කොතරම් අවහිරයකට මුහුණ දෙනවාද යන්න ගැන අප ටිකක් සොයා බලන්නට ඕනෑ. පඩි වැඩි කළාය යන රාවය රටේ පැතිර යනවාත් සමගම භාණ්ඩවල මිල වැඩි වීමකුත් වෙනවා. එක් කෙනකුට දවසකට ලැබෙන්නේ ශත 30 යි. එහෙත් භාණ්ඩවල මිල ඊට වඩා හුඟක් වැඩි වෙනවා. ඒ නිසා දුෂ්කරතාවලට මුහුණ පාන්නට ජනතාවට සිදු වෙනවා. භාණ්ඩවල මිලෙහි විශාල වැඩි වීමක් ඇති වෙනවා. එම නිසා ඔය ශත 30 නොලැබුණා නම් වඩා හොඳ බවයි මගේ අදහස. අපට වුවමනා කරන්නේ, එක් එක් කෙනා විසින් භාණ්ඩ සඳහා ගෙවිය යුතු වැඩි ප්‍රමාණයන් මුදල්වලින් සම්පූර්ණ කිරීම නොවෙයි. එය කරන්නට බැරි වැඩක්. මේ කෝටි හයහමාරේ මුදල, මොනයම් මාර්ගයකින් හෝ බඩුවල මිළ අඩු කිරීමේ ක්‍රියා මාර්ගයක් සඳහා යොදන්නට පුළුවන් නම් ඊට හැම කෙනකුම කැමැති වෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. තමන්ට අවශ්‍ය භාණ්ඩ අඩු මිලකට ලබා ගන්නට පුළුවන්කමක් ඇති වෙනවා නම් සැම කෙනකුම ඊට කැමැති වෙනවාට කිසිම සැකයක් නැහැ. එවැනි ක්‍රියා මාර්ගයක් ඇති වුණොත් ගමේ ගොවියාත් නගරයේ කම්කරුවාත් වෙනත් නොයෙක් සේවයන්හි යෙදී සිටින සේවක භවතුනුත් එහි ප්‍රතිඵල භුක්ති විඳිනවා ඇති.

භාණ්ඩවල මිල වැඩි වීම අසාධාරණ නොවේද යන ප්‍රශ්නය අද බොහෝ දෙනා අහනවා. එහෙත්, භාණ්ඩ නිපදවීමත් පරිහරණය කිරීමත් පිළිබඳ ආර්ථික තත්ත්වය විග්‍රහ කරන විට භාණ්ඩවල මිල වැඩි වීම වළක්වන්නට අද ඉඩක් ඇත්තේ නැති බව අපට පෙනී යනවා. අපි ගමේ ගොවි ගෙදරක් ගැන කල්පනා කර බලමු. ඒ ගෙදර ගොවීන් මංඤොක්කා රාත්තලක් නිපදවනවා නම් එහි මිල පෙර තිබුණාට වඩා වැඩි කිරීමට අද ඔවුන්ට සිදු වී තිබෙනවා. ඊට හේතුව මොකක්ද? ඒ මංඤොක්කා රාත්තල නිපදවීම සඳහා පාවිච්චි කරන භාණ්ඩවල මිළත් වැඩිවී තිබීමයි. අද උදැල්ලක් ගැනීමට රුපියල් 15 ක් පමණ වැය කරන්නට සිදු වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

නෑ, නෑ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

කීයද උදැල්ලක් ?

**ආර්. පී. විජේසිරි මයා. (කුණ්ඩසාලෙ)**
*(திரு. ஆர். பீ. விஜேசிறி—குண்டசாலை)*
(Mr. R. P. Wijesiri—Kundasale)

රු. 8.25 යි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

කිඹුලා උදැල්ලක් ?

**විජේසිරි මයා.**
*(திரு. விஜேசிறி)*
(Mr. Wijesiri)

ඇයි, කිඹුලා උදලුම ඕනෑද ? වෙන ජාති හොඳ නැද්ද ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

අන්න හරි. ඒක තමයි ප්‍රශ්නය. මම දෙන්නම් ඒකට උත්තර.

**විජේසිරි මයා.**
*(திரு. விஜேசிறி)*
(Mr. Wijesiri)

කිඹුලා උදලුත් ඕනෑ තරම් තිබෙනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

රු. 8.25 ට කිඹුලා උදලු කොහේවත් නෑ. කිඹුලා උදැල්ලක් රු. 15 යි; රු. 13.50; රු. 14 යි. රු. 8.50 ට එම උදැල්ලක් ගන්නට පුළුවන්යයි යම් කෙනකු කියතොත් එය මුසාවාදයක්. හැබැයි, "ගොවියා" උදැල්ලක් නම් රුපියල් රුපියල් 8.50 කට පුළුවන්කම ඇති. නමුත් පොළොව කැපීම පිණිස අපේ ගොවියා වෙනත් උදලු වර්ග යක් පාවිච්චි කරන්නට පුරුදු වී සිටිනවා. ඒ අය "ගොවියා" උදලු පාවිච්චි කර ඒවා පහසුවෙන් වැඩට පාවිච්චි කරන්නට බැරිය කියා ප්‍රතික්ෂේප කර තිබෙනවා. මා කියන දේ පිළිගන්න නැත්නම් ඒක වෙනම දෙයක්; නමුත් මා කියන්නේ සත්‍යයක්. ගම්බද ගොවීන් පොළොව කැපීම පිණිස "කිඹුලා" උදලු පාවිච්චි කරන්නටයි වඩා කැමති. ඊට හේතුව එම උදලු වර්ගය වඩා පහසුවෙන් පාවිච්චි කළ හැකි වීමයි. "ගොවියා" උදලු තවම ඒ මට්ටමට ඇවිත් නැහැ. යථා කාලයේදී ඒ මට්ටමට නොවෙයි ඊටත් වඩා උසස් තත්ත්වයකට "ගොවියා" උදලු පත් වේවි යයි අප විශ්වාස කරනවා. උදලුවල තත්ත්වය ඒකයි.

ඊළඟට කටු කම්බි ගනිමු. කටු කම්බි හොණ්ඩරයක් අද රුපියල් අසූවයි නැත්නම් රුපියල් අසූපහයි. නැද්ද ? අපේ විද්‍යාත්මක කටයුතු භාර ඇමතිතුමාගේ විද්‍යාත්මක මොළයවත් යොදා ලාභයට ලංකාවේ කටු කම්බි නිපදවන්නට පුළුවන් නම් ඒකත් ලොකු උපකාරයක් වෙනවා. ඒ කෙසේ වෙතත් අද කටු කම්බි හොණ්ඩරයක් රුපියල් අසූවයි නැත්නම් අසූපහයි. දින පහකට පමණ පෙර කටු කම්බි හොණ්ඩරයක් රුපියල් සියයක්ය කියා කෙනෙක් මට කිව්වා. ඒ කෙසේ වෙතත්, ස්ථිර වශයෙන්ම කටු කම්බි හොණ්ඩරයකට රුපියල් අසූපහටත් අනූවටත් අතර මිළක් ගෙවන්නට සිද්ධ වී තිබෙනවා. ඉඩම් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා ඒක පිළිගන්නවාද නැද්ද කියා මා දන්නේ නැහැ. ඒ අනුව ගොවියාට වුවමනා කරන සෑම ද්‍රව්‍යයකම මිළ වැඩිවී තිබෙනවා.

ගොවියාගේ ආහාරයට උවමනා කරන පොල් ගෙඩියක් කීයද ? නිකවැරටිය වැනි පොල් තිබෙන ප්‍රදේශවලත් අද පොල් ගෙඩියක් ශත 22 යි. කුණ්ඩසාලෙ වැනි ප්‍රදේශවල ඊටත් වඩා මිළ ඇති.

**විජේසිරි මයා.**
*(திரு. விஜேசிறி)*
(Mr. Wijesiri)

අපේ රටේ බඩු නොවැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

හරි. අපේ රටේ බඩු තමයි. නමුත් ඒ භාණ්ඩ ගන්නෙත් අපේ රටේ ජීවත් වන අයම නොවැ. ඒ අයට ලැබෙන වැටුපෙන් තමයි මේ හැම එකටම වියදම් කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

වෙන්නෙ. රටේ තමයි මේ මුදල් හුවමාරු වෙන්නෙ. නමුත් ඒ ආකාරයට මුදල් හුවමාරු වීමේදී පාරිභෝගිකයා කොයි තරම් අමාරුවෙන්ද ඒ මුදල් වැය කරන්නෙ? ඇත්ත වශයෙන්ම මේ රුපියල් දහයක් වැඩි කිරීම නිසා අත් වූ ලාභයට වඩා සියක් ගුණයකින් විශාල පාඩුවකට අප හැමෝටම මුහුණ පාන්නට සිද්ධ වී තිබෙනවා. ආණ්ඩුව ඒ අවස්ථාවේදී රුපියලේ අගය අඩු නොකර සිටියා නම් අපට මීට වඩා ලාභයක් ලබා ගැනීමට තිබුණා. රුපියලේ අගය අඩු කිරීමෙන් විදේශික වත්කම් වැඩි වී අපට විශාල ලාභයක් අත් වෙනවාය කියා ගරු මුදල් ඇමතිතුමා කියන්නට යෙදුණා.

විදේශික වත්කම් කෙසේ වෙතත් අපනයන වැඩි වීම කොහොමද කියා බලමු. මධ්‍යම බැංකුවෙන් නිකුත් කරන දෙසැම්බර් මාසයේ "විවරණිකාව" නම් වාර්තාවේ මේ විධියටයි සඳහන් වෙන්නෙ. පාර්ලිමේන්තුවේදී සිංහල අමතක වෙනවාය කියන ප්‍රශ්නය හැමදාම මතු වෙනවා. මේ ආණ්ඩුවට සිංහල අමතක වී තිබෙනවා නම් මේ ආණ්ඩුවේ උදව් උපකාර යටතේ ජීවත් වන සෑම රටවැසියකුටම ඒ අමතකවීමට භාජන වන්නට සිදු වීම පුදුමයක් නොවෙයි. මුදල් ඇමතිතුමා දැන්වත් මේ කාරණය ගැන අවධානය යොමු කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. මධ්‍යම බැංකුවේ මේ වාර්තාව තවමත් සිංහලෙන් ලැබුණේ නැහැ. අවසාන වාර්තාව තිබෙන්නේ ඉංගිරිසියෙනුයි. අවසාන සිංහල "විවරණිකාව" ජූනි මාසයේ එකයි. ඉංගිරිසියෙන් තිබෙනවා දෙසැම්බර් මාසයේ වාර්තාව. රුපියලේ අගය අඩු කිරීමෙන් අපනයන වැඩි වී විදේශිය වත්කම් වැඩි වේවිය කියා තමුන්නාන්සේලා බලාපොරොත්තු වුණා. නමුත් අපනයන පිළිබඳව මේ වාර්තාවේ මෙහෙමයි තිබෙන්නෙ. මේක 1967 දෙසැම්බර් මාසයේ "විවරණිකාව"

"The higher value of exports was the result of a slight increase in the volume of exports."

එහෙම නම් මේ යාන්තම් ශේෂයක පමණ වැඩිවීම පිණිස තමයි, මේ රටේ වාසය කරන මහජනයාගේ ඔළුව උඩ විශාල බරක් පටවා තිබෙන්නෙ. මේ සුළු වාසියත් ලබා තිබෙන්නේ කවුද? විදේශිය වෙළඳාමෙන් පොදු වශයෙන් රජය මේ ලාභය ලබා නැහැ. එහෙත් භාණ්ඩවල මිළ වැඩිවීම නිසා පොදු ජනයාගේ සෑම කොටසක්ම විශාල දුකකට පත් වී සිටිනවා. රජය භාණ්ඩවල මිළ වැඩි කිරීමත්, ඒ වගේම රජය රුපියල් 10 කින් පඩි වැඩි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනුත් අද භාණ්ඩවල විශාල මිළ වැඩිවීමක් සිදු වී තිබෙන නිසා පොදු ජනතාව අද පත්වී සිටින්නෙ ඔවුන්ට විඳ දරා ගන්ට බැරි තරම් දුකකටයි. ඒ ඔක්කොම දුක් විඳින්නට සිදු වී තිබෙන්නෙ මේ ඉතා පුංචි ලාභයක් නිසයි. මේකෙ රහස මෙයයි. පොදු ජනයාගේ කර පිට විශාල බරක් පැටවුණත්, රජයට ලැබෙන්නෙ ඉතා සුළු ලාභයක් වුණත් ධනපති පන්තියේ අතලොස්සකට මෙයින් විශාල ප්‍රයෝජනයක් තිබෙනවා. ඒ නිසයි මේ පියවර ගැනීමට රජය නිර්භයව ඉදිරිපත් වුණේ. මේ රටේ භාණ්ඩ පිටරට යවන අතලොස්සක් පමණ ස්වදේශීය හා විදේශීය ධනේශ්වර කොම්පැනි කීපයකට මෙහි නියම ඵලය බුක්තිවිඳින්ට ඉඩ තිබෙන බව සත්‍යයක්. සමහරවිට ඒ ඇත්තන්ගෙන් සුළු ආධාරයක් රජයට හෝ පක්ෂයට ලැබෙනව ඇති. ඒ නිසා පොදු ජනතාවගේ කර පිට මේතරම් විශාල බරක් ඇමීම සුදුසුදැයි සාධාරණදැයි මා අහනවා.

රුපියලේ අගය අඩු කිරීමෙන් පසුව ගත වූ මේ මාස 5ක පමණ කාලය තුළ මේ මගින් රජය ලැබූ ලාභයත්, පොදු මහජනතාවගේ ආර්ථික තත්ත්වයේ ඇති වූ වාසි සහගත තත්ත්වයත්, වැඩි වූ විදේශ වත්කම්වල ප්‍රමාණයත් පිළිබඳ විස්තරයක් ගරු මුදල් ඇමතිතුමා විසින් මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා නම් එය ප්‍රයෝජනවත් වෙනව. එසේ කරන්ට බැරිකමක් ඇතොත් රජය පිළිගත්තත් නොපිළිගත්තත් පොදු ජනතාව පිළිගන්නවා ඇති මෙය සම්පූර්ණයෙන්ම ධනපති කීප දෙනකුගේ බලපෑම් උඩ කරන ලද හිතුවක්කාර ක්‍රියාවක් බව. ඇත්ත වශයෙන්ම එංගලන්තයේ රන් පවුමේ අගය අඩු කිරීම නිසා අපේ රුපියලේ අගය අඩු නො කළා නම් අපට වාසි වෙන්ට ඉඩ තිබුණා. මේ පඩි ක්‍රමය ක්‍රියාත්මක වුණේ දෙසැම්බර් මාසයේ පටන් නිසා දෙසැම්බර් මාසයේම තත්ත්වය විග්‍රහ කිරීම ප්‍රයෝජනවත් යයි මා විශ්වාස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරනව. එහෙත් මේ සංඛ්‍යා ලේඛනවල තත්ත්වය සතුටුදායකය කියා අපට පිළි ගන්ට අමාරුයි. කෙසේ වෙතත් ඉදිරිපත් කරන්ට තිබෙන්නෙ මේවායි. යථා තත්ත් වයෙන් රටේ ජීවත්වන විට තත්ත්වය මීට වඩා භයානකයි. මේ වාර්තා ලබාගන්න දෙපාර්තමේන්තුවලින් ලැබෙන සංඛ්‍යා ලේඛන අනුවයි මේ වාර්තා සකස් කර තිබෙන්නෙ. එහෙත් යථා තත්ත්වයෙන් රටේ ආර්ථික තත්ත්වය දෙස කල්පනා කර බලන විට මේ තත්ත්වය මීට වඩා අඳුරු බව, මීට වඩා දුර්වල බව පෙනී යනව. දෙසැම්බර් මාසයේ මේ වැඩිවීම සිදු වූ නිසා භාණ්ඩවල මිළ මේ අන්දමට වැඩි වී තිබෙ නව. මධ්‍යම බැංකුවේ විවර්තිකාවේ 9 වෙනි පිටුවේ මෙන්න මේ විධියට තිබෙනවා. මෙය තිබෙන්නෙ ඉංග්‍රිසියෙන් නිසා මට කියවන්න වන්නේ ඉංග්‍රිසියෙනුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගැන මට සමාවන්න. අපට මේවායේ සිංහල පිටපත් ලබා ගන්න ක්‍රමයක් නැහැ. මේවා සිංහල ට පරිවර්තනය කරන විට අවුරුද්දක් පමණ ගත වෙනවා. ඒ නිසා මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේවා සිංහල භාෂාවෙන් ඉදිරිපත් කිරීමට කට යුතු කරන්නය කියා. රාජ්‍ය භාෂාව සිංහල නම් මේවා ඉදිරිපත් කරන්න ඕනෑ සිංහල භාෂාවෙනුයි. නමුත් රාජ්‍ය භාෂාව වශයෙන් සලකන්නේ ඉංග්‍රිසි භාෂාව නිසා මේවා අපට ලබා ගන්න සිදු වී තිබෙන්නේ ඉංග්‍රිසි භාෂාවෙනුයි. ඒ නිසා සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා අපේ පළමුවැනි සටන තිබෙන්නේ රජයත් සමගයි. එක්සත් ජාතික පක්ෂය බලයට පත් වූ දා සිට සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කරන පනත මුල්ලකට දමා තිබෙනවා. ඒ නිසයි අපි විරුද්ධ පක් ෂයට කිව්වේ ටිකක් සූදානම් වෙන්නය කියා. නමුත් ඒ අයත් සූදානම් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවර්තිකාවේ තිබෙන්නේ මෙන්න මේ විධි යටයි :

"The level of retail prices as measured by the Colombo Consumer's Price Index increased by 2.6 per cent. from an index figure of 116.3 in November to 119.3 in December 1967.—"

"—On the sector-wise classification, the indices for the domestic, import and export groups showed an increase of 0.5, 4.7 and 7.0 per cent. respectively. On the commodity-wise classification the sub-indices for food, clothing, fuel and light and miscellaneous items increased by 4.1, 0.1, 1.5 and 0.1 per cent. respectively."

කරන්න දෙයක් නැහැ. මේවා කියවන වාට නම් තමුන්නාන්සේලා කැමති නැතිව ඇති.

මෙය කළේ කුමකටද? මේ ඔක්කොම බඩු භාණ්ඩවල මිල අඩු කරන්නය, ජීවිත යහපත් කරන්නය කියන අදහසින්—මිනිසුන්ගේ ජීවිත යහපත් කිරීමේ පර මාර්ථයෙන්—තමයි රුපියලේ වටිනාකම අඩු කළේ. රුපියලේ මිල අඩු කළේ එවැනි අදහසකින් වෙන්න ඕනෑ. එහෙ ම නැත්නම් කරන්න හේතුවක් නැහැ නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට කියන්නෙ නැතුව ඇත්ත කිව්ව නම් අපට පිළිගන්න තිබුණා. ධනේශ්වර පංක්තියට උදව් උපකාර කරන්නට, කිහිප දෙනෙකුගේ මඩි තර කරන්නට මේ විධියට කටයුතු කළාය කිව්වා නම් ඇත්ත කීම නිසා මේ අයට ගරු කළ යුතුය කියාවත් සිතා අපගේ සැලකිල්ල තමුන්නාන්සේලාට ලැබෙන් න ඉඩ තිබුණා. නමුත් තමුන්නාන්සේ ලා ඒ විධියට නොකියා, පොදු මහජන තාව ආර්ථික බරින් මුදවන්නටය මේ විධියට කරන්නේ කියා කිව්වා. කොයි විධියටද තමුන්නාන්සේලා පොදු මහ ජනතාව ආර්ථික බරින් මුදා හැර තිබෙන්නෙ? රුපියල් 10 වැඩි කිරීම නිසා මොකක්ද ලැබුණු සහනය? මා මුලින් කී පරිදි මධ්‍යම බැංකුවේ වාර්තා වෙන් ඔප්පු වෙනවා බඩු මිල වැඩි වී තිබෙන බව. එහි ප්‍රතිඵලයක් වශයෙන් වැඩි බරක් පාරිභෝගිකයාගේ හිස මත පැටවී ඇති බව පෙනී යනවා. ඒ දෙසැම් බර් මාසයේ තත්ත්වයයි. ජනවාරි පෙබ රවාරි කාලය වන විට තවත් වැඩියි. දැන් මාර්තු මාසයත් අවසන් වී ගෙන යනවා. මෙය දවසින් දවස වැඩි වේගෙන යනවා. මේ සම්බන්ධයෙන් මොකක්ද රජය කරන්නෙ? මේ තත්ත්වය නැති කිරීම සඳහා කරන එකම ක්‍රියාවක් අපට දකි දකින්න නැහැ. අපට එකක් නම් පෙනී යනවා. මේ රජයට වුවමනා කරනවා මේ රට තව තවත් ආර්ථික පරිහානියටම පත් කරන්න. එතකොටයි ඒ අයගේ අදහස සපුරාගන්න වැඩියෙන් අවස්ථාව සැලසෙන්නෙ. එයයි මෙහි තිබෙන රහස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

කියා මා නිර්භයව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමා තර්ක කරනවා බඩු මිල වැඩි වීම නිසා ගොවියන්ට සහනයක් සැලසෙනවාය කියා. පෙරෙයිදාද කොහෙද එතුමා කියා තිබෙනවා, ලෝකයේ කොයි ගොවියාටද මේ වගේ සහන ලැබෙන්නේ කියා. ගොවියාට සහනයක් ලැබෙනවා නම් ගොවියාගේ එදිනෙදා ජීවිතය සතුටුදායක වී තිබෙනවාද කියා ගොවියකුගෙන් විමසා බලන්න ඕනෑ. අපේ යාපහුවේ මන්ත්‍රීතුමා වන ගරු මුදල් ඇමතිතුමාට පුළුවන්ද යාපහුවේ ගොවීන්ගේ තත්ත්වය ගැන කියන්න. සාමාන්‍යයෙන් වන්නියේ ජීවත් වන ගොවීන් බොහෝම චාම් ජීවිත ගත කරන අයයි; අඩු වියදමෙන් ජීවත් වන අයයි; දුෂ්කරතා මධ්‍යයේ ජීවත් වන අයයි. මෙතුමාගේ මේ ක්‍රියා මාර්ගය නිසා ඒ එකම ගොවියකුගේවත් ජීවිතවලට සහන සැලසී තිබෙනවාද?

තමුන්නාන්සේලා බලයට පැමිණ දැන් අවුරුදු තුනක් අවසන් වන්නටත් ළඟයි. මේ කාලය තුළ කළ ක්‍රියාවල ප්‍රතිවිපාක වූයේ ජනතාවගේ ජීවිත දවසින් දවස දුකට භාජන වීමයි. එසේ නම් මෙසේ මුදල් ඉල්ලීමේ සාධාරණත්වයක් තිබෙනවාද? රජයේ සේවකයන්ට නොවෙයි, ඕනෑම කෙනකුට යම් විධියක සහනයක් උදව්වක් සැලසීමෙන් එදිනෙදා ජීවිත පවත්වාගෙන යාමට උපකාරී වෙනවා නම් ඒ සෑම එකකටම අපේ සහාය දෙන්න අපි ලැහැස්තියි. එහෙත් මේ ක්‍රියා මාර්ගය නිසා සිද්ධ වී තිබෙන්නේ ජීවත් වීම දවසින් දවස අසීරුවට පත් වීමයි. එම නිසා අවසාන වශයෙන් මා මුදල් ඇමතිතුමාගෙන් එක්තරා ඉල්ලීමක් කරන්න කැමතියි. අගමැතිතුමා එදා දුන් පොරොන්දුව අනුවවත් අපට මුදල් ඇමතිතුමා මේ ගැන පැහැදිලි කරනවා ඇතැයි මම විශ්වාස කරනවා.

රුපියලේ අගය අඩු කිරීමෙන් සහ යම් යම් පාරිභෝගික ද්‍රව්‍යවල මිල වැඩි කිරීමෙන් මේ රජයට මෙපමණ මුදලක් ලැබී තිබෙනවාය, අපි මේ රුපියල් 6 කෝටි පණස් ලක්ෂය දෙන්නේ ඒ මුදලින්ය, ඊ ළඟට තවත් මෙපමණ මුදලක් භාණ්ඩාගාරයේ ඉතුරුව තිබෙනවාය කියා අපට මුදල් ඇමතිතුමා පැහැදිලි කරනවාද? මේ මුදල දුන්නාට පස්සේ, තවත් මුදල් භාණ්ඩාගාරයේ ඉතුරුව තිබෙනවාද කියා අපි පැහැදිලි වශයෙන් දැනගන්න කැමතියි. ඒ මක්නිසාද? එදා අගමැතිතුමා ඔප්පු කරන්න ලැහැස්ති වුණා, මේ සියල්ලම දෙන්නේ ධනපති සමාගම්වලින් අය කරන බදු මුදල්වලින්ය කියා. එහෙත් දැන් ධනපති සමාගම් සියල්ලම ආරක්ෂා වෙනවා. මෙයින් රජයට පාඩුයි. වැසියාට පාඩුයි. භාණ්ඩාගාරයේ ආර්ථික තත්ත්වය දුර්වල වී හීන වී අතලොස්සක් පමණක් මෙයින් තාවකාලික ලාභයක් ලබා තිබෙනවා.

ඊළඟට ගරු මුදල් ඇමතිතුමා අපට කියනවාද මේ මාස පහ ඇතුළත, රුපියලේ අගය අඩු කළ දා සිට මේ වනතුරු ආර්ථික තත්ත්වයේ ආරක්ෂාව පිණිසයි කියා කළ ක්‍රියාවල සුබ ඵල මෙන්න මේවාය කියා? එසේ නම් ඒවායින් එකක් දෙකක්වත් ඉදිරිපත් කරන්න. එසේ ඉදිරිපත් කරන්න පුළුවන් නම් රුපියලේ අගය අඩු කිරීම සාධාරණයි කියා අපට එකඟ වන්න පුළුවන්. එහෙත් එවැනි කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්කමක් නැහැ. එතකොට මේ බර පොදු මහජනතාවගේ හිස පිට ඇමි මෙන් කර තිබෙන්නේ කුමක්ද? මේ ක්‍රියා මාර්ගය මේ රජයට කීකරුව සිටින, මේ රජයට විශෙෂ සැලකිල්ලක් දක්වන, මේ රජයේ අත්තිවාරම පවතින ධනේශ්වර පංක්තියේ ආරක්ෂාව පිණිස ගෙන තිබෙන ක්‍රියා මාර්ගයක් නිසා පොදු වශයෙන් රජයේ සේවකයන්ටත්, පොදු මහජනතාවටත්, රටටත් විශාල දුකක් හිරිහැරයක් කරදරයක් විඳින්නට සිදු වී ඇති බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 2.41

ආචාර්ය එන්. එම්. පෙරේරා.
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා විසින් තුන්වන වතාවටයි රුපියලේ අගය අඩු කිරීම සම්බන්ධයෙන් මෙබඳු යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

මෙයට පෙර දෙවතාවක් යෝජනා ඉදිරිපත් කළත් ඒ ඉදිරිපත් කළ කිසිම අවස්ථාවක දීවත් පැහැදිලි විස්තරයක් කළේ නැහැ, රුපියලේ අගය අඩු කිරීම නිසා මෙබඳු අර්බුදකාරි තත්ත්වයක් ඇති වී තිබෙනවාය, එයට සහනයක් සැලසීමක් වශයෙන් මෙන්න මේ විධියෙ පියවර ගෙන තිබෙනවාය කියා. යෝජනාව ඉදිරිපත් කරමින් බොහොම අමාරුවෙන් වාගේ වචනයක් දෙකක් පිට කිරීම පමණයි එතුමා කරන්නෙ. රුපියල් 15 ක් දෙන්නෙ මොන හේතුවක් උඩද, ඒ සීමාව ඇති කර ගත්තෙ කොයි ආකාරයෙන්ද කියා කිසිම අන්දමක විස්තරයක් කළේ නැහැ. එම නිසා මුදල් ඇමතිතුමාගෙ යුතුකමක් නැද්ද, තුන්වන වතාවටත් මෙබඳු යෝජනාවක් ඉදිරිපත් කරන අවස්ථාවෙ රුපියලේ අගය අඩු කිරීමෙන් මුහුණ පා ඇති තත්ත්වය පිළිබඳව හා ඊට යොදා ඇති පිළියම් ගැන යම්කිසි විස්තරයක් කරන්න? ඒ අතරම අපට අසන්න ලැබී තිබෙනවා රත්රන් මිළත් පහත වැටීම පිළිබඳව දැනට එක්තරා අන්දමක විශාල අර්බුදයක් ලෝකයේ පවතින බව. රත්රන්වල වටිනාකම පහත වැටීමත්——

**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)*
(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

රත්රන් මොලවලත්——

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඔව්, මොලවලත් වටිනාකම පහත වැටෙන තත්ත්වයක් ඇති වී තිබෙනවා.

ගරු මුදල් ඇමතිතුමාට යුතුකමක් තිබුණේ නැද්ද, රත්රන්වල වටිනාකම වෙනස් වී තිබෙනවා නම් එයින් අපේ රටේ කාසිය වැටෙන තත්ත්වය ගැන, අපට මුහුණ පාන්න වන තත්ත්වය ගැන යම්කිසි විස්තරයක්, යෝජනාව ඉදිරිපත් කිරීමේදී කරන්න? ඇත්ත වශයෙන්ම මෙවැනි වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් වුනාම මුළු රටම දැනගන්න ඕනෑ, මේ ගරු සභාව දැන්ගන්න ඕනැ, ඇති වී තිබෙන්නාවූ අමුතු තත්ත්වය ගැන. කෙසේ වුනත් මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කළ කාරණා ගැන නැවත වරක් සඳහන් කරන්න මා යන්නෙ නැහැ. නමුත් මේ ප්‍රශ්නයෙදී අපට තරයේම අහන්න සිද්ධ වී තිබෙනවා, ආණ්ඩුව ගෙන යන ප්‍රතිපත්තිය ගැන. රුපියලේ අගය අඩුවීම නිසා යම් යම් අංශවලට සහනයක් සැලසීම පිණිස රුපියල් හය කෝටි පනස් ලක්ෂයක මුදලක් අනුමත කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මෙය ප්‍රමාණවත් වෙනවාද? ඒ සම ගම තමුන්නාන්සේලාගේ දෙපාර්තමේන්තු කරගෙන යන දේවල් ගැන අවබෝධයක් තමුන්නාන්සේලාට තිබෙනවා දැයි මා දන්නෙ නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**
*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*
(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

මොකද නැත්තෙ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

මාර්තු මස 1 වන දා සිට, සමූපකාර තොග වෙළඳ ආයතනයෙන් අලෙවි කරන සෑම බඩුවකම මිළ වැඩි කර තිබෙනවා. එසේ වැඩි කරන ලද මිළ ගණන් සහිත ලැයිස්තුවක් දැනට නිකුත් කර තිබෙනවා. එහෙම නම් තමුන්නාන්සේලාගේ ආයතනවලින්ම අලෙවි කරන ද්‍රව්‍යවල මිළ ප්‍රතිපත්තියක් වශයෙන් තමුන්නාන්සේලාම වැඩි කර තිබෙන අවස්ථාවක අනුමත කිරීමට අදහස් කරන මේ මුදල ප්‍රමාණවත් වෙනවාද නැද්ද කියා අපට ප්‍රශ්න කරන්න සිදු වී තිබෙනවා නොවේද? ඇත්ත වශයෙන්ම මේ මුදල ප්‍රමාණවත්ද? මෙය සතුටුදායක පිළියමක්ද? මට පෙර කථා කළ දකුණු කොළඹ ගරු මන්ත්‍රීවරයාත් (බර්නාඩ් සොයිසා මයා.), කොලොන්නාවෙ ගරු මන්ත්‍රීවරයාත් (ඉලංගරත්න මයා.) පැහැදිලි කර දුන්නා, මේ රටේ වැඩ කරන ජනතාව මෙය පිළිගන්නෙ නැති බව. දැනටමත් සෑහෙන ප්‍රමාණයක් මෙයට විරුද්ධව යම් යම් යෝජනා ඉදිරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

පත් කර තිබෙනවා ; අදහස් ප්‍රකාශ කර තිබෙනවා. එම නිසා මේ අන්දමේ භයානක තත්ත්වයක් මේ රටේ ඇති කර තිබෙන අවස්ථාවකදී තමුන්නාන්සේලා තමන්කඩුවේ උකු කිරි මධ්‍යස්ථානයකුත් පටන් ගන්න යනවා. තමුන්නාන්සේලා උකුකළ කිරි කර්මාන්තශාලාවක් පටන් ගන්නට යනවා. දැන් කොළඹ ප්‍රදේශයේම කිරි හිඟයක් තිබෙනවා. කිරි ටිකක් සොයා ගන්නටත් අමාරුයි. මෙසේ මා කියන විට තමුන්නාන්සේලා හිනා වන්නට වුවමනාවක් නැහැ. මගේ පෞද්ගලික අත් දැකීම් අනුවයි මා මේ කාරණය කියන්නේ. මට වුවමනා කරන කිරි, මා ලබා ගන්නේ බොරැල්ලෙන්. පසුගිය සුමාන දෙකක් තිස්සේ මට බොරැල්ලෙන් කිරි ටිකක් ලබා ගන්නට බැරි වුණා. කොළඹ නොයෙක් කොට්ඨාශවල අද කිරි නැහැ. වෙනත් ප්‍රදේශවලත් ඒ තත්ත්වය පවතිනවා. අද කිරි නැහැ. නිපදවන කිරි සියල්ලම උකු කළ කිරි කර්මාන්තශාලාවට යවනවා. සෑහෙන්නට කිරි තිබෙන බව ඔප්පු කරන්නටයි ඒ විධියේ වැඩ පිළිවෙලක් ඇති කර තිබෙන්නේ. මෙහෙම නිකම් වනවලා මේ වැඩේ කරන්නට බැහැ. පාරිභෝගිකයන්ගෙන් අහලා බලන්න, ටිකක් එළියට ගිහිල්ලා. වෙන්නේ මොනවාදැයි පිටතට ගිහිල්ලා සොයා බලන්න. රටේ නැති තත්ත්වයක් මවා අමුතු තත්ත්වයක් තමුන්නාන්සේලාට නිලධාරීන් පෙන්වනවා. තමුන්නාන්සේලා එයින් සතුටු වෙනවා. ඕනෑ තරම් කිරි තිබෙනවා යයි ලොකුවට පෙන්නුම් කරන නමුත් අද සිදු වී තිබෙන්නේ එදිනෙදා පාවිච්චියට වුවමනා කරන කිරි ටික පවා පාරිභෝගිකයාට ලබා ගන්නට නැති වීමයි. කල් තබා ගන්නට උකුකළ කිරි හදන්නටත් පුළුවනැයි කියන නමුත් පාරිභෝගිකයන්ට දවස්පතා පාවිච්චියට වුවමනා කරන ටික වත් නැහැ. අපට අද සිදු වී තිබෙන්නේ බොරැල්ලෙන් කිරි ගන්නට නැති නිසා එල්ෆින්ව් හවුස එකට යන්නටයි. මේ විධියේ තත්ත්වයක් තමයි දැන් මේ රටේ තමුන්නාන්සේලා ඇති කර තිබෙන්නේ. පහසු මිලකට තබා කීයටවත් ගන්නට කිරි නැහැ. රුපියල් හයකෝටි පණස් ලක්ෂයක් දීමනා වශයෙන් දෙන්නට යනවාය, එය දෙන්නට යන්නේ විශේෂ සැලකිල්ලක් වශයෙන්ය, මෙහි තිබෙන අමාරුකම නිසා දෙනවාය යනාදි වශයෙන් කියනවා. ගරු මුදල් ඇමතිතුමා කියනවා රජයේ සේවකයන්ට විඳින්නට සිදු වී තිබෙන අමාරුකම් ගැන සලකා මෙසේ දීමනාවන් දෙන්නට යන බව. එය පිළි ගන්නට මාත් ලෑස්තියි. එහෙත් එය ප්‍රමාණවත්ද ? ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

එයින් පිටස්තරවත් දහස් ගණනක් ඉන්නවා. රක්ෂාවල් නැති උදවියත් ඉන්නවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

ඒ නිසා මිට එකඟ වන්නට පෙර තමුන්නාන්සේලා අපට මෙය ප්‍රමාණවත් වන බව ඔප්පු කරන්නට ඕනෑ. නැත්නම්, ඒ තත්ත්වයට, මේ අතිරේක දීමනා නිසා ඊට සරි ලන අන්දමට බඩුවල මිළ සීමාව ඕනෑවට වඩා නඟින්නට ඉඩ නොදී පවත්වාගෙන යෑමට අවශ්‍ය විධිවිධාන සලස්සන්නට ඕනෑ. එවැන්නක් කර තිබෙන බවක් පෙනෙන්නේ නැහැ. එහෙම තත්ත්වයක් නැහැ.

එදිනෙදා පාවිච්චියට ගන්නා බඩුවල මිළ දවස ගානේම වැඩි වෙනව. බඩු මිළ සීඝ්‍ර ලෙස නඟිනවා මිස බහින තත්ත්වයක් නොවෙයි තිබෙන්නේ. එවැනි අවස්ථාවක නිකම් යෝජනාවක් ඉදිරිපත් කර එය පිළිගන්නැයි කීවාට මදි.

ගරු මුදල් ඇමතිතුමා එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා මේ රුපියල් පහළොවේ දීමනාව සාධාරණය කියා කල්පනා කළ නිසා ඉදිරිපත් කළාය කියා. "රීසනබල්" කියන වචනයයි පාවිච්චි කෙළේ. "Within the resources available" යන වචන මාලාවයි පාවිච්චි කෙළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු වන්නිනායක**
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

ඔව්: Within the resources available it is reasonable.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

ඒ වුණත් ආණ්ඩුවකට අමාරු නැහැ රට ඇතුළේ වුවමනා කරන මුදල් ප්‍රමාණය සොයා ගන්නට. තමුන්නාන්සේලා ධනපති පංක්තියට සැහෙන ප්‍රමාණයකින් බදු සැහැල්ලු කර තිබෙනවා. තමුන්නාන්සේලාට මුදල් සොයා ගන්නට කොපමණ මාර්ග තිබෙනවා ද?

**ගරු වන්නිනායක**
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

ආහාර වගාව.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

ඒ සම්බන්ධයෙන් දැන් විවාදයකට බහින්නට මා කල්පනා කරන්නේ නැහැ. තමුන්නාන්සේලා මොන මොන විධියේ තර්ජන කර තිබෙනවා දැයි අපටත් පත්‍රවලින් දැන ගන්නට ලැබී තිබෙනවා. මිනිමෝක් කාර් සම්බන්ධයෙන් තර්ජන කර තිබුණා. ඒ වාගේම ජීප් රථ සම්බන්ධයෙනුත් තර්ජන කර තිබුණා. තමුන්නාන්සේලා අඩු ගණනේ බඩුවල මිල සීමා කරන්නටවත් යන්නේ නැද්දැයි මා අහන්න සතුටුයි. තමුන්නාන්සේලාගේ ආයතනයකින්ම නැවතත් මිල නංවා තිබෙනවා. එහෙම නොවෙයි ද? සැම බඩුවකම පාහේ මිල වැඩි කර තිබෙනවා. ස. තො. ස. කරවල මිලත් ඉහළ නැග තිබෙනවා. ඒ, ඇයි?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ගෙන්වන බඩුවල මිල ඉහළ ගිහින්



**ආචාර්ය එන්. එම්. පෙරේරා**
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

"ගෙන්වන බඩුවල මිල ඉහළයි, ඊට අවශ්‍ය විදේශ විනිමය අපට ලැබෙන්නේ නැහැ" යි වෙළෙන්දන් කියනවා. තමුන්නාන්සේලාත් කියනවා, ගෙන්වන බඩුවල මිල ඉහළ ගිහින් කියා. ඒ නිසා පාරිභෝගිකයන්ට පහර ගහන්නේ ඇයි? රුපියල් 6,50,00,000 ක් වැය කිරීම පිළිබඳව මේ ගරු සභාවේ අනුමැතිය ඉල්ලා සිටින මෙවැනි අවස්ථාවක, ඒ මුදල ප්‍රමාණවත් නොවන බව කියන්නට අපට යුතුකමක් තිබෙනවා. ඒ, එක අංශයක්.

යමක් ලබා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ සේවකයන් දැන් මාස ගණනාවක සිට සාකච්ඡා පවත්වනවා. ඒ සඳහා නඩු කියන්නටයි, දැන් ඒ පෞද්ගලික අංශයේ කම්කරුවන්ට සිදු වී තිබෙන්නේ. අද පවතින තත්ත්වය අනුව රජයේ සේවකයන්ට සැහෙන අමාරුවක් තිබෙන බව තමුන්නාන්සේලා පිළිගන්නවා. ගරු මුදල් ඇමතිතුමා පාවිච්චි කළ වචන මා ලියාගෙන තිබෙනවා. "To alleviate the hardship." පෞද්ගලික අංශයේ කම්කරුවන්ට එය නැද්ද? පෞද්ගලික අංශයේ කම්කරුවන්ටත් තමන්ගේ බලය පාවිච්චි කර ඒ ප්‍රමාණයටම සහනයක් ලබා දෙන්නට රජය කටයුතු නොකළේ ඇයි? ආහාර වගාවටය කියමින් තමුන්නාන්සේලා විසින් නොයෙක් ආධාර කරනු ලැබූ ධනපතියන්ටම ඒ කම්කරුවන් භාර දී තිබෙනවා. ඒ ධනපතියන් අර කම්කරුවන්ගේ අමාරුව තේරුම් නොගෙන ඔවුන්ට පහර ගහනවා. ඒ පහරින් කම්කරුවන් බේරා ගැනීමේ වගකීම තමුන්නාන්සේලා විසින් පැහැර හැරීම ගැනයි, අපේ නෝක්කාඩුව.

තමුන්නාන්සේලාගේ ක්‍රියා කලාපය නිසා සාමාන්‍ය මහජනතාවට අමාරුවක් ඇති වුණා නම් ඊට ගැළපෙන ආකාරයට, සරිලන අන්දමට, ඒ අයට සහන සලසන්නට කටයුතු කරන්නට ඕනෑ. එහෙම කරන්නට බැරි නම් අඩු තරමින් බඩු මිල ඉහළ නැගීමවත් නවත්වන්නට ඕනෑ. අපේ හිත් සනසන්නට මෙතැන හිනැහෙමින් ඒවා මේවා කීවාට වැඩක් නැහැ. බඩු හිඟය නිසා, බඩුවල මිල වැඩිකම නිසා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

සාමාන්‍ය දුප්පත් මිනිසුන් විඳින දුක ගම්වලට ගිහින් බලන්න. තමුන්නාන්සේලා හැම අතුරු මැතිවරණයකින්ම පාඩේ පරාද වන්නේ ඒ නිසයි. එහෙත් තමුන්නාන්සේලා ඒවායින් පාඩම් ඉගෙන ගන්නෙ නැහැ. එහෙත් අපට යුතුකමක් තිබෙනවා, මේවා තමුන්නාන්සේලාට පහදා දෙන්න. තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ නිසා අද වැඩ කරන සාමාන්‍ය ජනතාව ඉතා දුඃඛිත තත්ත්වයකට වැටී, ජීවන බර උසුලන්නට බැරිව සිටිනවා.

මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. අප මේ යෝජනාව අනුමත කරන අතරම, තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළට විරුද්ධත්වය පළ කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 2.55

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

නියෝජ්‍ය කථානායකතුමනි, මේ පරිපූරක ඇස්තමේන්තුවට විරුද්ධ පාර්ශ්වයේ එකඟත්වයත් ලැබීම අපේ සන්තෝෂයට කාරණයක්. මේ සඳහා දීර්ඝ විවාදයක් අවශ්‍යව තිබුණේ නැතැයි මා හිතනවා. ඒ මන්ද, විරුද්ධ පාර්ශ්වය මගේ යෝජනාවට සම්පූර්ණයෙන්ම එකඟයි. විරුද්ධ පාර්ශ්වයේ ඒ අනුග්‍රහය, එකඟත්වය, සම්මතය අප විසින් ඉදිරිපත් කරනු ලබන සෑම හොඳ යෝජනාවකටම ලැබෙනවා නම්, මේ ගරු සභාවේ කටයුතුත්, මේ රටේ කටයුතුත් මීට වඩා ඉක්මනින් සාර්ථක ලෙස කරන්නට අපට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. එම නිසා, මා විරුද්ධ පාර්ශ්වයට ආරාධනා කරනවා—

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඔය පැත්තට එන්න?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

—මෙවැනි හොඳ යෝජනා ඉදිරිපත් වුණාම ඉදිරියේදීත් වාදය ඊක්ක් නෝවී කර, පුළුවන් තරම් ඉක්මනින් තමුන්නාන්සේලාගේ එකඟත්වය අපට දෙන්නය කියා.

මේ යෝජනාවට මේ පැත්තත් එකඟයි; විරුද්ධ පාර්ශ්වයත් එකඟයි. ඒ කියන්නේ, මෙය යුක්තිසහගත යෝජනාවක් බව දෙගොල්ලම පිළිගන්නවා. හැබැයි, විරුද්ධ පාර්ශ්වය විරුඛ වන්නට වුවමනා නිසාම යම් යම් දේවල් කියන්නට යෙදුණා. දේශපාලන වාසි ගැනීම සඳහා සමහර අදහස් පළ කළා. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) එක්තරා අදහසක් ඉදිරිපත් කළා. එනම්, රජයේ සේවකයන් ඉල්ලූ ඉල්ලීම් අතරත්, මේ රජය විසින් ඉෂ්ට කර තිබෙන ඉල්ලීම් අතරත් ලොකු පරතරයක් තිබෙනවාලු. එහෙත් පසුගිය රජයේ වැදගත් ඇමතිවරයෙක් හැටියට අවුරුදු 9ක් තිස්සේ කටයුතු කරලත් ඒ රජය කාලයේ රජයේ සේවකයින් ඉල්ලූ ඉල්ලීම් මොනවාද, ඒවායින් ඒ රජය මගින් ඉටු කළ ඉල්ලීම් මොනවාද, කියා වත් එතුමා කීවේ නැහැ. ඉටු කළ ඉල්ලීම් එකක්වත් කීවේ නැහැ. ඇයි? එකක්වත් ඉටු කළේ නැහැ.

එමෙන්ම පසුගිය රජය රජයේ සේවකයින්ගේ ඇස්වලට වැලි ගැසූ රජයක්. රජයේ සේවකයින්ගේ වැටුප් වැඩි කරන්නට යනවා, එය නිකම්ම නොවෙයි ක්‍රමානුකූලවයි කරන්නේ, ඒ සඳහා කොමිෂන් සභාවක් පත් කරනවා කියා රජයේ සේවකයින්ට බොරු ප්‍රතිඥාවක් දී විල්මට් පෙරේරා කොමිෂන් සභාව පත් කළා. ඒ කොමිෂන් සභාව වැටුප් සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කළා. ඒ වාර්තාව අවුරුදු දෙකකටත් වැඩි කාලයක් ඒ රජය අතේ තිබුණා. එහෙත් ඒවා ක්‍රියාවේ යෙදුවේ නම් ඒ රජය නොවෙයි. ඒ රජය කළේ පඩි නඩි වැඩි කරන්නට යනවාය කියා රජයේ සේවකයින්ට බොරු ප්‍රතිඥාවක් දීම පමණයි. වැටුප් සංශෝධනය කිරීමට පත් කළ කොමිෂන් සභාවේ වාර්තාව ක්‍රියාවේ යෙදීමට එකම පියවරක් වත් ගත්තේ නැහැ.

දැන් අපට කියනවා රජයේ සේවකයින් හුඟක් දේවල් ඉල්ලුවා, එකක්වත් දුන්නේ නැත කියා. යටියන්තොට ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමතිව සිටි කාලයේ රජයේ සේව කයින් ඉල්ලීම් 21ක් ඉදිරිපත් කළ බව අපට මතකයි. දැන් නම් ඒ ප්‍රමාණය 15ක් වී තිබෙනවා. [බාධාකිරීමක්] කොයේ හෝ අඩු වී තිබෙනවා. යටියන්තොට මන්ත්‍රීතුමා භාණ්ඩාගාරය භාරව සිටි කාලයේ එතුමාටයි ඒ ඉල්ලීම් 21 ගෙන ගොස් දුන්නේ. උන්නැහේ කීවේ මොකක්ද? ඒ ප්‍රකාශය අයුක්තිසහගතයයි මා කියන්නේ නැහැ. එතුමා එදා කීවේ කම්මැලිකම අත්හැර විකක් හයියෙන් වැඩ කරන්නය කියලයි. [බාධාකිරීමක්] අනාගතයේදී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධානත්වයෙන් ආණ්ඩුවක් ඇති වෙන බවටත්, ඒ කාලයේ දී ඉල්ලීම් ඉදිරිපත් කළොත් ඒවා ඉටු කර ගත හැකි බවටත් ඒ දවස්වල එතුමා තුළ අදහසක් තිබුණාද කියා මා දන්නේ නැහැ. කොහොම වුණත් එදා එතුමා කීවේ "Wait for better times" කියලයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I did not say that. I said that I would implement them in the next Budget.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Whatever it may be, none of the 21 demands, not even a half of the 21 demands, was implemented. That is a different matter.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

You have not read my speech.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

When I said that today, what did the hon. Member say?—[*Interruption*]. He asked me, "Why did you say that?" And I said, "I suppose, within the resources available to the Government."

ආණ්ඩුවේ මුදල් තත්ත්වය අනුව ඒ ඉල්ලීම් ඉටු කරන්නට බැරි තත්ත්වයක් එදා තිබුණා. දැන් මගෙන් අහනවා, රුපියල් 30ක් නොදී 15ක් දෙන්නේ ඇයි කියා. මාත් කියන්නේ අරකමයි. රජයේ මුදල් තත්ත්වය අනුව දෙන්නට පුළුවන් දීමනාව දෙන්නට ඉදිරිපත් වී සිටිනවා. රජයේ මුදල් තත්ත්වය හොඳ වුණොත් මීට වඩා වැඩි දීමනාවක් දීමට මමත් සූදානම්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

මෙය රුපියලේ අගය අඩු කිරීම නිසා දුන් දීමනාවක්.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

මීට කලිනුත් අපි රුපියල් 20 ක් හා 15 ක් දී තිබෙනවා. එය වෙනත් රජයක් මගින් කවදාවක් නොදුන් මුදලක්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඒ හාල් සලාකය කැපීමෙන් පසුව.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

මා මේ රජය වෙනුවෙන් එකක් කියන්නට කැමතියි. අපි රජයේ සේවකයින් මුළා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. බොරුවට කොමිෂන් සභා පත් කර එහි යෝජනා ක්‍රියාවේ නොයොදා රජයේ සේවකයින්ගේ ඇස්වලට වැලි ගැහීමට මේ රජය බලාපොරොත්තු නොවන බව කියන්න කැමතියි. රජයේ සේවකයින්ගේ වැටුප්, සේවා කොන්දේසි, ආදිය පිළිබඳව හුඟක් විෂමතාවන් තිබුණු නිසා මා මුදල් ඇමති වුණාට පසු ඒවා ගැන වාර්තාවක් ලබා ගැනීමට කාරක සභාවක් පත් කර තිබෙනවා. එහි වාර්තාව ඉක්මනින්ම ඉදිරිපත් කරනවා ඇති. රජයේ සේවකයින් වෙනුවෙන් ඒ කාරක සභාවේ නිර්දේශයන් හැකි තරමක් අපේ රජයේ කාලය තුළදීම ක්‍රියාවේ යෙදීමට රජය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු වන්නිනායක]
වෙනුවෙන් මා තමුන්නාන්සේලාට පොරොන්දු වෙනවා. විල්මට් පෙරේරා කොමිෂන් සභාවේ නිර්දේශයන්ට සිදු වූ දේ රජයේ සේවකයන්ට මතක ඇති. රජයේ සේවකයන් මුළා කරන්නට කාට වත් බැහැ.

දැනට අවුරුදු දෙකක් තුනකට පෙර බඩුවල මිළත් අද බඩුවල මිළත් සසඳා බලන ලෙස කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) කියා සිටියා. හොඳයි, 1956 දී එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව විසින් මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවට පාලනය භාර දෙද්දී බඩුවල මිළත්, 1965 දී ජාතික ආණ්ඩුව පාලනය භාර ගන්නා විට බඩුවල මිළත් සසඳා බලන ලෙස මා කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට මතක් කරනවා. 1956 දී රුපියලට ගන්නට පුළුවන් වූ බඩු ප්‍රමාණයත්, 1965 දී රුපියලට ගන්නට පුළුවන් වූ බඩු ප්‍රමාණයත් සසඳා බැලුවා නම් ඒ මන්ත්‍රීතුමා අපෙන් ඔය වාගේ ප්‍රශ්න අසන්නේ නැහැ. 1956 දී තිබුණු තත්ත්වය මොකක්ද? එදා මේ රටට පිටරටින් බඩු ගෙන්වීමේ කිසිම තහනමක් තිබුණේ නැහැ. ඕනෑම කෙනකුට ඕනෑම රටකින් බඩු ගෙන්වන්නට පුළුවන්කම තිබුණා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
ඒක තමයි වරද.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඒකෙ වරදක් තිබුණේ නැහැ. එහෙම නිදහසේ බඩු ගෙන්වන්නට ඉඩකඩ සලසා තිබෙද්දී එදා රුපියල් ලක්ෂ 12,500 ක විදේශ විනිමයක් ලංකාවේ වාසියට ඉතිරි වී තිබුණා. එහෙත් ටික කලක් යන විට ඒ වාසියට තිබුණු විදේශ විනිමය බහිරවයන් ඇද්ද වාගේ නැතිව ගියා. ඊළඟට විනිමය හිඟයක් ඇති වුණා. 1956 සිට අපේ විදේශ විනිමය කාබාසිනියා කර දැමූ හැටි මෙයින් පේනවා නේද? ඊළඟට ලංකාවේ ආණ්ඩුවලට කරන්නට සිදු වුණේ මොකක්ද? විදේශවලින් ගෙන්වන බඩු සීමා කරන්නට සිදු වීමයි. මේ ලෙඩේ ජාතික ගත්තේ ඔන්න ඔහොමයි. මේ රටේ කළුකඩය ආරම්භ කෙළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව බව කියන්නට පුළුවනි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
ඊට ඉස්සර කළුකඩය තිබුණේ නැද්ද?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඊට ඉස්සර කළුකඩය තිබෙන්නට වුවමනාවක් නැහැ. ඕනෑ කෙනකුට වුවමනා තරම් බඩු පිටරටින් ගෙන්වා ගන්නට පුළුවන්කම තිබුණා. ඒ වාගේම ඕනෑම බඩුවක් අපහසුවක් නැතිව ගන්නට පුළුවන්කම තිබුණා. ඉතින් කළුකඩයක් ඇති වන්නේ මොකටද? 1956 දී රුපියලට ගන්නට පුළුවන් වූ බඩු ප්‍රමාණයත්, 1965 දී රුපියලට ගන්නට පුළුවන් වූ බඩු ප්‍රමාණයත් ගැන සසඳා බලන ලෙස මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා. 1956 සහ 1965 අතර බඩු මිළෙහි තිබෙන පරතරය කොපමණදැයි සෝදිසි කර බලන්න. 1965 දක්වා වූ අවුරුදු 9 තුළ මේ රටේ ආර්ථික තත්ත්වයට ගින්දර තබා, "ඇවිළෙනවා" යයි කියමින් දැන් කෑගසනවා. අප මේ ගින්දර නිවන්නට පුළුවන් තරම් දුරට මහන්සි ගන්නවා. එහෙත් ඊටත් බාධා කරනවා. යම් කිසි හොඳ දෙයක් විනාශ කිරීම ලේසියි. ආර්ථික ක්‍රමයක් වේවා, ගොඩනැගිල්ලක් වේවා ගොවිතැන් වගාවක් වේවා විනාශ කර දැමීම බොහොම ලෙහෙසි දෙයක්. එය සුළු කාලයක් තුළදී කරන්නට පුළුවන්. එහෙත් විනාශ වී ගිය දෙයක් යථා තත්ත්වයට ගෙන ඒමට නම් එසේ විනාශ වීමට ගිය කාල සීමාවට වඩා විශාල කාල සීමාවක් අවශ්‍ය බව මධ්‍යස්ථතාවයෙන් කල්පනා කරන කවුරුන් විසිනුත් පිළිගන්නවා ඇති. අවුරුදු නවයක් තිස්සේ මේ රටේ ආර්ථික තත්ත්වය පරිහානිය කරා දක්කලා අද අපට කියනවා තමුන්නාන්සේලාට පුළුවන් නම් අවුරුදු දෙකක් හමාරකින් තුනකින් හරිගස්සන්නය කියා. [බාධා කිරීමක්] "අපි ජීවන වියදම ඉස්සුවා. අපි විදේශ අරමුදල පුළුවන්තරම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැස්සුවා. අපි රැකිරක්ෂා ප්‍රශ්නය උග්‍ර කළා. දැන් තමුන්නාන්සේලාට පුළුවන් නම් හරිගස්සන්න" කියනවා. අපි හරිගස්සනවා. හැබැයි, අවුරුදු නවයක් මුළුල්ලේ කළ විනාශයක් සුළු කාලයකදී යථා තත්ත්වයට ගෙනෙන්නට බැරි බව මධ්‍යස්ථ අන්දමින් කල්පනා කරන කාටත් පෙනී යනවා ඇති.

**ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*
(Mr. Leslie Goonewardene—Panadura)
අවුරුදු 25 ක් වුවමනාද ?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
විනාශ කිරීමට ගිය කාලයට වඩා කාලයක් වුවමනා කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
අවුරුදු කීයක් වුවමනාද ?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
සමහරවිට අවුරුදු 20 ක් 25 ක් වුවමනා වෙන්නටත් පුළුවනි. [බාධා කිරීමක්] අපට එතරම් කාලයක් වුවමනා නැහැ. අපි බලාපොරොත්තු වෙනවා හැකිතරම් සුළු කාලයකදී ඒ කළ විනාශයේ දුර්විපාක නැති කිරීමට. එපමණක් නොව හැකිතරම් දුරට මේ රටේ ආර්ථික තත්ත්වය හොඳ අතට හැරවීමට අපි උත්සාහ කරනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
ඒ නව අවුරුද්දේ නැතිවුණු දේට වඩා මේ තුන් අවුරුද්දේ නැති වුණා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
What was the per capita position in 1966 ?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
අද මෙම රජය මුහුණ පා සිටින්නේ පසු ගිය රජය විසින් අවුරුදු නවයක් තිස්සේ ගෙන ගිය වැරදි ආර්ථික ප්‍රතිපත්තිවලින් හටගත් දුර්විපාකවලටයි. අප තේරුම් නොගත් ප්‍රශ්නයක් තිබෙනවා. 1966 අවුරුද්දේ රුපියල් ලක්ෂ 2,400 ක පමණ අපේ විනිමය අඩු වීමක් සිදු වුණා, විදේශ රටවලට යවන භාණ්ඩවලට ලැබෙන මුදල් වලින්. ඔවැනි අමාරුකම් රාශියකට මුහුණ පාමිනුයි, මේ රජය මෙම කටයුතු කරන්නට බලාපොරොත්තු වන්නේ. අද තමුන් නාන්සේලා සහාය දුන්නාක් මෙන් මෙවැනි යෝජනා සම්මත කර ගන්නට තව තවත් සහයෝගය දෙනවා නම් ඉතා සුළු කාලයකදී අපට මෙම ප්‍රශ්න නිරාකරණය කර ගන්නට පුළුවන් වෙනවා ඇති.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**
විනා விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
The House has agreed to take up and dispose of those items on which there is not much controversy. Therefore, Items 2 and 3 will stand down. We can take up Item 4 now.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
There is likely to be a discussion on that item Sir, because it deals with the language issue. Let us take up Item 5.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ලංකා රජයේ උකස් බැංකු ආඥාපනත: ව්‍යවස්ථාව

இலங்கை அரச ஈட்டு வங்கிக் கட்டளைச் சட்டம்: விதி

## CEYLON STATE MORTGAGE BANK ORDINANCE: RULE

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

I move,

"That the Rule made by the Minister of Finance under Section 94 (1) of the Ceylon State Mortgage Bank Ordinance (Chapter 398), after consulting the Board of Directors of the Ceylon State Mortgage Bank, which was presented on 24.2.68 and 25.2.68, shall be not disapproved."

This relates to the travelling allowances of members of the board. We are bringing this in line with the payments in respect of other corporations.

ව්‍යවස්ථාව පිළිබඳ විස්තර මෙසේයි:

(අ) ඒ ගමන දුම්රියෙන් යා හැකි ගමනක් නම් (නිදන මැදිරි ඉඩකඩ හැර පළමුවැනි පන්තියේ දුම්රිය ගාස්තුවට සමාන මුදලක් හෝ හැතැප්මකට ශත 45 බැගින් ගණන් බලනු ලැබූ මුදලක් යන දෙකෙන් කුමක් අඩු වුවද ඒ මුදල; සහ

(ආ) ඒ ගමන දුම්රියෙන් යා නොහැකි ගමනක් නම් හැතැප්මකට ශත 45 බැගින් ගණන් බලනු ලැබූ මුදලක් ද වේ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

මේකේ වෙනසක් කරනවාද? දැනට තිබෙන තත්ත්වය මොකක්ද?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

දැන් හැතැප්මට ශත 45 බැගින් ගෙවනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඇයි වෙනස් කරන්නේ?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

දැනට ගෙවන පිළිවෙළ හොඳ මදි බව අවබෝධ වී තිබෙන නිසා, වඩා සාධාරණ පිළිවෙළකට, වෙනත් ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවලට ගෙවන ආකාරයට මෙය සකස් කිරීම සඳහායි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## දේශීය ආදායම් පනත: සම්මතිය

உள்நாட்டு அரசிறைச் சட்டம்: தீர்மானம்

## INLAND REVENUE ACT: RESOLUTION

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

I move,

"That this House resolves under Section 70 (1) (*a*) of the Inland Revenue Act, No. 4 of 1963, that the Agreement for affording relief from double taxation entered into between the Government of Japan and the Government of Ceylon on December 12, 1967, which was presented on March 8, 1968, be approved."

This relates to double tax relief in terms of the agreement entered into between Japan and Ceylon.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

What is it all about?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

It is the same as in other countries. Two countries have got together and agreed on certain measures to prevent double taxation.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.11

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් ඇමතිතුමා මෙයින් අදහස් කරන්නේ, දෙරටෙහිදීම ආදායම් බදු නොගෙවා එම ගෙවීම එක් රටකට පමණක් සීමා කිරීමයි. මා ඉදිරිපත් කරන කාරණය මෙම යෝජනාවට අදාළ නැතත්, දෙවරක් ආදායම් බදු අය කර ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කර වනු සඳහා ඉදිරිපත් කරනවා. විදේශිකයන්ට දී තිබෙන මේ පහසුකම් නොලැබුණු ස්වදේශිකයකුගෙන් මට ලැබුණු ලිපියක් මේ අවස්ථාවේදී මුදල් ඇමතිතුමාට ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා. ආදායම් බදු නොගෙවීම නිසා වරක් තහඩු පවරා බන්ධනාගාරගත කරනු ලැබූ මේ තැනැත්තා ඒ සිර දඬුවම් විඳ ආපසු ආවා. ඊට පසු නැවතත් වරක් ඔහුට තහඩු පවරා තිබෙනවා. ඉමදූව, කෝදාගොඩ, පොල්වත්තේ එම්. ඒ. ගුණදාස නමැති මේ තැනැත්තා මුදල් ඇමතිතුමාටත් අගමැතිතුමාටත් එවූ සංදේශයක පිටපතක් මටත් එවා තිබෙනවා. මේ තැනැත්තා, දැනට ආදායම් බද්දෙන් නිදහස් කර තිබෙන ජාතික ලොතරැයියෙන්, අවුරුදු ගණනකට පෙර දිනුමක් ලබා ගත්තා. එහෙත් පසුව ඔහු බංකොලොත් වුණා. ඒ කාලයේ දී ජාතික ලොතරැයියෙන් ලබන දිනුම් වලින් ආදායම් බදු අය කළා. මේ තැනැත්තාට එය ගෙවා ගන්නට බැරි වුණු නිසා තහඩු පවරනු ලැබ ඔහු බන්ධනාගාරගත වුණා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

සල්ලිවලට මොකද වුණේ ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ලොතරැයි දිනුම් ලබන බොහෝ දෙනකුගේ සල්ලිවලට යන කල ඔක තමයි. දිනුවා වාගේම මේ තැනැත්තා පැරදුණා.

දැනට ගාලු උසාවියේ, අංක එස්. පී. එල්. 23603 දරන තඩුව පවරනු ලැබ සිටින මේ පුද්ගලයාගේ භාර්යාවගේ දේපල වගයක් බලහත්කාරයෙන් ලබාගෙන තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා කරුණාකර මේ ගැන සොයා බලා මේ දෙදෙනාටම නිදහසක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. එම්. ඒ. ගුණදාස මහතාගේ ලිපිය මා මුදල් ඇමතිතුමාට ඉදිරිපත් කරනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

I have a note on this agreement in regard to double taxation.

The Double Tax Relief Convention between the Government of Japan and the Government of Ceylon was signed in Colombo on 12th December 1967. Double Tax Relief Conventions with the Governments of India, Sweden, Norway, Denmark, and the Federal Republic of Germany are presently in force. The convention with the Government of Japan falls within the pattern of these conventions.

Double taxation on income arises from the fact that, under the laws in Ceylon as well as in Japan, income tax is payable by a resident of one country on his income received from the other country both in the country of residence and in the other country.

Under the existing weight of taxation in each of the two countries, the burden of such double taxation is a serious handicap for the development of trade between the two countries and the attraction of Japanese capital or technical assistance to Ceylon. The object of the present convention has,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මන්ත්‍රීනායක]

therefore, been to remove the hardship arising from double taxation which a resident of one country now faces if he wishes to invest, trade or otherwise do business in the other country. The main principle on which the agreement is based is that the country in which the income arises is permitted to levy the tax and the other country gives the relief.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

The only point is this. I can understand double taxation relief in the case of the British where you have a reasonable number of Ceylonese resident in Britain and a number of British people resident in Ceylon. Then there is the question of property owned, though of course more property is owned by the British in Ceylon. But in the case of Japan, how many Ceylonese are resident in Japan? The number is negligible.

The question here really is not so much how many Japanese are resident in Ceylon, as encouraging Japanese business to come here. There are Japanese businessmen here already and they are liable to tax in this country and also liable to be taxed there. That is the only reason.

On the basis of the other double taxation relief, this does not arise. Here it is a question of inviting Japanese capitalists to come to this country and invest money, and of making provision so that they could get certain concessions which they would otherwise not get. That is really what it means.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Item 7 will stand down. It is controversial.

## පරිපූරක මුදල: ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව: කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි ආදිය

குறைநிரப்புத் தொகை : இறக்குமதி, ஏற்றுமதிக் கட்டுப்பாட்டதிகாரியின் திணைக்களம் : ஆளுக்குரிய வரும்படி முதலியவை

## SUPPLEMENTARY SUPPLY: DEPARTMENT OF CONTROLLER OF IMPORTS AND EXPORTS: PERSONAL EMOLUMENTS, ETC.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I move,

"That a supplementary sum not exceeding rupees thirty-three thousand three hundred and fifty-nine (Rs. 33,359) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon for the service of the financial year beginning on October 1, 1967, and ending on September 30, 1968, and that the said sum may be expended as specified in the Schedule hereto:

*Schedule*

| | Rs. |
|---|---|
| Head 33—Department of Controller of Imports and Exports. | |
| Vote No. 1—Personal Emoluments and other allowances of staff | |
| Sub-heads 1 Cadre and salaries .. | 24,850 |
| 2 Cost of living and special living allowances .. | 7,246 |
| 3 Other allowances .. | 1,263 |
| | 33,359" |

This is a very small sum of money that is required to create, in the Department of the Controller of Imports and Exports, a unit to function as an indent board. We wish, first, to check on invoices of exports going abroad, to prevent blackmarketing in foreign exchange and the overloading of invoices, and secondly, on imports coming in. When licences are given for imports, we like to follow up the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

imports until they go into the hands of the consumer. So, this supplementary estimate is to create a unit called the indent board. The salaries of a few officers, whose salaries are not provided in the annual budget, have to be provided by this supplementary estimate. That is the purpose.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

This is a rather important matter. I saw a very significant observation by the Acting Minister in the explanation of the proposal, which no doubt is endorsed by the Hon. Minister concerned. It says :

"The Department of Imports and Exports Control is not adequately equipped to ensure that imports are brought into the country at prices which really represent their value worth"—

The criticism we have levelled more than once and which has now been endorsed by the Hon. Minister is——

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

But you did not take effective steps. These are effective steps.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

Yes, quite right, we are wondering whether they are effective or not. Anyhow, it is a recognition of the fact that these practices exist, which have been denied or at least not been accepted by the present Government.

—"or that the prices recovered for exports are the best prices obtainable in the world markets on the basis of demand and supply for the products exported from the country."

This is a confession of the terrible racketeering that is going on at present, of the practices resorted to by the importers as well as the exporters of this country.

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**
*(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)*
(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

This has been going on for some time.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

I am quite prepared to admit that it has been going on for a long time, not for some time.

As a matter of fact, who are your food importers today ? Fourteen people do the food importing, of whom I think only one is a registered citizen. The rest are all non-citizens. The same thing obtains today.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

It has been so for some time.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

I am not denying it.

Yes, of course, I fought that also. But this is really a confession. This is happening still.

All that I am concerned with is whether the Government is satisfied with the new set-up it proposes to have. What is the new control that the Government is going to adopt ? What is the machinery the Government is going to adopt for the purpose of exercising control over the trade, for the operation of import control, and so on. I am anxious to find out what the set-up is that the Minister proposes to have in order to prevent this abuse. All that has been provided is for some salaries of people. Do you think that is going to solve the problem ? The Hon. Minister is asking that the provision under Sub-head 1—Cadre and Salaries, be increased by Rs. 25,000, other allowances by Rs. 1,000, and Cost of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

living by Rs. 7,000. Does the Hon. Minister think that a total increase of Rs. 33,000 in the provision already made is going to solve the problem ? I do not think so. If you recognize this as your major problem, how are you going to deal with the question of over-invoicing ? Take the kind of racketeering that is going on between Brooke Bonds and their main office abroad. How are you going to prevent that ? We do not know the prices at which they are selling their teas. Nobody knows. Is this the set-up that you are going to have to solve this problem ? There must be a much more realistic approach to this question than this. This is what we have urged more than once : the wholesale trade and all wholesale imports must be taken over by the Government. That is the only basis on which you can control this practice. You can do the retailing through the private trade ; there is no objection to that. There is no other means by which you can control the racketeering that is going on. So far as exports are concerned, I agree you cannot do this immediately. But you have to build up an organization abroad. You are not doing that at the present moment. All that you are doing is appointing some extra officers. This is what you say in the explanation :

"In order to ensure that the maximum benefit accrues to the country from the limited exchange reserves available for imports, and the maximum values obtained for its exports, it has been decided to set up a special organization for price investigation, examination of indents and examination of exports ...."

Do you think these few people can do all this work ? I do not think so. In other words, I think you have to use the existing machinery to some extent. In many of these countries we have got our commercial counsellors, and they must keep us regularly informed. You will have to have a much larger organization than you now have in those countries for the purpose of doing this because our imports amount to about Rs. 2,000 million a year. What is the control you have ? These few officers are not going to maintain all the control that is necessary. I do not think so. Anyhow, it is a matter for gratification that the Government has recognized what we have urged over and over again—that there is a problem to be solved. We have to devise some machinery for the purpose. You are now tinkering with the problem. This kind of machinery is not going to solve this problem. I do not want to stand in the way of your making some effort, but I do not think this is going to solve the problem.

අ. භා. 3.23

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් මේක බරපතළ ප්‍රශ්නයක්. එවැනි බරපතළ ප්‍රශ්නයකට පැලැස්තරයක් දැමීමට ආණ්ඩුව විසින් ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාවට අප විරුද්ධ වෙන්නට යන්නේ නැහැ. මක්නිසාද, ඒ පැලැස්තරයෙනුත් අපට අනාගතයේදී යමක් ඉගෙන ගන්නට අවස්ථාව ලැබෙන නිසයි. නමුත් මෙයින් ප්‍රශ්නය විසඳෙනවාය කියා තමුන්නාන්සේලා සිතනවා නම් වහාම ඒ වැරදි අදහස් ඉවත් කර ගන්න. මෙතැන ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් ආනයන භාණ්ඩ පිළිබඳ ප්‍රශ්නයයි. මේ "loaded invoices" ක්‍රමය උඩ මේ රටේ මුදල් පිටරට යන බව අද කවුරුත් පිළිගෙන තිබෙනවා. මේ රටට ගෙන්වනු ලබන භාණ්ඩවලට නියම මිළට වඩා අධික මිළක් දමා අනියම් ක්‍රමයට මේ රටේ මුදල් පිටරට යවනවා. දැන් මේ ප්‍රශ්නය පිළිබඳව විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන පක්ෂ තුන වෙනුවෙන්ම මට කථා කරන්නට පුළුවන්ය කියා මා කල්පනා කරනවා. අපේ මතයේ හැටියට මේ ප්‍රශ්නය විසඳීමට තිබෙන එකම මාර්ගය ආනයන වෙළඳාම රජය අතට ගැනීමයි. ආනයන වෙළඳාම එනම් පිටරටින් මේ අවශ්‍ය බඩු ගෙන්වීම රජය අතට නොගෙන කරන කොයිම පැලැස්තරයකින්වත් කොයිම ක්‍රමයකින්වත් අයථා අන්දමට පිටරට මුදල් යැවීම නතර කරන්නට බැහැ. මෙරටට අවශ්‍ය භාණ්ඩ ගෙන්වන මේ වෙළඳුන්ගෙන් වැඩි හරියක්ම විදේශිකයන් බව යටියන්තොට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන්නා. ඔවුන් විදේශික වෙළඳුන්වීම නිසා මේ ජාවාරම වඩාත් පහසුවෙන් කරන්නට පුළුවනි. මක් නිසාද ? විදේශික වෙළඳුන්ට මෙරටට බඩු ගෙන්වන විදේශවලත් සම්බන්ධකම් තිබෙන නිසයි. පිටරට වෙළෙන්දා මේ රටේ වෙළෙන්දාගේ තැරැව්කරු නැත්නම් නියෝජිතයා වෙනවා. මේ රටේ ආනයන වෙළෙන්දා එමනිසා වඩාත් පහසුවෙන් පිටරට මුදල් යැවීමේ ජාවාරම කරනවා. මේ අන්දමේ සුළු නිලධාරි පිරිසක් පත් කළාට ඒ ජාවාරම නවත්වන්නේ කොහොමද ? පිටරට නියෝජිතයා කියනවා, ඇත්ත වශයෙන්ම මේ මිළට තමයි අප විකුණුවේ කියා. ලොකු වෙනසක් තිබෙන්නට වුවමනා නැහැ ; රාත්තලකට ශත දෙකක් තුනක් වැඩි වුණත් රාත්තල් ලක්ෂ ගණනක් ගෙන්වන විට විශාල මුදලක් වෙනවා නේද ? එමනිසා මේ ජාවාරම අල්ලා ගැනීම දුෂ්කරයි. පිටරට වෙළෙන්දා ඇත්ත වශයෙන්ම අප විකිණුවෙ මේ මිළට ය කියා කියනවා නම් මේ සුළු නිලධාරි පිරිසට ඒක අල්ලා ගන්නට පුළුවන්ද ? බැහැ. මෙතැනත් එක මිනිහ ; එතැනත් එක මිනිහ. මේ දෙදෙනාම එකතුවී ජාවාරම කරන විට කොහොමද අල්ලන්නෙ ? මේ යෝජනාවට අප විරුද්ධ නැහැ. පැලැස්තරයක් වශයෙන්වත් මෙවැනි නිලධාරි කණ්ඩායමක් පත් කිරීමෙන් අප නොදන්නා යමක් සොයා ගන්නට පුළුවන් වුණොත් ඒකත් අනාගතයේදී ප්‍රයෝජනවත් වෙනවා. නිකම් පැලැස්තර දමන ආණ්ඩුවක් නොවෙයි ආනයන වෙළඳාම සම්පූර්ණයෙන්ම රජය අතට ගැනීමට සූදානම් ආණ්ඩුවක් ඇති වන දවසට ඒ ලබාගත් අත්දැකීම ප්‍රයෝජනවත් වෙන්නට පුළුවනි.

අනිත් ප්‍රශ්නය අපනයන භාණ්ඩ පිළිබඳ ප්‍රශ්නයයි. අපනයන වෙළඳාමත් රජය අතට ගැනීමෙන් පමණක් ඒ ප්‍රශ්නය විසඳන්නට බැහැ. ඒ පිළිබඳව ඊටත් වඩා දුරට පරීක්ෂණ කරන්නට සිද්ධ වෙනවා. ඒ කෙසේ වුවත් අපේ රටේ නිෂ්පාදනය කර පිටරට යවන භාණ්ඩවලට නියම මිළක් ලබා ගැනීමට නම් ගතයුතු ප්‍රාථමික පියවර ඒ වෙළඳාමත් රජය අතට ගැනීමයි. එසේ නොකර කොතරම් ධෛර්‍ය තිබුණත්, කොතරම් ධනය තිබුණත්, අපේ පෞද්ගලික වෙළඳුන්ට ඒ විදේශික රටවල තිබෙන ජාවාරම්කාරයන්ගේ—ඉංග්‍රීසියෙන් කියනව නම්—" රිං " එක කඩා ගන්ට ශක්තියක් නැහැ. ඒ ශක්තිය තිබෙන්නෙ රජයට විතරයි. ඒ නිසා ඒ ප්‍රශ්නය විසඳන්ට නම් මේ රටින් පිටරට යවන අපනයන භාණ්ඩ වෙළඳාමත් රජය අතට ගත යුතුයි. එක වරම ගන්ට යයි මම කියන්නෙ නැහැ. ක්‍රමයෙන් ගන්ට සිද්ධ වෙනව. මෙයින් ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. කෙසේ වෙතත් මෙයින් ලැබෙන අත්දැකීම්වලින් අපට ප්‍රයෝජනවත් කරුණු ටිකක් දැනගන්ට පුළුවන් වෙන්ට ඉඩක් තිබෙන නිසා අපි මේකට විරුද්ධ වෙන්නෙ නැහැ.

අ. භා. 3.29

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Hon. Members may be right in what they say, namely, that to avoid the abuses prevalent in exchange and import control it may be necessary for the State to take over all imports into the Island and also all exports from the Island. The logical conclusion from that should also be that the State should take over the entire production and distribution of commodities in the Island. And also, as the hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake) has stated, we must abolish the parliamentary system and go on to various other concomitants that arise from such a theory.

But we are not debating that political philosophy at this moment. We are considering only the question of spending Rs. 33,000. One fact that hon. Members would acknowledge is that we have realized that there is a problem. It is not that we did not realize it earlier, and it is not that the previous Government did not realize it earlier, but there is a realization that there is a problem where you export goods out of this country but do not get the proper value for those goods. For example, a person can accumulate foreign exchange by selling a pound of goods produced in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Ceylon for Rs. 100, whereas he really gets Rs. 1,000. In the same way, when importing into the Island a machine worth, say, Rs. 100, he says he is paying Rs. 1,000. So, in both ways money is accumulating in foreign countries in the hands of certain individuals. How are we to check it ? The solution propounded by my hon. Friends who spoke may, as I said, be one method. But can we do it through our Government ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
No.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

It is impossible. Firstly, we must have a mandate to do that. Such a mandate asked for by hon. Members opposite was rejected by the people. So, we have to wait for another general election and secure a mandate from the people for a more drastic revision of our economic structure.

As I said before, it may be that what you say is quite correct, but we cannot implement that at present. We are doing what we can possibly do by creating an indent board which will follow up indents, invoices and other documents not only in Ceylon but also in the countries with which we have business, through international organizations, but as far as possible within the framework of the mixed economy we have today—socialist plus capitalist. It is within the framework of that economy that we want to see whether we cannot get proper value for our imports and for our exports.

I am glad that hon. Members—whatever their political philosophy may be—are agreeing with us. For the present this is all we can do. When the indent board begins to



function, if further steps are necessary I am sure the Government will come before this House with supplementary estimates. On that occasion I am sure you will grant the moneys without any debate.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## ආහාර පාලන රෙගුලාසිය

